‘‘ඔසු දිරිය’’ ව්‍යාපෘතිය යටතේ 2025 වර්ෂයේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය පහත දක්වා ඇත.

අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම්	ප්‍රතිපාදන (රු.මී.)	2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මී.)	භෞතික ප්‍රගතිය	%
01.	ඔසු උයන්හි පැල නිෂ්පාදනය වැඩි කිරීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය	2.00	1.982	පින්නදූව ඔසු උයනෙහි ආරක්ෂිත ගෘහ 08 නවීකරණය කර ඇත.	100
02.	වගාවට අවශ්‍ය කෘෂි උපකරණ මිලදී ගැනීම	1.00	0.961	පින්නදූව හා ගිරාදුරුකෝට්ටේ ඔසු උයන් සඳහා අවශ්‍ය කෘෂි උපකරණ මිලදී ගෙන ඇත.	96
03.	ඔසු වගාව හා පසු අස්වනු තාක්ෂණ සම්බන්ධ පුහුණු කිරීම්	1.00	0.982	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සේවය කරන සංවර්ධන නිලධාරීන් හා හඳුනාගත් ගොවීන් හට වගාව සම්බන්ධව පුහුණුව ලබා	98

				දී ඇත.	
04.	ඔසු පැල මිලදී ගැනීම් සහ මෙහෙයුම් කටයුතු	4.50	3.780	- මාතර දිස්ත්‍රික්කය තුළ හීං අරත්ත පැල 25,000ක් නිෂ්පාදනය කර ඇත. - ගිරාදුරුකෝට්ටේ ඔසු උයනෙහි ජල සම්පාදන පද්ධතිය ස්ථාපිත කර ඇත. - පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු ඉල්ලීම් පරිදි වගාව සඳහා ඔසු පැල ලබා දීම සිදු කර ඇත. - ප්‍රජා සත්කාරයක් ලෙස පාසල් කිහිපයකට ඔසු උයන් සඳහා පැල ලබා දීම සිදුකර ඇත.	
	එකතුව	**8.50**	**7.705**		

- **සිදු කරන ලද සෙසු වැඩසටහන්**

  - **බෝ නොවන රෝග පාලනය සහ වැළැක්වීම සඳහා දේශීය වෛද්‍ය මැදිහත්වීම**

    බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය සඳහා දේශීය වෛද්‍ය දැනුම හා එහි ජීවන දර්ශනය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිණිස ජනතාව දැනුවත් කිරීම සහ පෙළඹවීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. 2025 වර්ෂය වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් රු.මි. 4.013ක ප්‍රතිපාදනයක් මේ සඳහා ලබා දී ඇත. එහි මූල්‍යමය ප්‍රගතිය රු.මි.3.99කි.

    ඒ යටතේ පාරම්පරික ආහාර වට්ටෝරු හා ආහාර සංස්කරණ ක්‍රම ජනතාවට හඳුන්වාදීම, මහජන සංකේන්ද්‍රීය දේශීය ආහාර හා පෝෂණය පිළිබඳ දැනුම හා භාවිතයෙන් වැඩිදියුණු කිරීම, මන්දපෝෂණ ගැටළුව මහහරවා ගැනීම සඳහා දේශීය ක්‍රමවල යථාභූත අත්දැකීම් බෙදා ගැනීම සහ යෝග අභ්‍යාස ජනගත කිරීම යන ක්‍රියාකාරකම් සාර්ථකව සිදු කරන ලදී.

    මෙහිදී "ඖෂධ වෙනුවට ආහාර" යන සංකල්පය ජනගත කිරීමට ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ පෝෂණ ගුණයෙන් අනූන දේශීය ආහාර හා ආහාර සංස්කරණ ක්‍රම ප්‍රචලිත කිරීමට විශාල දායකත්වයක් ලබා දී ඇත. එසේම බෝ නොවන රෝග පාලනය සඳහා අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය මඟින් ඒකාබද්ධ වැඩසටහන් ගණනාවක්ද පැවැත්වීමට කටයුතු කර ඇත.

වැඩසටහන	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	ඉලක්කයන්	භෞතික ප්‍රගතිය/ නිමකළ වැඩසටහන්	මූල්‍ය ප්‍රගතිය (%)
පෝෂණ වැඩසටහන්	999,985.00	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 131ක මෙමවැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	131	99
යෝගා වැඩසටහන්	1,000,000.00	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 33ක යෝග වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	33	100
වෙනත්- අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාව මගින් පවත්වන ලද වැඩසටහන්	1,713,500.00	- හෙළ අහරින් සුවය රකිමු- (වැඩසටහන් 40) - බෝ නොවන රෝග පාලනය සඳහා ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන්ගේ පුහුණු කිරීම (වැඩසටහන් 05) -වීදි නාට්‍ය මගින් දැනුවත් කිරීම (වැඩසටහන් 09) - වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන් (වැඩසටහන් 37) - යෝග වැඩසටහන් (59)	40 05 09 37 59	99
එකතුව	**3,713,485.00**			

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ සැපයීම

අනු අංකය	විස්තරය	ලබා දුන් ඖෂධ වටිනාකම (රු.)
01	බස්නාහිර පළාත	49,500,000.00
02	මධ්‍යම පලාත	27,300,000.00
03	දකුණු පළාත	22,400,000.00
04	උතුරු පළාත	25,400,000.00
05	නැගෙනහිර පළාත	10,800,000.00
06	වයඹ පළාත	16,000,000.00
07	උතුරු මැද පළාත	5,400,000.00
08	ඌව පළාත	13,500,000.00
09	සබරගමුව පළාත	21,800,000.00
10	අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාව	7,600,000.00
	එකතුව	**199,800,000.00**

- **ආයුර්වේද දෙපාර්තමේන්තුව**
  - **ආයතනික කාර්යයන්**

අනු අංකය	කාර්යය	සේවක ගණය	සංඛ්‍යාව
01	බඳවාගැනීම්	ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී	303
02	උසස් කිරීම්	ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන 11 ශ්‍රේණිය	19
		ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණිය	15
		එකතුව	**337**

- **සංවර්ධන අංශය**

  - **දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද ව්‍යාපෘතීන්**

අංකය	කාර්යය	මූල්‍ය ප්‍රතිපාදනය (රු.මිලි.)	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය %
			(රු.මිලි)	%	
01	ආයුර්වේද දෙපාර්තමේන්තු කාර්යාලයේ ප්‍රධාන අලුත්වාඩියා	50	20.60	41.20	100
02	ආයුර්වේද රෝහල්වල ප්‍රධාන අලුත්වැඩියා	275	204.03	74.19	92
03	ආයුර්වේද රෝහල්වල නව ඉදිකිරීම්	35.24	13.91	39.36	32
04	ආයුර්වේද ජාතික රෝහලෙහි අටමහල් ගොඩනැගිල්ල 11 අදියර	300	90.96	30.32	70
05	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ සුළු අලුත්වැඩියා	10	5.81	58.14	100
06	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ භූමි සංවර්ධනය	15	14.66	97.74	100
07	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධාන අලුත්වැඩියා	7.50	7.08	94.43	100
08	ඔසු උයන්වල ප්‍රධාන අලුත්වැඩියා	75	74.92	99.89	96
09	ඔසු උයන්වල නව ඉදිකිරීම්	0.22	0.00	-	-
10	ඔසු උයන්වල භූමි සංවර්ධනය	5.28	4.53	85.81	96
	මුළු එකතුව	**773.24**	**436.50**		

- **ශිල්පීය අංශයේ ප්‍රගතිය**

බලපත්‍ර නිකුත් කිරීම

අංකය	නිකුත් කරන ලද බලපත්‍රය	අයදුම්පත් සංඛ්‍යාව	ලැබූ ආදායම (රු.)
01	දේශීය නිෂ්පාදන ප්‍රථමවරට ලියාපදිංචිය	44	646,500.00
02	දේශීය නිෂ්පාදන කාලය දීර්ඝ කිරීමේ ලියාපදිංචිය	26	376,500.00
03	දේශීය නිෂ්පාදන අපනයන ලියාපදිංචිය	08	21,531.59
04	ආනයනික නිෂ්පාදන ප්‍රථම ලියාපදිංචිය	14	USD 7000 (USD 500 X 14)
05	ආනයනික නිෂ්පාදන වාර්ෂික ලියාපදිංචිය	41	USD 6150 (USD 150 X 41)
06	ආයුර්වේද ඔසුසැල් ප්‍රථම ලියාපදිංචිය	100	2,000,000.00
07	ආයුර්වේද ඔසුසැල් වාර්ෂික ලියාපදිංචිය	294	2,940,000.00
08	නිෂ්පාදනාගාර වාර්ෂික ලියාපදිංචිය	115	2,875,000.00
09	නිෂ්පාදනාගාර ප්‍රථම ලියාපදිංචිය	32	1,600,000.00
10	ප්‍රවාහන වාර්ෂික ලියාපදිංචිය	39	390,000.00
11	ප්‍රවාහන ප්‍රථම ලියිපදිංචිය	05	75,000.00
12	ප්‍රතිකාර මධ්‍යස්ථාන ප්‍රථම ලියිපදිංචිය	20	31,200.00
13	ප්‍රතිකාර මධ්‍යස්ථාන වාර්ෂික ලියාපදිංචිය	90	108,000.00
14	හෝටල් තුළ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන ප්‍රථම ලියාපදිංචිය	05	90,000.00
15	හෝටල් තුළ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන වාර්ෂික ලියාපදිංචිය	25	300,000.00
16	ආයුර්වේද රෝහල් වාර්ෂික බලපත්‍ර ලියාපදිංචිය	20	180,000.00
	එකතුව	**878**	

- **විභාග අංශය**

අංකය	ක්‍රියාකාරකම	පැවැත්වූ කාලවකවානුව	සහභාගි වූ සංඛ්‍යාව
01	ලංකා සිද්ධ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ අවසන් වසර සිසුන් සඳහා වන අතිරේක පරීක්ෂණය-2024	2025.01.27 සිට 2025.02.08 දක්වා	17
02	ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය-2025	2025.03.30	13
03	ආයුර්වේද ශාස්ත්‍රී සිසුන් සඳහා අතිරේක පරීක්ෂණ	2025.04.29 සිට 2025.05.04 දක්වා	210
04	ආයුර්වේද ඖෂධ සංයෝජක ත්‍රෛමාසික	2025.05.05 සිට 14	29

	පුහුණු පාඨමාලාවේ අවසාන ඇගයීම් ලිඛිත,වාචික හා ප්‍රායෝගික පරීක්ෂණය-2025	දක්වා සහ 21 දින දක්වා	
05	ආයුර්වේද ශාස්ත්‍රී අතිරේක පරීක්ෂණය 2024(2025) ප්‍රායෝගික පරීක්ෂණය	2025.06.30 සහ 28	56
06	ආයුර්වේද ශාස්ත්‍රී අතිරේක පරීක්ෂණය 2024(2025) වාචික පරීක්ෂණය	2025.08.04 සිට 07 හා 11-15 දක්වා	108
07	MN01හා MT02 කේත අංක යටතේ බඳවාගත් සම්බාහන හා භෙෂජ්ජක තනතුරෙහි 111 වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය-2025	2025.09.27	06
08	ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් 11 ශ්‍රේණිය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය-2025	2025.09.28	22
09	PL01 කේත අංක යටතේ බඳවාගත් කාර්යාල කාර්ය සහායක 1 ශ්‍රේණිය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2025.10.24	03
10	PL02 කේත අංක යටතේ බඳවාගත් 1,11,111 ශ්‍රේණි සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය-2025	2025.10.24 සහ 22	44
	එකතුව		**508**

- **රෝගී ප්‍රතිකාර සේවා**

  - **ශික්ෂණ රෝහල්**

රෝහල	**බොරැල්ල**	**ගම්පහ**	**කයිතඩි**	**ත්‍රිකුණාමලය**
මූලික තොරතුරු				
වාට්ටු සංඛ්‍යාව	12	04	05	02
ඇඳන් සංඛ්‍යාව	239	109	130	12
වෛද්‍යවරු සංඛ්‍යාව	82	62	17	06
හෙද කාර්ය මණ්ඩලය	62	17	04	08
අනෙකුත් කාර්ය මණ්ඩලය	231	76	50	13
රෝගී ප්‍රතිකාර සේවා				
ප්‍රතිකාර කරන ලද බාහිර රෝගීන් සංඛ්‍යාව	208,636	47,191	28,117	17,123
ප්‍රතිකාර කරන ලද නේවාසික රෝගීන්	2,962	1,493	-	267

සංඛ්‍යාව				
සායන මගින් ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් සංඛ්‍යාව	175,815	55,453	1,254	3,407
පංච කර්ම මගින් ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් සංඛ්‍යාව	2,492	6,122	-	50
එකතුව	**389,905**	**110,259**	**29,371**	**20,847**
ශික්ෂණ පහසුකම් ලබා දෙන ලද වෛද්‍ය සිසුන් සංඛ්‍යාව	600	466	682	52-60
පැවැත්වූ ජංගම සායන සංඛ්‍යාව	-	01	-	-

- **ඖෂධ නිෂ්පාදනය**

ඖෂධ වර්ගය	**බොරැල්ල**	**කයිතඩි**	**යක්කල**
බෝතල්			
අරිෂ්ඨ/ආසව	783.75	-	301.00
තෛල	3371.87	2155.6	972.67
ක්වාත	16575	-	480.92
සිරප්	-	135.5	-
කෂාය	13568.64	249	6971.52
අනුපාන/දළු අනුපාන	-	29 60ml	256
පංචවල්කල තැම්බූ වතුර	3782.25	-	-
දියර/පාන/තැම්බුම් වතුර	3193.11	-	1285
නේත්‍ර බිංදු	39.00	-	-
Theeneer	-	253	-
යුනානි ඖෂධ	420.75L	-	-
සිද්ධ ඖෂධ	161	-	-
isoaO TAIO	-	-	-
කිලෝ ග්‍රෑම්			
චූර්ණ	2103.07	-	73.67
පංචවල්කල චූර්ණ	218.00	-	-
ගුලි/පෙති	64.89	87.235	-

පාණ්ඨ	-	-	827.00
ඝන ඖෂධ	-	-	-
ලේප	206.86	155.362	-
යුනානි ඖෂධ	401.09	-	-
සිද්ධ ඖෂධ	65.24	-	-
පත්තු	181.06	9882	443.34
වර්ති	0.11	-	-
ක්ෂාර	1.49	-	-
පාණ්ඨ	116.60	-	-
පොට්ටනි	34.56	-	-
තැවිලි	-	-	477.07
ලේහ	-	38.856	-
වෙනත්	-	-	18.65
රස බෙහෙත්	159.81	5000	-
Senthuram	-	4900	-
Decocation	-	652.009	-
Patpam	-	5.395	-

- **පර්යේෂණ රෝහල්**

පර්යේෂණ රෝහල්	**නාවින්න**	**අම්පාර**	**හම්බන්තොට**	**මැදවච්චිය**	**මන්නාරම්කුඩාව**	**නින්දවූර්**	**මිහින්තලය**
මූලික තොරතුරු							
වාට්ටු සංඛ්‍යාව	04	02	04	02	02	-	-
ඇඳන් සංඛ්‍යාව	68	31	102	28	26	-	12
වෛද්‍යවරු සංඛ්‍යාව	50	11	13	08	06	02	02
හෙද කාර්ය මණ්ඩලය	10	09	17	05	01	-	-

අනෙකුත් කාර්ය මණ්ඩලය	97	42	48	25	30	05	09
ප්‍රාදේශීය ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සංඛ්‍යාව	70	-	-	-	-	-	-
රෝගී ප්‍රතිකාර සේවා							
සාමාන්‍ය ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව	44,779	37,511	25,726	8,507	18,578	-	13,803
සායනික ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව	34,491	6,726	-	-	-	-	-
නේවාසික රෝගීන් සංඛ්‍යාව	762	-	728	5,478	171	-	-
එකතුව	**80,331**	**44,332**	**26,638**	**14,053**	**18,814**	**07**	**13,826**

- **ඖෂධ නිෂ්පාදනය**

ඖෂධ වර්ගය	**නාවිත්න**	**අම්පාර**	**හම්බන්තොට**	**මැදවච්චිය**	**මන්නාරම**
බෝතල්					
ආසව	1169	-	-	-	1379.75
තෛල	607.5	168	42L 750ml	110.20	-
ක්වාථ	4590	-	225L 750ml	-	-
කෂාය	5216.56	127L	589L	1560	-

		268ml	240ml		
අනුපාන/අළු අනුපාන	494	660L 162ml	10L 750ml	417	-
වෙනත් තැම්බූ වතුර	-	-	-	-	-
පාන (ස්වරස)	-	-	-	12	-
වෙනත්(මහ දළු අනුපානය)	109.5	-	-	51	-
වෙනත් (ද්‍රව)	5751.5	-	-	429	-
නේත්‍රා බිංදු	32.5	-	-	-	
කිලෝ ග්‍රෑම්					
චූර්ණ	-	57kg 600g	-	38.100	169.165
කල්ක	-	-	-	3.200	-
ලේප	-	-	-	8.500	119.5
පාණ්ඨ	-	-	-	2.570	-
පත්තු	-	175kg 635g	2200g	61.750	895
තැවිලි	-	149kg	550g	119.930	909
ලේහ	-	-	-	1.320	-
මැල්ලුම්	-	-	-	39.220	-

- **පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන්**

  - **ඔසු පැල අලෙවි කාර්යයන්**

ඔසු උයන	නිෂ්පාදනය කළ පැල ප්‍රමාණය	පැල අලෙවිය	
		පැල ප්‍රමාණය	වටිනාකම (රු.)
පල්ලෙකැලේ	6,607	7,043	298,540.00
ගිරාඳුරුකෝට්ටේ	43,945	8,167	378,310.00
නාවින්න	20,920	9,889	433,710.00

පින්නදූව	7,350	2,817	122,980.00
හල්දුම්මුල්ල	34,664	9,937	492,400.00
එකතුව	**113,486**	**37,853**	**1,725,940.00**

- **ඔසු උයන් අතර පැල හුවමාරු කිරීම්/නොමිලේ පැල නිකුත් කිරීම්**

ඔසු උයන	ප්‍රමාණය	වටිනාකම (රු.)
පට්ටිපොළ	36	1,480.00
පල්ලෙකැලේ	243	9,800.00
ගිරාඳුරුකෝට්ටේ	1,275	54,240.00
නාවින්න	555	19,600.00
පින්නදූව	988	44,180.00
හල්දුම්මුල්ල	645	25,800.00
එකතුව	**3,742**	**155,100.00**

- **බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය**

- **පර්යේෂණ හා සංවර්ධන අංශය**

ක්‍රියාකාරකම්		**අංශය**	**ප්‍රමාණය**
උපායමාර්ගික ඉලක්ක 01:පර්යේෂණ හා සංවර්ධන පුළුල් කිරීම			
01.	ඖෂධීය ශාකවල / නිමි ඖෂධවල රසායනික හා ඖෂධීය ක්‍රියාකාරකම් හඳුනාගැනීම සඳහා සහයෝගීතා පර්යේෂණ	ප්‍රමිතිකරණ අංශය	20
02.	පර්යේෂණ කාර්යයන් විද්‍යාත්මක ප්‍රකාශනවල එළිදැක්වීම	ප්‍රමිතිකරණ අංශය ඖෂධීය ශාක අංශය	07 11
03.	දේශීයව වගා නොකරන ආර්ථිකව වැදගත්වන ඖෂධ ශාක ප්‍රරෝහණ ක්‍රම හා වගා පර්යේෂණ සහ පටක රෝපණය	ඖෂධීය ශාක අංශය	03
04.	සායනික පර්යේෂණ	සායනික පර්යේෂණ අංශය	05 (ආරම්භ කර ඇත)
05.	විද්‍යාත්මක ග්‍රන්ථ ප්‍රකාශන එළි දැක්වීම	ඖෂධීය ශාක	02

	ක්‍රියාකාරකම්	**අංශය**	**ප්‍රමාණය**
		අංශය	
උපායමාර්ගික ඉලක්ක 02: රෝගී සත්කාරක සේවා පුළුල් කිරීම			
01.	දේශීය වෛද්‍ය විද්‍යානුකූලව නේවාසික හා බාහිරාංශ රෝගී සත්කාර සේවා සැපයීම	නේවාසික අංශය බාහිරාංශය	BOR 58% ALOS-19 දෛනික සාමාන්‍ය 262
උපායමාර්ගික ඉලක්ක 03: ප්‍රමිතිකරණය හා සුරක්ෂිතතාව තහවුරු කිරීම			
01.	දේශීය නිමි ඖෂධ සඳහා ප්‍රමිති පිරිවිතර සකස් කිරීම	ප්‍රමිතිකරණ අංශය	05 50%ක වැඩ අවසන්
02.	අමු ද්‍රව්‍ය සඳහා ප්‍රමිති පිරිවිතර සකස් කිරීම	ප්‍රමිතිකරණ අංශය	03 60%ක වැඩ අවසන්
03.	අමුද්‍රව්‍ය/නිමි ඖෂධ වල ගබඩාකරණ තත්ත්ව මත ඒවායේ තත්ත්වය/ප්‍රමිතිය වෙනස්වීම් අධ්‍යයනය කිරීම	ප්‍රමිතිකරණ අංශය	02
04.	ප්‍රමිතිකරණ සේවා - දේශීය ඖෂධ අමුද්‍රව්‍ය,නිමි ඖෂධවල ප්‍රමිතිය පරීක්ෂා කොට තත්ත්ව සහතික නිකුත් කිරීම	ප්‍රමිතිකරණ අංශය	සාම්පල 81
05.	දේශීය ඖෂධ සඳහා ප්‍රමිති පිරිවිතර සකස් කිරීම	ඖෂධීය ශාක අංශය	05
06.	දේශීය ඖෂධීය අමු ද්‍රව්‍ය (ශාක) සඳහා උද්භිද හා රසායන ප්‍රමිති සකස් කර ප්‍රසිද්ධ කිරීම	ඖෂධීය ශාක අංශය	07
07.	මතභේදාත්මක ඖෂධීය ශාක හා එහි ප්‍රති නිධි හඳුනා ගැනීම පිළිබඳ සහයෝගීතා පර්යේෂණ	ඖෂධීය ශාක අංශය	03
උපාමාර්ගික ඉලක්ක 04: නවෝත්පාදන පර්යේෂණ හා සංවර්ධනය			
01.	අගය එකතුකළ පරිශීලක මිත්‍ර (user friendly) නිෂ්පාදන එළි දැක්වීම	ප්‍රමිතිකරණ අංශය	08
02.	ඖෂධීය ශාක නිවැරදිව හඳුනාගැනීම සඳහා පර්යේෂණ සිදු කිරීම තුළින් ඖෂධීය නිෂ්පාදනයන් සිදු කිරීම	ඖෂධීය ශාක අංශය	01

ක්‍රියාකාරකම්		**අංශය**	**ප්‍රමාණය**
උපාමාර්ගික ඉලක්ක 05: දේශීය වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීම			
01.	පුස්කොළ පොත් අනු ලේඛනය කර මුද්‍රණය කිරීම	සාහිත්‍ය හා ව්‍යාපෘති අංශය	පිටපත් 800 (පොත් 08)
02.	පුස්කොළ පොත් අනුලේඛනය	සාහිත්‍ය හා ව්‍යාපෘති අංශය	05
03.	පුස්කොළ පොත් භෞතික සංරක්ෂණය	සාහිත්‍ය හා ව්‍යාපෘති අංශය	139
04.	පුස්කොළ පොත් ඩිජිටල් සංරක්ෂණය	සාහිත්‍ය හා ව්‍යාපෘති අංශය	816
05.	පුස්කොළ පොත් විධිමත්ව අංකනය කර ලේඛනගත කිරීම හා සංරක්ෂණය කිරීම	සාහිත්‍ය හා ව්‍යාපෘති අංශය	1,661
06.	පාරම්පරික වෛද්‍යවරුන්ගේ ජාතික ලේඛනයක් ස්ථාපිත කිරීම	සාහිත්‍ය හා ව්‍යාපෘති අංශය	1,220
උපාමාර්ගික ඉලක්ක 06: ව්‍යාප්ති සේවා වැඩිදියුණු කිරීම			
01.	ඖෂධීය අමු ද්‍රව්‍ය සඳහා ප්‍රමිති පරාමිති එළි දැක්වීම • තෝරාගත් ඖෂධීය අමු ද්‍රව්‍ය සඳහා අදාළ ප්‍රමිති පරාමිති ඇතුළත් monographs සකස් කිරීම • ඖෂධීය අමු ද්‍රව්‍ය සඳහා උද්භිද හා රසායනික ප්‍රමිති හඳුන්වාදීම සඳහා දත්ත සංචිතයක් (Data base) සංවර්ධනය කිරීම	ඖෂධීය ශාක අංශය	06 01
02.	ඖෂධීය ශාක හා අමුද්‍රව්‍ය නිවැරදිව හඳුනාගැනීම • “A check list of Medicinal Plants Sri lanka” ග්‍රන්ථය යාවත්කාලීන කිරීම වියළි ශාකාගාරය හා අමු ද්‍රව්‍ය කෞතුකාගාරය යාවත්කාලීන කිරීම	ඖෂධීය ශාක අංශය	01 නිදර්ශක 200
උපාමාර්ගික ඉලක්ක 07: ශික්ෂණය සහ ධාරිතා සංවර්ධනය			
01.	ආයුර්වේද ඖෂධ ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු හා වැඩමුළු	ප්‍රමිතිකරණ අංශය	ප්‍රතිලාභීන් 131
02.	දැනුවත් කිරීම් හා පුහුණු සේවාවන්	ඖෂධීය ශාක අංශය	ප්‍රතිලාභීන් 50
03.	ප්‍රදර්ශන හා වැඩමුළු සඳහා සේවාවන් සැපයීම	ඖෂධීය ශාක අංශය	02
04.	බාහිර පාර්ශවයන්ට සේවා සැපයීම - සත්‍යාපනය කරන ලද වියළි නිදර්ශන	ඖෂධීය ශාක අංශය	වියළි ශාක නිදර්ශක 279

	ක්‍රියාකාරකම්	අංශය	ප්‍රමාණය
			අමුද්‍රව්‍ය 69
05.	සාහිත්‍ය පර්යේෂණ හා ඊට අදාල තාක්ෂණික ඥානය පිළිබඳ ධාරිතා සංවර්ධනය	සාහිත්‍ය හා ව්‍යාපෘති අංශය	වැඩසටහන් 09
උපාමාර්ගික ඉලක්ක 08: මානව හා භෞතික සම්පත් සංවර්ධනය			
01.	විෂයානුබද්ධ දේශීය පුහුණුවීම්	ඖෂධීය ශාක අංශය සාහිත්‍ය හා ව්‍යාපෘති අංශය	04 02
02.	බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතන ඖෂධ උද්‍යානයේ ඖෂධීය ශාක හා ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ඖෂධ උද්‍යාන සංවර්ධනය	ඖෂධීය ශාක අංශය	1 හා 2 අදියර වැඩ අවසන්

- **දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය**

2025 වර්ෂයට අදාළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	ප්‍රධාන වැඩසටහන/ව්‍යාපෘතිය	භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය (රු.)
		වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව/ මොඩියුල සංඛ්‍යාව	
01	පුහුණු මොඩියුල සකස් කිරීම		මොඩියුල 11	275,285.00
02	ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්	11 (අදියර වශයෙන් වැඩසටහන් 19 ක්)	355	2,480,794.05
03	ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	06 (අදියර වශයෙන් වැඩසටහන් 15 ක්)	214	2,046,215.49
04	වෛද්‍ය සහායක කාර්ය මණ්ඩලය සඳහා වන පුහුණු වැඩසටහන්	11	398	3,030,141.50
05	අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වන පුහුණු වැඩසටහන්	04	98	246,035.00
06	අනෙකුත් රාජ්‍ය සේවකයන්	01	20	නොමිලේ

	සඳහා වන පුහුණු වැඩසටහන්			පවත්වන ලදී.
07	සීමාවාසික වෛද්‍ය පුහුණුලාභීන් සඳහා	05	733	901,554.00
08	පාරම්පරික වෛද්‍යවරුන් සඳහා	11	351	2,218,843.84
09	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන්	09	16	459,500.00
10	පෞද්ගලික පුහුණු පාඨමාලා - ආයුර්වේද සම්බාහන ශිල්පී (NVQ 4)	01	20	331,896.68
11	සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්	05	534	361,510.00
12	වැඩිහිටි සත්කාර සේවයට අදාළ පොත් මුද්‍රණය	පොත් 14,000		566,577.00
එකතුව				**12,918,352.56**

- **අනෙකුත් පුහුණු වැඩසටහන්**

අනු අංකය	**වැඩසටහන/විස්තරය**	**වැඩසටහන් සංඛ්‍යාව**	**සහභාගී වූ සංඛ්‍යාව**
01	රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා	50	1,085
02	සීමාවාසික වෛද්‍ය පුහුණුව	05	733
03	පාරම්පරික වෛද්‍ය පුහුණුව	11	351
04	පෞද්ගලික පුහුණු පාඨමාලා	01	20
05	සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්	05	534
	එකතුව	**72**	**2,723**

- **ප්‍රජා සෞඛ්‍ය පුවර්ධන සේවය - අනුරාධපුරය**

අනු අංකය	**වැඩසටහන් විස්තරය**	**වැඩසටහන් ගණන**	**ප්‍රතිලාභීන්**
01	වැඩිහිටි සත්කාරක වැඩසටහන්	1,838	31.404
02	හෙළවිරු සුවධරණී සුව සේවා වැඩසටහන්	206	5,242
03	ළමා සෞඛ්‍ය සංරක්ෂණය	1,352	19,804

04	ළමා සෞඛ්‍ය සංරක්ෂණය - ප්‍රාථමික පාසල්	31	1,605
05	බෝ නොවන රෝග පාලනය	3,237	46,085
06	බෝ නොවන රෝග පාලන වැඩසටහන්	3,609	43,471
07	පාසල් වැඩසටහන්	52	2,705
08	සරල අත් බෙහෙත් හඳුන්වාදීම	38	415
09	මාතෘ වැඩසටහන්	02	06
10	ප්‍රජා සත්කාරක වැඩසටහන්	109	5,299
එකතුව		**10,474**	**156,036**

බෝ වන හා බෝ නොවන රෝග පාලනය හා ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය සඳහා, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ආයුර්වේද සංකල්පය අනුව, විවිධ වැඩසටහන් හා දැනුවත් කිරීම් සිදු කරමින් පවතී. ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව වෙනුවෙන් පෙර පාසල්, පාසල් ඉලක්ක කරගත් පෝෂණ වැඩසටහන් හා ළමා සෞඛ්‍ය සංරක්ෂණය, ප්‍රජා මූලික වැඩිහිටි සෞඛ්‍ය සේවාවන් සැපයීම, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය, මාතෘ සංරක්ෂණය, ඖෂධ පැලෑටි සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ වැඩසටහන්, පර්යේෂණික වැඩසටහන්, යෝග පුහුණු වැඩසටහන් ඒ යටතේ විශේෂ වේ.

දේශීය වෛද්‍ය අංශයේ මැදිහත්වීම තුළින් බෝ නොවන රෝග පාලනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන වලින් කොටසක් මෙම ඒකකය වෙත ලබාදීම තුළින් ඉහත වැඩසටහන් බොහොමයක් සිදු කිරීමට හැකියාව ලැබී ඇත. මීට අමතරව දේශීය වෛද්‍ය අංශය, ආයර්වේද දෙපාර්තමේන්තුව, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය හරහා වැඩිහිටි සත්කාර වැඩසටහන් සඳහා අවශ්‍ය මූලික පහසුකම් මෙන්ම රණවිරු සායන හා අනෙකුත් සායන සිදු කිරීමට අවශ්‍ය නිමි ඖෂධ නිෂ්පාදනය, සිදු කර ගැනීම තුළින් වඩා ප්‍රශස්ථ සේවාවක් සැපයීමට මෙම ඒකකයට හැකියාව ලැබී ඇත.

- **ආයර්වේද වෛද්‍ය සභාව**

1. වර්ෂය තුළ සාමාන්‍ය සර්වාංග උපාධිධාරීන් 332ක්, සාමාන්‍ය සර්වාංග ඩිප්ලෝමාධාරීන් 39 ඇතුළත් වෛද්‍යවරුන් 371 දෙනෙකු සඳහා ලියාපදිංචිය ලබා දී ඇත.
2. වර්ෂය අවසාන වන විට උපාධිධාරී වෛද්‍යවරුන් 4,614ක්, ඩිප්ලෝමාධාරීන් 5,867ක්, පාරම්පරික සර්වාංග 7,016ක් හා පාරම්පරික විශේෂ 10,518ක් ලෙස වෛද්‍ය සභාවේ ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව 28,015ක් විය.

3. මෙම වර්ෂයේ ලියාපදිංචිය අලුත් කර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව සර්වාංග 1,241ක් හා විශේෂ 469ක් ලෙස මුළු ගණන 1,710ක් වේ.

4. ආයුර්වේද සාත්තු සේවකයින්, හෙද නිලධාරීන් 30ක් හා භෙෂජ්‍යාකවරුන් 216ක් ද මෙම වර්ෂයේ ලියාපදිංචිය ලබා ඇත.

5. 2025 වර්ෂයේ වෛද්‍ය සභාව වෙත ලැබුණු පැමිණිලි 27න්, 18ක විමර්ශන කටයුතු අවසන් කර ඇත.

ආයුර්වේද වෛද්‍ය සභාව විසින් සිදු කරන ලද වෙනත් කටයුතු

විස්තරය	සංඛ්‍යාව
වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කිරීම	235
ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම	2,150
ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන නිල ලාංඡන නිකුත් කිරීම	125
ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම	1,564

- **හෝමියෝපති රෝහල, වැලිසර**

  - දෛනිකව රෝගීන් 100-150ක පමණ සංඛ්‍යාවකට ප්‍රතිකාර සපයන බාහිර රෝගී අංශයකින් හා නේවාසික රෝගීන් 20 දෙනෙකුට ප්‍රතිකාර ලබා ගත හැකි නේවාසික රෝගී අංශයකින් රෝහල සමන්විත වේ.

  - රෝහල සඳහා අවශ්‍ය රසායනාගාර පරීක්ෂණ සිදු කිරීම සඳහා රසායනාගාරයක් ස්ථාපිත කර ඇති අතර මෙම වසරේදී රෝගීන් 1,311ක් සඳහා රසායනාගාර පහසුකම් ලබා දී ඇත.

  - මෙම වසරේදී හෝමියෝපති වෛද්‍ය උපාධිය හැදෑරීම සඳහා ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය මගින් වාර්ෂිකව ලබා දෙන ශිෂ්‍යත්ව යටතේ 2025 වසරට ලාංකික සිසුන් 10 දෙනෙකු කල්කටාවේ ජාතික හෝමියෝපති ආයතනයට යොමු කරන ලදී.

  - 2025 වසර සඳහා මිලියන 5.3ක වටිනාකමකින් යුතු ඖෂධ තොග සඳහා ඇණවුම් භාර දී ඇත.

2025 වර්ෂය තුළ ප්‍රතිකාර කළ රෝගීන්

මාසය	බාහිර රෝගීන් සංඛ්‍යාව	නේවාසික රෝගීන් සංඛ්‍යාව
ජනවාරි	2,353	23
පෙබරවාරි	2,139	17
මාර්තු	2,176	21
අප්‍රේල්	2,143	18
මැයි	2,062	15
ජූනි	2,311	7

ජූලි	2,383	9
අගෝස්තු	2,386	18
සැප්තැම්බර්	2,363	23
ඔක්තෝම්බර්	2,345	16
නොවැම්බර්	2,009	18
දෙසැම්බර්	2,224	15
එකතුව	**26,894**	**200**

- **පවත්වන ලද ජංගම සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්**

දිනය	**ස්ථානය**	**ප්‍රතිකාර කළ රෝගීන් සංඛ්‍යාව**
2025.03.24	කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	150
2025.05.15	විද්‍යාදීප මහා විද්‍යාලය, වැබඩ	120
2025.05.23	අත්තනගල්ල රජමහා විහාරය	53
2025.06.05	වනවාසල පුරාණ විහාරය	60
2025.06.26	වැඩිහිටි ප්‍රජා ශාලාව, ගෝනවල, බියගම	60
2025.07.03	දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	84
2025.08.07	කදිරාන දෙමංහන්දිය, කටාව	74
2025.08.27	ආනන්දාරාම විහාරය, කටාන	81
2025.09.19	199 රද්දොළුව වසම	50
2025.11.18	අම්බලමුල්ල	51
2025.11.27	බෝධිරාජ විද්‍යාලය, සූගොඩ	36
එකතුව		**819**

- **හෝමියෝපති වෛද්‍ය සභාව**

හෝමියෝපති වෛද්‍ය සභාව මගින් 2025 වර්ෂය තුළ මෙහෙයවනු ලබන සායනවල කාර්ය සාධනය

අනු අංකය	**සායනය**	**ප්‍රතිකාර කළ රෝගීන් සංඛ්‍යාව**
01	දෙහිවල	5,630
02	තෝලංගමුව	9,857
03	පරකඩුව	4,583

04	කුරුණෑගල	15,166
05	කොත්මලේ	7,656
06	මොණරාගල	9,448
07	පාලමුණෛ	5,959
08	පුත්තලම	7,180
09	අම්බලන්තොට	6,103
10	මඩකලපුව	5,963
11	ඉංගිරිය	1,381
12	රත්ගම	4,222
13	පොළොන්නරුව	10,407
14	අකුරණ	5,886
එකතුව		**99,441**

- මෙම වර්ෂයේ හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස වෛද්‍ය සභාවේ ලියාපදිංචි කරන ලද වෛද්‍යවරුන් සංඛ්‍යාව 03කි.

- හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා සෑම වර්ෂයකම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දිවයිනේ විවිධ ප්‍රදේශවල ජංගම සායන පවත්වනු ලබයි. මෙහිදී ඒ සඳහා සහභාගීවන සියළුම ජනතාව වෙත නොමිලේ ප්‍රතිකාර කරනු ලබන අතර 2025 වර්ෂයේ පැවැත් වූ එවැනි ජංගම සායන 28ක් සඳහා සහභාගී වූ සංඛ්‍යාව 1,635 කි.

- 2025 වර්ෂයේ හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා වෛද්‍යවරුන් සහ ආයතන වෙත ඇමෙරිකානු ඩොලර් 99,548.87ක් වටිනා ආනයන බලපත්‍ර 07ක් සඳහා තාක්ෂණික කමිටුවේ නිර්දේශ ලබා දී ඇත.

➢ **ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**

(i) **නිෂ්පාදනය**

ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් 2025 වර්ෂය තුළ රු.මි. 735ක වාර්ෂික නිෂ්පාදනයක් වාර්තා කර ඇත.

(ii) **අලෙවිය**

නිෂ්පාදන අලෙවියේදී රාජ්‍ය අංශය වෙත (ආයුර්වේද රෝහල්, පළාත් හා ප්‍රාදේශීය නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා) අලෙවිය වැඩි ප්‍රතිශතයක් ගනී. ආයුර්වේද ඖෂධ සඳහා පවතින දේශීය හා විදේශීය වෙළඳපල අවස්ථා හඳුනාගනිමින් අලෙවි විවිධාංගීකරණය කිරීමට පියවර රාශියක් ගෙන ඇත. සංස්ථාවට අයත් අලෙවි මධ්‍යස්ථාන 15ක් සහ නියෝජිතයින් මගින්ද අලෙවි කටයුතු සිදු කරනු ලැබේ.

2025 වසරේදී රුපියල් මිලියන 1688ක අලෙවියක් වාර්තා කිරීමට සංස්ථාවට හැකිවී ඇත.

<u>2025 වර්ෂයේ ළඟා කර ගැනීම්:</u>

දිවයින පුරා ක්‍රියාත්මක වන දිස්ත්‍රික් අලෙවි මධ්‍යස්ථාන 15ක අලෙවි කටයුතු දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 12 දෙනෙකු මඟින් සිදු කරනු ලැබේ. මෙම අලෙවි ජාලය තවදුරටත් පුළුල් කරමින් ස්ථානීය අලෙවි නියෝජිතයින් හා මාර්ගගත අලෙවි නියෝජිතයින් පත් කිරීම පුළුල් කිරීමට කටයුතු කරන ලදී.

- **ප්‍රවර්ධන හා ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීම**
  ප්‍රචාරක හා ප්‍රවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය භාවිතයෙන් කටයුතු කරන ලද අතර සංස්ථාවේ නිළ Facebook පිටුවේ පරිශීලකයින් ගණන 12,000 දක්වා වර්ධනය කරගෙන ඇත. විවිධ ප්‍රචාරක හා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීම මගින් වර්ෂය තුළ සැළකිය යුතු ප්‍රචාරයක් හා ස්ථානීය අලෙවිය වර්ධනය කර ගැනීමකට අවස්ථාව සලසාගෙන ඇත.

- **ඔසු බෝග වගා කටයුතු**
  සංස්ථාව මගින් පවත්වාගෙන යනු ලබන නිකවැරටිය, මැදවච්චිය-දංගොල්ල යන ඔසු උයන් වල කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන නව ඔසු බෝග වගා කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලදී. එසේම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය හා ඒකාබද්ධව ‘‘ඔස් දිරිය’’ වගා වැඩසටහන යටතේ අනුරාධපුර බන්ධනාගාරයේ එළිමහන් කඳවුර, පදවිය සිවිල් ආරක්ෂක බළකා කඳවුර, රඹෑව සිවිල් ආරක්ෂක බළකා කදවුර යන ස්ථාන වල වගා ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. තවද රුහුණු විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨය සහ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒකාබද්ධව හීන් අරත්ත පැළ වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

- **ERP පරිගණක මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම**
  සංස්ථාව තුළ පරිගණක මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක වුවද සෑම අංශයක්ම ආවරණය වන පරිදි ERP මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක නොවීම නිසා ගැටලු සහගත තත්ත්වයක් පැවතිණි. විශේෂයෙන්ම අලෙවි මධ්‍යස්ථාන කටයුතු අත්හුරු ක්‍රමයට (manual) ක්‍රියාත්මක වීම නිසා යාවත්කාලීන කිරීම් ප්‍රමාද වන අතර වැරදි හා වංචාවන් සිදුවීමට ද අවස්ථාවන් පවතී. මේ පිළිබඳව අවධානය යොමු කර ERP මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කළ අතර, එහි මූලික කටයුතු මේ වන විට අවසන් කර මොඩියුල කිහිපයක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

- **නිෂ්පාදන පිරිවැය අවම කිරීම**
  නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය ඖෂධ අමුද්‍රව්‍ය මිළදී ගැනීමේදී ප්‍රාදේශීයව සෘජු මිළදීගැනීම් සිදු කිරීම, සංස්ථාවේ අනුරාධපුර මිලදී ගැනීම් මධ්‍යස්ථානයේ ඖෂධ රැස් කිරීම් සිදු කිරීම, සංස්ථා ඔසු උයන් ආශ්‍රිත ප්‍රදේශ වල ඖෂධ අමුද්‍රව්‍ය රැස් කිරීම තුළින් පිරිවැය අවම කිරීමට හැකියාව ලැබී ඇත.

- **නව නිෂ්පාදන එළිදැක්වීම**
  2025 වර්ෂය තුළදී හඳුනාගත් නව නිෂ්පාදන 07 ක් එළි දැක්වීම ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2025.12.30 දින ආයුර්වේද ඖෂධ සංස්ථා ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදී. ඒ අනුව, වර්තමානය වන

විට නිෂ්පාදන 194 ක් සහ නිෂ්පාදන ඒකක 450 ක් පමණ සිදුකරමින් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයේ පුරෝගාමියා ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සිය කාර්භාරය තවදුරටත් පුළුල් කරමින් කුඹිජ ප්‍රසාරණී තෙලය, බලා කෝරණ්ඩ තෙලය, පංචවල්කල චූර්ණය, සංස්ථා බෝන් මැරෝ පත්තුව යන ඖෂධීය නිෂ්පාදනයන් හා පිණ්ඩ බාම්, රත් හඳුන් බොඩි වොෂ්, පංචවල්කල ෂැම්පූ යන ශාකසාර නිෂ්පාදන එළිදැක්වීමට කටයුතු කරන ලදී.

අභියෝග:

ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට සහ ඔවුන්ට ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් සැපයීමට රටකට ඇති හැකියාවට බලපාන විවිධ සාධක පවතී. රටක සමස්ත සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට දායක වන එම සාධක, පවතින සෞඛ්‍ය පද්ධති මගින් කෙතරම් දුරට සාක්ෂාත් කරගනු ලබන්නේද යන්න 'සෞඛ්‍ය පද්ධතියක කාර්යසාධනය' (health system performance) ලෙස හැඳින්වේ. ජනතාවට උසස් තත්ත්වයේ සෞඛ්‍ය සේවාවන් සාධාරණ ලෙස ලබා දීමේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වේ.

බෝ නොවන රෝගවල (NCDs) ශීඝ්‍ර වර්ධනය, ජනගහනය වයස්ගත වීමේ වේගවත් බව සහ රෝග රටාවන්හි සිදුවන වෙනස්කම් සමඟ සම්බන්ධ නව සෞඛ්‍ය ගැටලු, රටේ සෞඛ්‍ය සේවා අවශ්‍යතා පරිවර්තනය කිරීමට දායක වී ඇත.

අනාගත අරමුණු / ඉලක්ක:

සෞඛ්‍ය අංශය

අ. 'දිට්වා' (Ditwah) සුළි කුණාටුවෙන් හානියට හෝ විනාශයට පත් වූ සෞඛ්‍ය ආයතන ප්‍රතිසංස්කරණය කිරීම.

ආ. දැනටමත් ආරම්භ කර ඇති සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණ කිරීම.

ඇ. නිපුණතා සහිත සෞඛ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම් වැඩි කිරීම.

ඈ. 'ආරෝග්‍ය' (Arogya) සෞඛ්‍ය හා සුවතා මධ්‍යස්ථාන 1,000ක් ස්ථාපිත කිරීම මගින් ප්‍රජාවට සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශ වීමේ අවස්ථා තවදුරටත් පුළුල් කිරීම.

ඉ. නිපුණතා සහිත සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම.

දේශීය වෛද්‍ය අංශය

අ. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ නීතිමය රාමුව සම්බන්ධයෙන් නියාමන කටයුතු ශක්තිමත් කිරීම.

ආ. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ වැඩි දායකත්වයක් ලබාදීම සඳහා රෝහල් පද්ධතිය වැඩි දියුණු කිරීම සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

ඇ. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ පවතින විභවතා තුළින් රටේ විදේශ විනිමය උත්පාදනය කිරීමට කටයුතු කිරීම.

ඈ. විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන ඖෂධ අධෛර්යමත් කර ඔසු වගාව ප්‍රවර්ධනය තුළින් විදේශයන්ට ඇදී යන විනිමය ඉතිරි කිරීම.

ඉ. පාරම්පරික වෛද්‍ය කර්මය ප්‍රවර්ධනය සහ සංරක්ෂණය.

ඊ. වස විසෙන් තොර පෝෂ්‍යදායී දේශීය ආහාර පාන හා ආහාර සංරක්ෂණ ක්‍රම ප්‍රවර්ධනය.

උ. දේශීය වෛද්‍ය කර්මය තුළින් විදේශ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට කටයුතු කිරීම.

ඌ. ප්‍රධාන සංචාරක කලාප තුළ සුව සත්කාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.

එ. පවතින ඔසු උයන් උපරිම ධාරිතාවයකින් ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් රෝහල් වලට අත්‍යවශ්‍ය ඖෂධ අමු ද්‍රව්‍ය ලබා ගැනීමට කටයුතු කිරීම.

ඒ. රෝග නිවාරණ කටයුතු සඳහා බටහිර වෛද්‍ය සේවාවන් සමග සහයෝගීව ආයුර්වේද සත්කාර සේවාවන් පවත්වාගෙන යාම.

ඔ. බෝ නොවන රෝග පාලනය සහ වළක්වා ගැනීම සඳහා බහුවිධ උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීම.

ඕ. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළව කාලීන හා ප්‍රායෝගික පාඨමාලා හදුන්වාදීම හා ශික්ෂණ පද්ධතිය සවිබල ගැන්වීම.

ක. පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ඛ. විකල්ප වෛද්‍ය ක්‍රමයක් වශයෙන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජනතාවට වඩා සමීප කරලීමට කටයුතු කිරීම.

ග. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය පුළුල් කිරීම හා විවිධාංගීකරණය.

ඝ. දේශීය වෛද්‍ය පර්යේෂණ දිරිමත් කිරීම.

ච. ආයුර්වේද රෝහල් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.


විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

දිනය: 2026/08/

3 පරිච්ඡේදය

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය



ඒසිජ්-එස්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	තක්ක 2025	2,024	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිජ්-I
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	98,719,800	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		98,719,800	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		364,505,010,768	321,123,886,118	ඒසිජ්-3
-	කැන්පතු		2,006,723,376	1,344,641,025	ඒසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		1,476,648,175	1,290,793,426	ඒසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		175,118,658	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**368,163,500,976**	**323,759,320,568**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**368,262,220,776**	**323,759,320,568**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,168,975,557	222,158,301	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**367,093,245,219**	**323,537,162,267**	
	අඩු කළා : වියදම්				
	ස්ථානාවර්තන වියදම්		-	-	
159,366,752,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	158,475,058,438	135,517,216,606	
222,736,111,963	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	180,988,735,939	186,169,296,137	ඒසිජ්-2(ii)
14,923,100,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	10,018,896,814	8,858,166,665	
-	පොළී ගෙවීම්	8	-	-	
2,288,037	වෙනත් ස්ථානාවර්තන වියදම්	9	2,288,037	-	
397,028,252,000	මුළු ස්ථානාවර්තන වියදම් (ඊ)		**349,484,979,228**	**330,544,679,409**	
	මූලධන වියදම්				
30,334,552,417	මූලධන වත්කම් ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	18,211,780,237	14,282,591,171	
47,743,456,354	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	26,817,155,198	15,723,339,759	
1,060,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	624,275,988	190,248,271	ඒසිජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
2,205,349,896	හැකියා වර්ධනය	14	1,704,872,075	1,462,984,801	
6,568,641,333	වෙනත් මූලධන වියදම්	15	2,395,190,619	2,320,008,718	
87,912,000,000	මුළු මූලධන වියදම් (උ)		**49,753,274,116**	**33,979,172,721**	
	කැන්පතු ගෙවීම්		1,309,454,845	1,164,549,354	ඒසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		2,082,238,286	1,623,820,663	ඒසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	12,000	
	ප්‍රධාන ලෙජර් වියදම් (එ)		**3,391,693,130**	**2,788,382,017**	
	මුළු වියදම් ඒ = (ඊ+උ+එ)		402,629,946,475	367,312,234,146	
484,940,252,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඒ)		**(35,536,701,255)**	**(43,775,071,878)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(35,537,063,958)	(43,783,915,216)	ඒසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		362,702	8,843,338	ඒසිජ්-3
			(35,536,701,255)	**(43,775,071,878)**	

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්ෂ 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	276,180,745,082	254,485,180,261
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	4,635,938,735	4,030,348,624
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	362,702	8,843,338
මුළු වත්කම්		**280,817,046,519**	**258,524,372,223**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		1,777,588,399	1,870,599,882
දේපළ පිරියත හා උපකරණ සංචිතය		276,180,745,082	254,485,180,261
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	2,858,350,336	2,159,748,742
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	362,702	8,843,338
මුළු වගකීම්		**280,817,046,519**	**258,524,372,223**

පිටු අංක 7 | 263 සිට 67 | 402 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරතුරු සහ ඇමුණුම් පිටු අංක 88 | 403 සිට 282 | 423 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මූදල්)/ කොමසාරිස් (මූදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2026/03/26	දිනය : 2026/03/26	දිනය :

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බුද්ධරක්ඛිත විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බුද්ධරක්ඛිත විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

3.4 මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	98,719,800	-
ලාභ		-
ආදායම් නොවන ලැබීම්	15,105,705,315	22,006,019,097
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්		-
අග්‍රිම ලැබීම්	364,495,766,164	321,123,520,666
අත්තිකාරම් අයකර ගැනීම්	1,481,471,433	1,293,543,616
කැන්පතු ලැබීම්	2,006,723,376	1,344,641,025
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්	175,118,658	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	383,363,504,746	345,767,724,404
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	331,873,803,764	312,696,272,291
සහනාධාර සහ මාරුකිරීම්	3,550,635,471	3,044,562,857
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	19,737,774,365	15,232,647,024
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	709,233,053	504,415,148
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,168,975,557	222,158,301
අත්තිකාරම් ගෙවීම්	2,073,847,215	1,624,787,526
කැන්පතු ගෙවීම්	1,309,454,845	1,164,549,354
පී. එස්. පී. එස්	-	12,000
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	360,423,724,271	334,489,404,501
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	22,939,780,475	11,278,319,903
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	22,948,662,377	11,269,842,017
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	22,948,662,377	11,269,842,017
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(22,948,662,377)	(11,269,842,017)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(8,881,902)	8,477,886
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(8,881,902)	8,477,886
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	9,244,604	365,452
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	362,702	8,843,338

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

නැත

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රුපියල් මිලියන

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසාන ඇස්තමේන්තුව	ප්‍රමාණය (රුපියල්)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %
20.02.01.01	රජයේ ගොඩනැගිලි සඳහා කුලිය	220,000,000.00	220,000,000.00	436,162,731.81	198
20.02.01.99	රජයේ වත්කම් මත ආදායම වෙනත් කුලී ගාස්තු	20,000,000.00	35,000,000.00	70,276,988.23	201
20.02.02.99	වෙනත් පොලී	100,000,000.00	100,000,000.00	145,252,027.38	145
20.03.01.00	විකුණුම් ආදායම සහ ගාස්තු - දෙපාර්තමේන්තු විකුණුම්	50,000,000.00	50,000,000.00	123,610,476.51	247
20.03.02.99	විකුණුම් ආදායම සහ ගාස්තු - පරිපාලන ගාස්තු අයකිරීම්	45,000,000.00	45,000,000.00	111,237,540.20	247
20.03.03.02	විකුණුම් ආදායම සහ ගාස්තු - දඩ සහ රාජසන්තක කිරීම්	30,000,000.00	85,000,000.00	124,099,324.23	146
20.03.99.00	විකුණුම් ආදායම සහ ගාස්තු - වෙනත් රිසිට්පත්	2,500,000,000.00	4,500.000,000.00	9,200,622,920.77	204
20.06.02.01	ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම - වාහන	2,000,000.00	2,000,000.00	120,877,000.00	6044
20.06.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම - වෙනත්	1,500,000.00	1,500,000.00	2,361,893.40	157

3.7 ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

(රු. ,000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝජිත ප්‍රතිපාදනය, අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	383,162,000,000	397,028,252,000	349,484,979,228.13	88
ප්‍රාග්ධන	91,387,000,000	87,912,000,000	49,753,274,116.03	57

3.8 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

(රු. ,000)

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන යේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු. ,000)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල %
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	අධිකරණ අමාත්‍යාංශය	228 - අධිකරණ පරිපාලන කටයුතු	41,000,000	41,000,000	40,216,033.99	98

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රුපියල්

වත්කම් කේතය	කේත විස්තරය	**2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2025.12.31** දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්ගත කිරීමට නියමිත	% ලෙස ප්‍රගතිය වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	63,520,641,516.25	63,520,641,516.25	-	
9152	යන්ත්‍ර හා උපකරණ	91,445,607,077.57	91,445,607,077.57	-	
9153	ඉඩම්	68,434,466,250.00	68,434,466,250.00	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	376,933,573.26	376,933,573.26	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	52,913,866,300.23	52,913,866,300.23	-	
9180	බදු වත්කම්	-	-	-	
	මුළු එකතුව	**276,691,514,717.31**	**276,691,514,717.31**	-	

➢ 2025.12.31 දිනට දේශීය වෛද්‍ය අංශයේ මූල්‍ය ප්‍රගතිය

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය (රුපියල්)	වියදම (රුපියල්)	වියදම් ප්‍රතිශතය (%)
පුනරාවර්තන	**593,000,000.00**	**561,280,451.34**	**94.65**
සාමාන්‍ය පරිපාලනය / සාමාන්‍ය වැඩසටහන්	531,700,000.00	502,854,815.06	94.57
ආයතනික සේවා			
රාජ්‍ය ආයතන			
• හෝමියොපති වෛද්‍ය සභාව	32,700,000.00	31,849,653.22	97.40
• හෝමියොපති රෝහල	28,600,000.00	26,575,983.06	92.92
ප්‍රාග්ධන	**34,500,000.00**	**30,530,700.00**	**88.49**
සාමාන්‍ය පරිපාලනය	**10,500,000.00**	**7,641,411.05**	72.78
යන්ත්‍ර උපකරණ අළුත්වැඩියා	3,000,000.00	791,542.35	26.38
වාහන	3,500,000.00	3,105,049.49	88.72
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	2,000,000.00	1,781,357.10	89.07
යන්ත්‍ර හා උපකරණ	1,500,000.00	1,479,762.11	98.65
කාර්ය මණ්ඩල පුහුණු	500,000.00	483,700.00	96.74
විශේෂ වැඩසටහන්	**15,500,000.00**	**15,181,622.58**	97.95
• හෝමියෝපති කවුන්සලය	1,000,000.00	996,943.40	99.69
• සංරක්ෂණ සභා	3,000,000.00	2,946,978.46	98.23
• පෝෂණ මන්දිර ස්ථාපනය කිරීම	2,000,000.00	1,959,985.00	98.00
• හෝමියෝපති ක්‍රම සංවර්ධනය	9,500,000.00	9,277,715.72	97.66
ඔසු දිරිය වගා ප්‍රවර්ධන වැඩසටහන	**8,500,000.00**	**7,707,666.37**	90.68
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2,000,000.00	1,982,201.98	99.11
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1,000,000.00	961,104.14	96.11
පුහුණු වැඩසටහන්	1,000,000.00	982,811.25	98.28
වෙනත්	4,500,000.00	3,781,549.00	84.03
මුළු එකතුව	**627,500,000.00**	**591,811,151.34**	**94.31**
වෙනත්	**ප්‍රතිපාදනය (රුපියල්)**	**වියදම (රුපියල්)**	**වියදම් ප්‍රතිශතය (%)**
ආයුර්වේද සමඟින් සහයෝගී සත්කාර	5,000,000.00	4,875,609.75	97.51
බෝ නොවන රෝග	4,013,500.00	3,997,147.25	99.59
	9,013,500.00	**8,872,757.00**	**98.44**

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩී/බී/එම්ඔඑව්/02/2025/14

ඔබේ අංකය / உமது இல. / Your No. }


දිනය / திகதி / Date } 2026 මැයි 29 දින



ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය


සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.



කේ.කේ.එස්. ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය



අංක 306/72, පොළduwa පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩී/කි/එම්ඔඑව/02/2025/14

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 මැයි 29 දින

ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය 111 - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 111 - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ පිටු අංක 6 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පිටු අංක 6 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA 6 ආකෘතිය) සඳහා අමුණා තිබුණු භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරන ලද SA 80 හා SA 82 යන ආකෘතින් අනුව දැක්වෙන වත්කම්, අමාත්‍යාංශයේ නව CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් සමඟ සැසඳේද යන්න පරීක්ෂා කිරීම සඳහා අමාත්‍යාංශයේ නව CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් කළද එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මේ හේතුවෙන් අමාත්‍යාංශය විසින් සත්‍ය වශයෙන්ම පවත්වාගෙන යනු ලබන මූල්‍ය නොවන වත්කම් මොනවාද යන්න සත්‍යාපනය කර ගැනීමට නොහැකි විය.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු. මිලියන 254,485.18 ක් වුවද සමාලෝචිත වර්ෂයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2025 ජනවාරි 01 දිනට එම අගය රු. මිලියන 249,319.12 ක් විය. මේ අනුව රු. මිලියන 5,166.06 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) භාණ්ඩාගාර මුද්‍රිත සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගැලපීම් කර තිබුණු රු. මිලියන 9,673.61 ක්, සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 21,808.16 ක් වූ වත්කම් මිලදී ගැනීම්, රු. මිලියන 5,818.22 ක් වූ වත්කම් අපහරණයන් රු. මිලියන 1,158.08 ක් වූ වත්කම් මාරු කිරීම් (Transfer) හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පැවති රු. මිලියන 276,180.75 ක මූල්‍ය නොවන වත්කම් ශේෂයට අදාළ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් මෙකී අගයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඈ) අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය රු. මිලියන 276,180.75 වුවද විගණනය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 68 ක 2025 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව වත්කම්වල පිරිවැය රු. මිලියන 277,141.82 ක් විය. ඒ අනුව රු. මිලියන 961.07 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව, 2025 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 271.62 ක් වූ මූල්‍ය නොවන වත්කම් හා සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු. මිලියන 213.26

ක් වූ වෛද්‍ය උපකරණ, අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපතට ඇතුළත් කර නොතිබුණි.

(ඊ) සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 507.40 ක්වූ ගිලන්රථ මිලදී ගෙන තිබුණද අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී කොරියන් රජය යටතේ ක්‍රියාත්මක Korea Foundation For International Healthcare (KOFIH) ව්‍යාපෘතිය යටතේ ලබා දී තිබුණු ජංගම වැඩපළවල් ලෙස පරිවර්තනය කර ඇති රු. මිලියන 158.85 ක් වූ වෑන්රථ 08 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) මූල්‍ය නොවන වත්කම්වල කෙරිගෙන යන වැඩ සඳහා රු. මිලියන 14,173.75 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවෙහි (SA 82) රු. මිලියන 10,257.97 ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම්වල ඇතුළත් කෙරිගෙන යන වැඩවල පිරිවැය රු. මිලියන 3,915.78 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් කර ඇති පහත ව්‍යාපෘති මඟින් ජනනය වූ වත්කම් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට අදාළ සාක්ෂි සහ අමාත්‍යාංශය වෙත පැවරීමට අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(i) ප්‍රාථමික සෞඛ්‍ය පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ සංරචක I හා සංරචක II අවසන් කර තිබුණු අතර එම ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන අනුව පැවති රු. මිලියන 2,177.72 ක් වූ මූල්‍ය නොවන වත්කම්, අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය හා එහි දෙවන අතිරේක මූල්‍යකරණ ව්‍යාපෘතිය 2024 අප්‍රේල් 30 අවසන්ව පැවති අතර එදිනට අදාළ ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය අනුව පැවති රු. මිලියන 3,460.31ක වත්කම් පැවරීමට අදාළ තොරතුරු හා මෙම වත්කම් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(iii) කොවිඩ් 19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන 8.37 ක් වූ වත්කම් අමාත්‍යාංශය වෙත මාරුකර ඇති බව දක්වා තිබුණද මෙම වත්කම් පැවරීමට අදාළ තොරතුරු හා මෙම වත්කම් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඒ) 2024 මැයි 22 දින ලබාදුන් කැබිනට් තීරණයක් මත පොතුවිල් මූලික රෝහල සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම රෝහල සතු වත්කම් නව CIGAS පද්ධතියට ඇතුළත් කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් රෝහල් /ආයතන 69 ක 2025 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව රෝහල් 07 ක ඉඩම් මෙන්ම රෝහල් 02 ක ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර ගිණුම්ගත කරන ලද තොරතුරුවල නිවැරදි බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඕ) අවුරුදු 5ත් 15ත් අතර කාල පරාසයක් ඇතුළත, අයිතිය ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති වාහන 3ක පිරිවැය වන රු.මිලියන 128 ක අගය මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමෙන්, මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2025 දෙසැම්බර් 31 දින වන විට තැපැල් දෙපාර්තුමේන්තුව වෙත පවරා දී තිබුණු වාහන 4ක පිරිවැය වූ රු.මිලියන 20.20 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම් එම වටිනාකම්න් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ගාල්ල ජාතික රෝහලෙහි ස්ථාපිත කර තිබුණු සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් හා පද්ධතියට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු HiQi ව්‍යාපෘතිය (Health Information and Quality Improvement Project) හරහා ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ඊට අවශ්‍ය උපකරණ ලබාදෙන බවත් එම උපකරණ ලැබෙන දින වන විට සේවාදායක පරිගණක කාමරයක් (Server unit) සාදා නිම කර තිබිය යුතු බවට 2024 අගෝස්තු 01 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබිය දී පරිගණක හා උපාංග ඇතුළු උපකරණ ඒකක 3,851 ක් 2025 ජූලි 17 සිට 2025 දෙසැම්බර් 22 දක්වා කාලය තුළ වරින් වර රෝහලට ලබා දී තිබුණු අතර එම උපකරණ රෝහලේ ගබඩා කාමරයක් තුළ නිශ්කාර්යව ගබඩා කර තිබුණි. 2025 ජූලි 17 හා ජූලි 21 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රෝහලට ලබා දී තිබුණු පරිගණක හා උපාංග අයිතම 1827 ක පිරිවැය එක්සත්

ජනපද ඩොලර් 64,008 ක් වී තිබුණු අතර ඒ අනුව එහි වටිනාකම දළ වශයෙන් රු.US,SHK 19.20 (1 $ = රු.300/-) ක්වූ අතර අනෙකුත් උපකරණ අයිතම 2,024 ක පිරිවැයට අදාළ සාක්ෂි හා වගකීම් කාලයට අදාළ සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වන විට දේශීය ඖෂධ අවශ්‍යතාවයෙන් සියයට 40 ක් මෙරට නිෂ්පාදනය කිරීම අරමුණු කරගනිමින් ඖෂධ නිෂ්පාදනයට ආයෝජන ආකර්ෂණය ඇති කර ගැනීම උදෙසා හම්බන්තොට ආරබොක්ක වතුයායේ ඖෂධ සඳහා වෙන්වූ විශේෂිත ඖෂධ නිෂ්පාදන කලාපයක් පිහිටුවීමට 2020 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර අදියර 02 ක් යටතේ අක්කර 400 ක භූමි ප්‍රදේශයක සමාගම් 40 ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණි. ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් 2021 වර්ෂයේදී ඖෂධ නිෂ්පාදන කලාපයට පිටතින් විදුලිය සැපයීම සඳහා රු. මිලියන 53.20 ක්ද, ජල සැපයුම සඳහා රු. මිලියන 144.00 ක් ඇතුළුව රු. මිලියන 197.20 ක් වැයකර තිබුණු අතර 2022 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා වෙන් කළ රු. මිලියන 100.00 ක ප්‍රතිපාදනවලින් සියයට 66 ක් වෙනත් වැය විෂයයන් 02 ක් වෙත මාරු කර තිබුණි. නමුත් ජාතික ජලසම්පාදන මණ්ඩලයට තවත් රු.මිලියන 281.94 ක මුදලක් ගෙවීමට ඇති අතර 2026 අප්‍රේල් වන විට ආයෝජන මණ්ඩලය හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය හරහා මෙම සංවර්ධන කටයුතු සිදු කිරීමට අවධානය යොමු වී තිබුණද වර්ෂ 05 ක කාලයක් ගතවී තිබුණද ඖෂධ නිෂ්පාදන කලාපය පිහිටුවා නොතිබුණි. එසේම 2020 වර්ෂයේදීම අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ ඖෂධ කර්මාන්ත කලාපයක් පිහිටුවීමට ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සැපයුම්කරුවන් සඳහා අභිලාෂ කැඳවා, කලාපයට විදුලිය සැපයීම සඳහා රු.මිලියන 23.04 ක් වැයකළද සමාලෝචිත වර්ෂය දක්වා අදාළ සංවර්ධන කටයුතු අවසන් කර නොතිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යාංශය හා කලාප සංවර්ධනකරු අතර පැවති ගිවිසුමද සමාලෝචිත වර්ෂයේදී අවලංගු කර තිබුණි.

4.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) කුරුණෑගල ශික්ෂණ රෝහලෙහි පවත්වාගෙන යනු ලබන තොරතුරු කළමනාකරණ පද්ධති පිළිබඳ පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) වාට්ටු හා ඒකකයන්හි රෝගීන් ඇතුළත් කිරීම, ලියාපදිංචිය, මුදා හැරීම ක්‍රියාත්මක කිරීම සඳහා 2016 ජනවාරි 01 දින සිට තොරතුරු කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර වසර 10 කට වැඩි කාලයක් ගත වුවද වර්තමානය වන විටත් මෘදුකාංග භාවිතයෙන් නේවාසික රෝගීන් ලියාපදිංචි කිරීම පමණක් සිදුකරමින් පවතින බව නිරීක්ෂණය විය. රෝගීන් මුදාහැරීම් (Discharge) කටයුතු වාට්ටු මඟින් තවදුරටත් Manually ක්‍රමයට සිදුකර පසුව මෘදුකාංග පද්ධතියට ඇතුළත් කරන අතර 2025 මැයි මාසයේ මුදාහල රෝගීන්ගේ ඇඳ ඉහපත් වාර්තා 2025 සැප්තැම්බර් 23 දිනවන විටත් මෘදුකාංග පද්ධතිය වෙත ඇතුළත් කිරීම අවසන් කර නොතිබුණි.

(ii) යම් නිශ්චිත මොහොතක ක්ෂණිකව ප්‍රතිකාර ලබා ගන්නා නේවාසික රෝගීන් සංඛ්‍යාව සම්බන්ධව තොරතුරු ලබා ගැනීමට රෝහල තුළ ඩිජිටල්කරණ

තොරතුරු පද්ධතියක් නොතිබුණි. දැනට Manual ක්‍රමයට වාර්ටුවලින් ලබා ගන්නා මධ්‍යම රාත්‍රී දත්ත වාර්තාව (Mid night Report) පදනම් කර ගෙන නේවාසික රෝගීන් සංඛ්‍යාව ඊට පසු දින සකස් කරනු ලබන අතර මෙයද අමතර පරිශ්‍රමයක් යොදා සිදුකරනු ලබන ක්‍රියාවලියක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) රජයේ රෝහල්වල බාහිර රෝගී අංශයෙහි ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ICTA ආයතනයෙන් කුරුණෑගල ශික්ෂණ රෝහල වෙත 2017 සහ 2018 වර්ෂවල ලබාදී තිබුණු භාවිතයට ගැනීමට පෙර, වගකීම් කාලය අවසන් වීමට ආසන්නව පැවතුන උපකරණ හා උපාංග වසර 02 ක පමණ කාලයකට පසු (Barcode scanner, Laptops, Sticker Printers සහ Dot Matrix printers) අදාළ අරමුණින් බැහැරව විවිධ අංශ වෙත බෙදා හැරීම් සිදුකර තිබුණද, ගබඩාවට ලැබී වසර 07 කට වැඩි කාලයක් ගත වූ Barcode Scanner යන්ත්‍ර 32 ක් 2026 මාර්තු 13 දිනවන විටත් ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.

(iv) 2016 මාර්තු මාසයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් හඳුන්වා දුන් ජාතික විද්‍යුත් සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ ප්‍රමිත 1.0 (National Health Guideline and Standers) හි 4 වන පරිච්ඡේදය ප්‍රකාරව රාජ්‍ය සෞඛ්‍ය ආයතනවල වෙබ් අඩවියක් ගොඩනගා පවත්වාගෙන යායුතු වුවත් කුරුණෑගල ශික්ෂණ රෝහල විසින් මහජනතාවට නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ලබාගත හැකි වෙබ් අඩවියක් පවත්වාගෙන ගොස් නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) කුරුණෑගල ශික්ෂණ රෝහලේ රූප සංරක්ෂණ සහ සන්නිවේදන පද්ධතිය (Picture Archiving and Communication System - PACS) ස්ථාපනය කිරීම සහ වර්තමාන භාවිතය සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) රෝහලේ පිළිකා රෝගීන්ගේ රෝග නිශ්චය කටයුතු සඳහා අවශ්‍ය විකිරණ පටල / විකිරණ ඡායාරූප (CT Scan / X – Ray) ලබා ගැනීම සඳහා දිගු කාලයක් පොරොත්තු ලේඛනයක රැදීසිටීමට සිදුවීම හා විකිරණ පටල (CT Scan / X – Ray) ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් මුළු රෝහල සඳහාම 2019 ඔක්තෝබර් මාසයේ සිට වයඹ පිළිකා අරමුදලේ දායකත්වය මත ස්ථාපිත කරන ලද රූප සංරක්ෂණ සහ සන්නිවේදන පද්ධතිය (Picture Archiving and Communication System (PACS) ආරම්භයේදී වෛද්‍යවරුන් තම පෞද්ගලික සන්නිවේදන උපකරණ භාවිතයෙන් පරිශීලනය කර තිබුණු අතර පසුකාලීනව මේ සඳහා අවශ්‍ය සන්නිවේදන උපකරණ ලබා නොදීම හේතුවෙන් 2024 වර්ෂයේ අගභාගය වන විට රෝහලේ වාර්ටු හා සායන මෙම පහසුකම භාවිතයෙන් ඉවත්ව තිබුණි. රෝගීන් සඳහා අවශ්‍ය විකිරණ පටල (Films) වෛද්‍ය සැපයුම් අංශය (MSD) ලබා දෙනු ලබයි. සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා පමණක් X – Ray යන්ත්‍ර සඳහා අවශ්‍ය වන විකිරණ පටල (Films) 84,600 ක් සඳහා රු.මිලියන 40.81 ක් සහ CT හා Mammogram සඳහා ලද විකිරණ පටල 77,875 ක් සඳහා රු. මිලියන 51.07 ක් ලෙස, මුළු වියදම රු. මිලියන 91.88 ක වියදමක් රෝහල වෙතුවෙන් දැරීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය.

(ii) රෝහලෙහි පැවති CT, Mammogram සහ X-Ray පරීක්ෂණ සඳහා භාවිතා කරන විකිරණ යන්ත්‍ර Picture Archiving and Communication System (PACS) හා සර්වරය සමඟ සම්බන්ධ කිරීමෙන් පසු ලබාගත් විකිරණ ඡායාරූප (Images), රෝහල් පරිගණක ජාලයේ දෘඩ තැටිවල තැන්පත් වී තිබුණි. නමුදු එම දෘඩතැටිවල (Hard Disc) ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2022 අප්‍රේල් 30 දක්වා වූ ඡායාරූප (Images) මකා දැමීම සිදුකර තිබුණද. රෝහලෙහි PACS පද්ධතිය සඳහාම Server යන්ත්‍රයක් රු. මිලියන 1.70 ක ඉන්වොයිසිගත වටිනාකමකට 2021 සැප්තැම්බර් 21 දින ප්‍රධාන ගබඩාවට ලැබී තිබුණි. වර්ෂ 1 මාස 05 කට පමණ පසු එනම් 2023 අප්‍රේල් 08 දින පරිගණක නඩත්තු අංශයට නිකුත් කර තිබුණි. මේ අනුව උපකරණ මිල දී ගෙන කළමනාකරණය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණ දීමට රෝහලට සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(iii) රූප සංරක්ෂණ සහ සන්නිවේදන පද්ධතිය නැවත යථාවත් කිරීම සඳහා රෝහලෙහි පවතින Server පද්ධතිය ආරක්ෂිත ස්ථානයක් කරා විතැන් කිරීමට 2025 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 15.34 ක් වියදම් දරමින් පරිගණක සහ උපාංග 40 ක්, Network Switch, Port Ethernet Switch 02 ක් ඇතුළු උපකරණ මිලදී ගෙන තිබුණද, අදාළ උපකරණ අරමුණු වෙනුවෙන් කාර්යක්ෂමව භාවිතා කර නොතිබුණි. නිශ්චිත සැලසුමකට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම මත ව්‍යාපෘතිය අවසන් කිරීම මන්දගාමීව සහ අරමුණට පරිබාහිරව සිදුවන බව නිරීක්ෂණය විය.

(ඇ) පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ 2019 වර්ෂයේ E-Health වැඩසටහන යටතේ රු. මිලියන 19.50ක් වැය කර රෝහල තුළ අභ්‍යන්තර ජාලගත කිරීමේ මූලික යටිතල පහසුකම් ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකර තිබුණද එම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් යොමු කරන ලද විගණන විමසුම් වලට පිළිතුරු ලෙස එය යථාවත් කරගන්නා බව දන්වා තිබුණද වැඩ නිම කර වසර 07 ක් ගතවී ඇතත් මෙම පද්ධතිය සක්‍රීය කර නොතිබුණි.

(ඈ) කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය යටතේ පාලනය වන අලුත්ගම ප්‍රාදේශීය රෝහලේ ඉදිකර ඇති නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති ළමා වාට්ටුව භෞතික පහසුකම් වලින් සමන්විතව නිර්මාණය කර, රාත්‍රී සේවා මුර සඳහා භෙද නිලධාරීන් දෙදෙනෙකු හා උපස්ථායක නිලධාරියකු බැගින් සේවයේ යොදවා තිබුණද ප්‍රතිකාර සඳහා ඇතුල්වන රෝගීන් සංඛ්‍යාව ඉතා අවම මට්ටමක පැවති අතර සමහර දිනවල කිසිදු රෝගියකු නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමට ඇතුළත් කර නොතිබුණි. රෝහලේ ළමා වාට්ටුව සඳහා සතියකට වරක්වත් විශේෂඥ වෛද්‍යවරයකුගේ සේවය නොලැබීම, රෝහල තුළ වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමට පහසුකම් නොතිබීම හා රසායනාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි.

(ඉ) මැලේරියා මර්දන ව්‍යාපාරය සඳහා 2021 වර්ෂයේදී රු. මිලියන 11.52 ක් වැය කර ස්ථාපිත කරන ලද අභ්‍යන්තර දුරකථන පද්ධතිය හා සුහුරු දත්ත මධ්‍යස්ථානය පිළිබඳව 2025 සැප්තැම්බර් 08 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී මෙම අභ්‍යන්තර දුරකථන පද්ධතිය හා සුහුරු දත්ත මධ්‍යස්ථානය ක්‍රියාත්මක නොවන බවත් ඒ සඳහා මිලදී ගත් දුරකථන ගලවා ඉවත් කර අනාරක්ෂිත ලෙස තිබුණු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව මෙම කාර්යය වෙනුවෙන් දරන ලද මුළු වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

4.1.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(අ) මූල්‍ය හා මෙහෙයුම් විගණනය - ශික්ෂණ රෝහල කළුතර අතරමහ නවතා දමා ඇති ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂාව මැයෙන් වූ 2024 නොවැම්බර් 19 දිනැති විගණන විමසුමට 2025 සැප්තැම්බර් 19 දින ඉදිරිපත් කරන ලද පිළිතුරු පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ශල්‍යාගාරයකින් සමන්විත අක්ෂි වාට්ටු ගොඩනැගිල්ල ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාළව අයකර ගත් බව සඳහන් කරන ලද රු. මිලියන 26.67 ක මුදල ගිණුම්ගත කළ ආකාරය, කොන්ත්‍රාත්කරුගේ පළපුරුද්ද හා ව්‍යාපෘතියේ පළමු අදියර වෙනුවෙන් වැයකරන ලද රු. මිලියන 44.01 ක මුදල සහ දෙවන අදියර සඳහා ගෙවන ලද අත්තිකාරම් තුළින් ආවරණය කරගත් මුදල ඇතුළුව සත්‍ය ලෙස බිල්කරන ලද මුදල, මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර පිළිතුරු ලිපියේ දැක්වෙන පරිදි මෙම ව්‍යාපෘතියේ දෙවන අදියරට අදාළව රු. මිලියන 39.11 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කරන ලෙස කළුතර ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ වෙත දැනුම් දීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. එසේම ව්‍යාපෘතියේ දෙවන අදියරට අදාළ අවසාන බිල්පත්‍රයක් සකස්කර තිබෙද යන්නත්, එසේ නොමැනි නම් අවසන් වරට ගෙවන ලද බිල්පත්‍රයට අදාළව වැඩ බිමට සපයන ලද ඉදිකිරීම් ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවීම්කර තිබෙද යන්නත් විගණනයට තහවුරු නොකෙරුණි.

(ii) විදුලි ජනන යන්ත්‍ර කාමරය සහ පැති බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව ලබාදී තිබුණු පිළිතුර අනුව සඳහන් කර තිබුණු බිල්පත් ගෙවා රු.892,219 ක මුදල රජයේ ආදායමට බැර කිරීමට අදාළ ලිඛිත සාක්ෂි හා එම බිල්පත් සහිත ගෙවීම් වවුචරයේ සහතික කළ පිටපතක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර කොන්ත්‍රාත්කරුවන් අසාධු ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙද යන්න හා මෙම කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කර තිබෙද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) බදුල්ල ශික්ෂණ රෝහලේ නොමේරූ ළදරු ඒකකයේ ක්‍රියාකාරිත්වය සහ ධාරිතාවය පුළුල් කිරීමේ අරමුණින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය මඟින් තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු සමඟ රු. මිලියන 20.32 ක (බදු රහිත) මිලකට දින 210 ක් ඇතුළත දී වැඩ නිම කිරීම සඳහා 2024 පෙබරවාරි 09 දින ගිවිසුම්

ගත වී තිබුණි. 2024 නොවැම්බර් 30 දින දක්වා දින 119 ක කාලයක් එනම් ව්‍යාපෘතිය නිම කිරීමට එකඟ වූ කාලයට අමතරව සියට 57 ක අමතර කාලයක් දින දීර්ඝ කිරීමක් ලෙස ලබා දී අවස්ථා දෙකකදී රු. මිලියන 2.16 ක මුදලක් ගෙවා තිබුණු අතර ගිවිසුම අවලංගු කර තිබුණු 2025 මැයි 10 දින වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 15 ක් විය.

(ඇ) කුලියාපිටිය රෝහල මධ්‍යම රජයට පවරාගෙන ශික්ෂණ රෝහල් ලෙස සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වයඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමට සමගාමීව කුලියාපිටිය රෝහල මධ්‍යම රජයට පවරාගෙන ශික්ෂණ රෝහලක් ලෙස 2019 ජනවාරි 23 දිනැති අංක 01/08 දරන ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර තිබුණි. ඒ අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සකස් කරන ලද ප්‍රධාන සැලැස්මට අනුව රෝහලෙහි 2019 අගෝස්තු 31 දින උත්සවාකාරයෙන් ශික්ෂණ රෝහලක් බවට පත්කිරීමේ සමරුඵලකය ඇතුළත්ව රෝහලෙහි ස්ථාන 05 ක එනම් හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකය, මහාචාර්ය ඒකකය, විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය නිල නිවාස සහ රාජ්‍ය ඔසුසල - කුලියාපිටිය ශාඛාව මුල්ගල් තබා සමරුඵලක විවෘත කිරීම් සිදු කර තිබුණද 2026 මාර්තු වන විටත් එම කිසිදු ඉදි කිරීමක් සිදු කර නොතිබුණි.

(ii) ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය භූමියෙහි පසෙහි තත්ත්වය පරීක්ෂාකර ගැනීම වෙනුවෙන් 2019 දෙසැම්බර් 03 දින පාංශු පරීක්ෂාවක් සිදු කර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 4.10 ක් වියදම් කර තිබුණි. තවද, ප්‍රධාන සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) විසින් රු. මිලියන 4.72 ක වටිනාකමකින් යුත් බිල්පතක් ද යොමු කර තිබුණි. මෙම ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවහොත් මෙම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වීමට ඉඩ ඇති බව නිරීක්ෂණය විය.

(iii) ප්‍රධාන සැලසුම අනුමත කළ 2019 සැප්තැම්බර් 18 දින සිට 2026 මාර්තු 03 දින දක්වා වර්ෂ 06 ක පමණ කාලයක් ගත වී ඇතත් ප්‍රධාන සැලැස්මට අදාළ රු.මිලියන 32,232 ක් වූ ඇස්තමේන්තු වටිනාකමකින් යුත් කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ඉටු කර නොතිබුණි. එසේ වුවද, ගොඩනැගිලිවල නඩත්තු කටයුතු හා සේවා අවශ්‍යතාවය මත සිදු කිරීමට වන පුළුල් වීම් ආදී සංවර්ධන ව්‍යාපෘති සිදුකිරීම සඳහා 2023 වසර සිට 2025 අගෝස්තු 05 දක්වා වූ වසර දෙක හමාරක් තුළ රු. මිලියන 169.07 ක වියදමක් දරා තිබුණි.

(iv) යටිතල පහසුකම් හා සම්පත් හිහකම හේතුවෙන් ශික්ෂණ රෝහලක් ලෙස පවත්වා ගත යුතු තත්ත්වය (Teaching hospital norms) පවත්වා ගැනීමට නොහැකි වී තිබුණද ශික්ෂණ රෝහලක් වශයෙන් ජනගත වීම මත රෝහල කරා පැමිණෙන රෝගීන්ගේ වැඩි වීමක් සිදු වී තිබුණි. 2023 සිට 2024 වන විට නේවාසික ප්‍රතිකාර සහ සායන සඳහා පැමිණෙන රෝගීන් සියයට 12 කින් සහ බාහිර රෝගී අංශයට

ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන් සියයට 7 කින්ද වැඩි වී තිබුණි. එමෙන්ම සිටි ස්කෑන්, හෘද රෝග ඒකක, ස්නායු ඒකක, වකුගඩු ඒකකය හා පිළිකා ඒකකය වැනි අත්‍යවශ්‍ය වෛද්‍ය පහසුකම් නොමැති වීම හේතුවෙන් රෝහල වෙත ඇතුළත් වන රෝගීන්ගෙන් 2023 සැප්තැම්බර් 23 සිට 2025 අගෝස්තු 12 දක්වා කාලපරිච්ඡේදය තුළ රෝගීන් 6784 ක් වෙනත් රෝහල් වෙත මාරු කර යවා තිබුණි. මේ සඳහා ගිලන් රථ හා අනෙකුත් අවශ්‍යතා සඳහා අමතර වැය බරක් රජය දරමින් පවතින බවත්, රෝගී ජීවිත දැඩි අනතුරකට ලක්වන බවත් නිරීක්ෂණය විය.

(v) රෝගීන්ගේ වැඩි වීමට සාපේක්ෂව යටිතල පහසුකම් වැඩි නොවීම මෙන්ම කාර්යය මණ්ඩලයද වැඩි කර නොතිබුණි වසර 03 ක කාලයක් සිට පවතින තනතුරු 35 ක පුරප්පාඩු 129 ක් තව දුරටත් එසේම පැවතුණි.

(vi) ශික්ෂණ රෝහලක් ලෙස නම් කිරීමෙන් පසුව අනුමත විශේෂඥ වෛද්‍යවරුන් 36 ක් දක්වා වැඩි කර තිබුණි. 2024, 2025 හා 2026 වර්ෂයන්හි පැමිණි විශේෂඥ වෛද්‍යවරුන් 27 දෙනෙකුගෙන් විශේෂඥ වෛද්‍යවරු 04 දෙනෙකු සඳහා වාට්ටු හා ඒකක නොතිබුණු අතර ඔවුන් සායන පමණක් පවත්වා තිබුණි. විශේෂඥ වෛද්‍යවරුන් 16 දෙනෙකු එක් එක් සායන සිදු කිරීම සඳහා එක් පොදු ස්ථානයක් යොදාගෙන තිබුණි. විශේෂඥ වෛද්‍යවරුන් සිටියද සායන සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම මත වැඩි රෝගීන් පිරිසකට රෝගී සත්කාර සේවය ලබා ගැනීමට තිබුණු අවස්ථාව මහ හැරී තිබුණි.

(vii) වෛද්‍යවරුන් සඳහා වෙන් කර ඇති රජයේ නිවාස හා කාමර පසුගිය වසර 05 තුළ ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් ඉතාම අබලන් තත්වයකට පත් වී තිබුණි. එමෙන්ම රජයේ නිවාස අළුත්වැඩියා තත්ත්වයේ පැවතීමත් ප්‍රමාණවත් රජයේ නිවාස නොමැති වීමත් හේතුවෙන් විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙකු සහ රෝහල් අධ්‍යක්ෂක වෙත කුලී පදනම මත නිවාස ලබා දී තිබුණු අතර 2019 වර්ෂයේ සිට 2025 ජූලි 19 දක්වා කාලපරිච්ඡේදය තුළ කුලී පදනම මත ලබාගත් මෙම නිවාස සඳහා රජය රු.මිලියන 11.50 ක මුදලක් වැයකර තිබුණි.

(viii) ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ නව වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීම 2016 පෙබරවාරි 19 දිනැති ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර තිබුණු අතර එහි පළමු කණ්ඩායම සඳහා සායනික පුහුණුව 2022 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතව තිබුණි. ඒ සඳහා 2019 ජනවාරි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය මූලික රෝහල ශික්ෂණ රෝහලක් ලෙස ශ්‍රේණිගත කරන ලදී. 2022 වර්ෂයේ අගභාගය වන විට මහාචාර්ය ඒකකය පිහිටුවා අවසන් කළ යුතු නමුත් එය ස්ථාපිත නොවීම හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2022 ජූනි 14 දිනැති අංක DGHS/Universities/073/2022 දරන රෝහල් අධ්‍යක්ෂක ඇමතූ ලිපිය මඟින් තාවකාලික පදනම මත මහාචාර්ය ඒකකය කුරුණෑගල රෝහලෙහි ස්ථාපිත කිරීමට අවසර ලබා දී තිබුණි. වෛද්‍ය පීඨයට 2 km පමණ දුරින් පිහිටි කුලියාපිටිය

රෝහල ශික්ෂණ රෝහලක් ලෙස වැඩි දියුණු නොකිරීම හේතුවෙන් වෛද්‍ය ශිෂ්‍යයින් හා කාර්ය මණ්ඩල නිලධාරීන් දිනකට 36 km දුරක් ගෙවා පැමිණීම හා අනෙකුත් වියදම් දැරීමට සිදු වීම හේතුවෙන් දැඩි අපහසු තත්ත්වයකට මුහුණ දී තිබුණි.

(ඇ) කොවිඩ් 19 රෝගය පාලනය කිරීමේ අරමුණින් SAARC සංවර්ධන අරමුදලේ ප්‍රධානයක් මත මහනුවර ජාතික රෝහලේ ඉදිකෙරෙමින් පැවති ගොඩනැගිල්ල ඉදිකිරීම් 2024 මාර්තු 15 දින සිට නවතා දමා තිබුණි. මුළු ඇස්තමේන්තුව රු. මිලියන 288.83 ක් වූ මාස 06 කින් නිම කිරීමට තිබුණු මෙම ව්‍යාපෘතිය මෙසේ ප්‍රමාද වීම හේතුවෙන් මිල ඉහළ යාම ගැලපීමට ලබා දී තිබුණු අවස්ථාව රු. මිලියන 10.54 සිට රු. මිලියන 64.52 ක් දක්වා වැඩි වී තිබුණු අතර එම පිරිවැයන් ඉදිරියේදී තව දුරටත් ඉහළ යාම වැලැක්විය නොහැකි විය. දේශීය අරමුදල් මඟින් නිරවුල් කළ යුතු ව්‍යාපෘතියේ මෙතෙක් නිම කළ වැඩවලට අදාළ එකතුව රු. මිලියන 169.14 ක ගාස්තු නිරවුල් කිරීමේ ක්‍රමවේදය පිළිබඳවද එකඟතාවයකට පත්ව නොතිබුණු අතර වැඩ අතරමග නතර කරන ලද 2024 මාර්තු 15 දින වන විට රු.මිලියන 202.55 ක් වැය කර තිබුණද 2025 දෙසැම්බර් 31 දක්වා ගොඩනැගිල්ලේ කිසිදු කොටසක් මහජන ප්‍රයෝජනයට යොදා ගැනීමේ හැකියාවක් නොතිබුණි.

(ඉ) මහනුවර ජාතික රෝහලේ හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකයේ ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව වූ රු. මිලියන 413.41 වටිනාකමට වඩා සියයට 9.64 ක අඩු වටිනාකමකට හෙවත් රු.මිලියන 373.58 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘතිය ඉටු කිරීමේ ප්‍රගතිය අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ව්‍යාපෘතිය අර්ධ වශයෙන් නිමකර කොන්ත්‍රාත්තුව 2019 අගෝස්තු 23 දින අවලංගු කර තිබුණි.එම කාලසීමාව තුළම කොන්ත්‍රාත්කරුගේ ධාරිතාවය නොසලකා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ඇතුළුව ව්‍යාපෘති 6 ක් ඌන ප්‍රගතිය හේතුවෙන් කොන්ත්‍රාත් අතහැර දමා තිබුණි. කොන්ත්‍රාත් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද රු. මිලියන 18.68 ක කාර්ය සාධන ඇපකරය මුදල් කර ගැනීමෙන් පසුත් එම ආයතනයට ගෙවා තිබුණු අත්තිකාරම් හා බිල්පත් වටිනාකම් අනුව තවදුරටත් රු. මිලියන 109.47 ක මුදලක් කොන්ත්‍රාත් ආයතනයෙන් රජයට අයවිය යුතුව පැවතුණි.

(ඊ) කළුතර ශික්ෂණ රෝහල යටතේ පාලනය වන බෙරුවල මූලික රෝහලේ නව මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නවතා දමා තිබීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2019 ජනවාරි 23 දිනැති අංක අමප/19/0077/112/007/TB දරන අමාත්‍යමණ්ඩල තීරණය ප්‍රකාරව බෙරුවල ප්‍රදේශයේ ජනතාවට උසස් ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක රෝගී සත්කාර සේවාවක් සැපයීම, ආසන්නයේ ඇති තෘතීය සත්කාර සේවා සපයන රෝහල්වල තදබදය අඩුකිරීම සහ දැනට රෝහල් පරිශ්‍රයේ පවතින සීමිත ඉඩපහසුකම් සලකා බලා "බී" කාණ්ඩයේ මූලික රෝහලක පැවතිය යුතු පහසුකම් ඇතුළත්වන පරිදි බෙරුවල රෝහලේ මහල් නවයකින් යුක්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ I අදියර වෙනුවෙන් 2019 පෙබරවාරි 20 දින රු. මිලියන 355.05 ක බදු රහිත මුදලකට පෞද්ගලික ඉදිකිරීම් ආයතනයකට ලංසු ප්‍රදානය

කිරීමෙන් අනතුරුව එම අදියර යටතේ වැඩ බිම සකසා පොළොව කැනීම් කර පාදමට කණු ඉදිකිරීම් ආදී කටයුතු වෙනුවෙන් රු. මිලියන 364.71 ක් වැයකර තිබුණද 2022 ජූලි 30 දිනෙන් පසු ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි.

(ii) කෙරුවල මූලික රෝහලේ නව මහල් ගොඩනැගිල්ලේ මූලික අදියරේ කටයුතු නිම කිරීමට අදාළව 2022 ජූලි 30 දිනැති වැඩ නිම කිරීමේ සහතිකය ඒ අනුව සහතික කළ වැඩ වටිනාකම ලෙස ගෙවා තිබුණු රු. මිලියන 364.71 ක් සහ බිල්පත් නිරවුල් කිරීම ප්‍රමාදවීම මත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු. මිලියන 16.15 ක් ද සමඟ එකතුව රු. මිලියන 380.86 ක රජය විසින් වැයකර ඇති මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(iii) 2022 වර්ෂයෙන් පසුව රෝහල් ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා අමාත්‍යාංශයේ අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රෝහලේ බාහිර රෝගී අංශය, රසායනාගාර ඇතුලු රෝගී සත්කාර කටයුතු කරගෙන යමින් පැවති තනි සහ දෙමහල් ගොඩනැගිලි 02 ක් කඩා ඉවත්කර තිබීම හේතුවෙන් රෝහල් කටයුතු පවත්වා ගෙන යාමට දැඩි බාධාවක් වී තිබුණි.

(ඇ) කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය යටතේ පාලනය වන අලුත්ගම ප්‍රාදේශීය රෝහලේ නව ගොඩනැගිල්ලට සමගාමීව ඉදිකිරීම් ආරම්භ කර තිබුණු මල අපවහන පද්ධතියේ ඉදිකිරීමේ කටයුතු අඩක් පමණක් නිමකර අතහැර දමා තිබුණු අතර පද්ධතියේ යොදා ඇති කම්බි විශාල සංඛ්‍යාවක් මලබැඳී විනාශ වෙමින් පැවතුණි. එහි ඇතුළත කුහරවල ජලය එක්රැස්වී මදුරුවන් බෝවීමේ අවදානමක්ද පවතින අතර මේ වෙනුවෙන් රජයෙන් දරා ඇති වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

4.1.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

වාර්ෂිකව මිලියන 1.5 ක් පමණ ජනතාව සඳහා පහසුකම් සපයන සහ නිදන්ගත වකුගඩු රෝග (CKD) රෝගීන් 10,000 කට පමණ ප්‍රතිකාර කරනු ලබන මඩකලපුව ශික්ෂණ රෝහල, ඩයලිසිස් යන්ත්‍ර 8 ක් පමණක් සහ වෙන්කළ නිදන්ගත වකුගඩු රෝග වාට්ටුවක් නොමැති සීමිත පහසුකම් සහිතව දිගටම ක්‍රියාත්මක විය. මෙම අඩුපාඩු සපුරාලීම සඳහා, රෝහලේ වකුගඩු සත්කාර ඒකකයේ ඉදිකිරීම් 2017 නොවැම්බර් 09 දින රු. මිලියන 383.69 ක කොන්ත්‍රාත් මුදලකට ප්‍රදානය කර තිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුමට අනුව නිම කිරීමේ දිනය 2019 ජූනි 09 දින විය. කෙසේ වෙතත්, වසර 4 ක ප්‍රමාදයකින් පසු ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර 2023 සැප්තැම්බර් 15 දින රෝහලට භාරදී තිබුණි. මෙම ගොඩනැගිල්ලට ඩයලිසිස් ඒකක, වාට්ටු සහ විශේෂිත ප්‍රතිකාර පහසුකම් මෙන්ම අත්‍යවශ්‍ය උපකරණ ඇතුළත් කිරීමට අදහස් කර තිබුණු අතර මෙම ඉතිරි වැඩ සඳහා අමතර රු. මිලියන 241.5 ක මුදල සඳහා අනුමැතිය ලබාදී නිබියදීත්, පහසුකම් අසම්පූර්ණව පැවති අතර 2025 දෙසැම්බර් 31 දිනය දක්වා එහි අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ගොඩනැගිල්ල සහ ඒ ආශ්‍රිත උපකරණ දිගු කාලයක් අක්‍රියව පැවති අතර, ඇතැම් යන්ත්‍ර හා උපකරණ සඳහා වූ වගකීම් කාලයද ඉකුත් වී තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ කිලිටි රෙදි සේදීමේ කොන්ත්‍රාත් කාර්යය පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව "එෆ්" හි 2024 නොවැම්බර් 08 දිනැති තීරණය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව " සී" විසින් පෙන්වා දී ඇති පරිදි මාතලේ මහනගර සභාවේ නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් දක්වා ඇති අඩුපාඩු නිවැරදි කරගැනීමට යටත්ව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු. මිලියන 17.79 වටිනා වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකමකට මෙම කොන්ත්‍රාත් කාර්යය ප්‍රදානය කර තිබුණද, නිසි අධීක්ෂණයකින් හා පසුවිපරම් කිරීමකින් තොරව සේවාව ලබාගනිමින් පැවති බැවින් නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වාර්තාව අනුව පැවති අඩුපාඩු විගණිත දිනය වූ 2025 දෙසැම්බර් 16 දින වන විටද නිවැරදි කර නොතිබුණි.

(ii) රෙදි වියලීම සඳහා සුදුසු හා ප්‍රමාණවත් ස්ථානයක් නොතිබීම මත සෞඛ්‍ය ආරක්ෂිත නොවන ලෙස එළිමහන් භූමියේ අපිරිසිදු තණකොළ මතුපිට රෙදි වියලීම, සේවකයින්ගේ පුද්ගලික ස්වස්ථතාව ඉතා දුර්වල මට්ටමක පැවතීම, නිසි පරිදි විෂබීජ නාශක දියර භාවිතය සිදු නොකිරීම, අපිරිසිදු සේදුම් ටැංකි තුලට යොදන කිලිටි රෙදි සෞඛ්‍ය ආරක්ෂිත නොවන ලෙස මිනිස් ශ්‍රමයෙන් සේදීම, රෙදි ඇසිරීම සඳහා සුදුසු රාක්ක, භාජන ආදිය නොමැති බැවින් එළිමහනේ වියලන ලද රෙදි රැස්කිරීමේදී සේවකයින් විසින් තණකොළ සහිත බිම තුළ තබා රැස්කිරීම වැනි අවධිමත් තත්ත්වයන් පැවතුණි.

(iii) කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 2 අනුව සෝදන ලද රෙදි ස්ත්‍රික්ක කර අදාළ ඒකක වෙත ලබා දිය යුතු වුවත්, විගණිත අවස්ථාව වන විට එපරිදි රෙදි ස්ත්‍රික්ක කිරීමක් සිදු නොකරන බවත් සෝදා වියලන ලද රෙදි ඒකක වලට භාරදෙන තෙක් අවධිමත් ලෙස එලිමහනේ ආවරණයක් නොමැති ස්ථානයක රඳවාගෙන ඇති බවත් නිරීක්ෂණය විය.

(iv) මධ්‍යම පරිසර අධිකාරියේ නියමයන් ප්‍රකාරව රෙදි සේදීමේ ස්ථාන අපජලය බැහැර කරන ස්ථාන සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, රෝහලේ කිලිටි රෙදි සේදීමේ ස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් නොතිබියදී කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(v) රෝහල් අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ 2025 මැයි 21 දිනැති හා 2025 ජූනි 2 දිනැති ලිපි මඟින් රෝහලේ රෙදි සේදීමේ ඒකකය නවීකරණය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලා තිබුණද, රෝහලේ කිලිටි රෙදි සේදීමේ ඒකකයේ පවතින අඩුපාඩු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ නිසි අවධානයක් යොමු නොවීම මත ඒ සඳහා ප්‍රතිපාදන අනුමත වී නොතිබුණි.

(ආ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහල විසින් Patient warmer හා Stethoscope (Neonatal) මිලදීගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි.390 (ආ) ප්‍රකාරව පොතෙන් ඉවත් කරන ලද ආදායකයාට භාර නොදෙන ලද චෙක්පත් කිසිවක් වේ නම් ඒවා සේප්පුවක හෝ වෙනත් ආරක්ෂා සහිත ස්ථානයක තැන්පත් කර තැබිය යුතු වුවත් රෝහලේ ශල්‍යාගාරය හා හදිසි ප්‍රතිකාර අංශය සඳහා Patient warmer යන්ත්‍ර 02 ක් හා PBU හා MBCU ඒකක සඳහා Stethoscope (Neonatal) 14 ක් මිලදී ගැනීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනැතිව ලියන ලද එකතු වටිනාකම රු.1,800,655 ක්වූ චෙක්පත් 3 ක් ශල්‍ය ද්‍රව්‍ය ගබඩාවේ ඖෂධවේදී අත 2025 මැයි 28 දින තෙක් එනම් චෙක්පත ලියා මාස 05 කට අධික කාලයක් ගතවන තෙක් අවිධිමත්ව රඳවාගෙන තිබුණි.

(ii) Patient warmer යන්ත්‍ර සමඟ සපයා තිබුණු Patient Blanket අදාළ පිරිවිතරවලට නොගැලපෙන බව ජීව වෛද්‍ය ඉංජිනේරු විසින් වාචිකව දැනුම්දීම මත රඳවාගෙන සිටි රු.1,470,280 ක් වූ චෙක්පත් 2025 සැප්තැම්බර් 29 දිනෙන් පසු සැපයුම්කරු වෙත නිකුත්කර තිබුණද, යන්ත්‍ර සම්බන්ධ භෞතික විගණන පරීක්ෂාවන් සිදුකළ 2025 දෙසැම්බර් 17 වන විටත් යන්ත්‍ර සමඟ සැපයිය යුතු adult Patient Blanket 03 ක් සපයා නොතිබීම, පිරිවිතර අනුව රෝගියාගේ සම්පූර්ණ ශරීරය ආවරණය වන පරිදි උණුසුමට පැනිරිය යුතු වුවත් (The Blanket should be able to distribute warm air equally around the patient) සපයා තිබුණු adult Patient Blanket රෝගීන්ගේ සම්පූර්ණ ශරීරය ආවරණ කිරීමට ප්‍රමාණවත් නොවීම, ප්‍රමාණවත් පරිදි උණුසුම් නොවීම, උණුසුම ප්‍රමාණවත් පරිදි විහිදී නොයෑම වැනි ගැටළු සහගත තත්ත්ව පැවතුණි.

(iii) 2024 දෙසැම්බර් 31 දින සපයා රෝහල් ශල්‍ය ද්‍රව්‍ය ලේඛනයටද ඇතුළත් කර තිබුණු Stethoscope 14 දෝෂ සහිත බවට කිසිදු ලිඛිත වාර්තාවකින් තොරව නැවත සැපයුම්කරු වෙත ලබාදී ඒ සඳහා නව Stethoscope ලබා දෙන ලෙස දන්වා තිබුණද සැපයුම්කරු විසින් වෙනත් Stethoscope සැපයීමට නොහැකි වන බැවින් තමන් වෙත ලබාදුන් භාණ්ඩ ඇණවුම් අවලංගු කරන ලෙස 2025 ජූනි 24 දිනැතිව දන්වා තිබුණු බැවින්, භාණ්ඩ ඇණවුම් කිරීම හා චෙක්පත් ලිවීම සිදුකර මාස 6කට පමණ පසු 2025 ජූලි 07 දිනැතිව ගෙවීම් වටිනාකම රාජ්‍ය ආදායමට ගෙන තිබුණි. කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අසාර්ථක වීමෙන් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂාකර ගැනීම සඳහා රු. 28,000 ක කාර්යසාධන සුරක්ෂණය හෝ ලබාගෙන නොතිබුණි.

(iv) ජීව වෛද්‍ය ඉංජිනේරු වරයෙකුගෙන්ද සමන්විත 2024 ඔක්තෝබර් 05 දිනැති තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ද සාම්පල පරීක්ෂාවකින් හා අවශ්‍ය පිරිවිතර පරීක්ෂාවකින් තොරව රු.1,470,280 ක් වූ Patient warmer යන්ත්‍ර 02 ක මිලදී

ගැනීමට තීරණය කිරීම හේතුවෙන් පිරිවිතර වලට නොගැලපෙන යන්ත්‍ර සැපයුම්කරු විසින් සපයා තිබුණි.

(v) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 137 අනුව සැපයීම සම්බන්ධයෙන් වන අවස්ථාවලදී අනුමත කිරීමේ නිලධාරියා ඒවා පරීක්ෂාකොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බව සත්‍යාපනය සඳහා වගකිව යුතු අතර, මු.රෙ.138 (8) අනුව වවුචරය නිවැරදි සහ සෑම අතින්ම සම්පූර්ණ බව සහතික කරන නිලධාරියා වගකිව යුතු වුවද, ඒ පිළිබඳ අවධානය යොමු නොකර, විධිමත් භාණ්ඩ භාරගැනීමේ කමිටු වාර්තා ලබාගැනීමකින් තොරව අව්ධිමත් ලෙස Patient warmer යන්ත්‍ර හා Stethoscope මිලදී ගැනීම් වලට අදාළ රු. 1,800,655 ක ගෙවීම් සිදු කර තිබුණි.

(ඇ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහල මඟින් වායු සමීකරණ යන්ත්‍ර 11 ක් මිලදී ගැනීමට අදාළව 2024 වර්ෂය තුළ සිදුකළ ප්‍රසම්පාදන කාර්යයේදී ප්‍රතික්ෂේප කළ VOLTAS මාදිලියේ වායු සමීකරණ යන්ත්‍ර 2025 වර්ෂයේදී ප්‍රසම්පාදන කාර්යයේදී තෝරා ගැනීමට තීරණය කර 2024 වර්ෂයකට සාපේක්ෂව රු. 682,000 ක වැඩි මුදලක් සහිතව රු. 3,973,000 ක් වැයකර එම යන්ත්‍ර මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීම් කාර්යයන් දෙක සඳහාම තාක්ෂණික අවබෝධය සහිත නිලධාරියෙකුගෙන් සමන්විත විධිමත් තාක්ෂණික කමිටුවක් / ලංසු ඇගයීමේ කමිටුවක් පත්කර ඇගයීම් වාර්තාවක් ලබාගෙන නොතිබුණි. ප්‍රසම්පාදන කාර්යයන් දෙකෙහිම 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 හා 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.19 යන විධිවිධාන ප්‍රකාරව යම්න් පිළිවලින් රු.260,700 ක් හා රුපියල් 397,000 වටිනා කාර්යසාධන සුරක්ෂණ ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2020 වර්ෂයේ සිට 2025 දක්වා වර්ෂ 5 කට අධික කාලයක් මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ වායුසමීකරණ යන්ත්‍ර සේවා කිරීම වෙනුවෙන් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා එකම පෞද්ගලික ආයතනයක් තෝරාගෙන කාර්තුවකට රු.310,000 ක උපරිමයකට යටත්ව රු. 1,240,000 ක වාර්ෂික මුදලකට ගිවිසුම්ගතව කාර්ය ඉටුකර ගනිමින් පැවති අතර බොහෝ අවස්ථාවලදී තෝරාගත් සේවා සැපයුම්කරු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබීම, ප්‍රසම්පාදන තීරණ දැනුම්දීමේ දිනට පෙර ගිවිසුම්ගතවීම හා ගිවිසුම දිර්ඝ කර ගැනීමකින් තොරව මාස 1 ½ සිට මාස 2 ½ දක්වා කාලයක් සේවාව ඉටුකර ගැනීම වැනි තත්ත්වයන් මත නිසි තරහකාරිත්වයකට යොමු නොවී, විනිවිදභාවයකින් තොරව හා නිසි කාල සටහනකින් තොරව මෙම ප්‍රසම්පාදන කාර්යය සිදුකර තිබුණි.

(ඉ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ අතිරේක විදුලි පහන් සවිකිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) රෝහලේ විදුලි පහන් නොමැති ස්ථානවල අතිරේක විදුලි පහන් සවිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම (බදු රහිතව) රු.මිලියන 23.68 ක් වුවද රෝහල් ප්‍රසම්පාදන කමිටුව විසින් රු.132,160 ක් වැයකර භාෂා ත්‍රිත්වයෙන්

පළකර තිබුණු පුවත්පත් දැන්වීම්වල අපරික්ෂාකාරී ලෙස/ දෝෂ සහගත ලෙස ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 21කින් අඩුවෙන් එනම් රු.මිලියන 2.68 ක් ලෙස ප්‍රසිද්ධ කිරීම හේතුවෙන් උනන්දුවක් දක්වන සාරානුකූලව ප්‍රතිචාර දැක්විය හැකි කොන්ත්‍රාත්කරුවන් අධෛර්යමත් වීමෙන් නිසි තරඟකාරීත්වය අහිමිවී තිබුණි.

(ii) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සමඟ භාවිතා කළයුතු ප්‍රසම්පාදන අත්පොතේ 9.1 (ඇ) ප්‍රකාරව කොන්ත්‍රාත්තුවක පිරිවිතර මෙන්ම එකඟ වූ අනෙකුත් කොන්දේසි අනුගමනය කරමින් කාර්යය ඉටු කර ඇති බවට සහතික වීමෙන් අනතුරුව අතුරු ගෙවීම් සඳහා නිම වූ වැඩ සහතික කිරීම ඉංජිනේරුවරයාගේ/ උපදේශකවරයාගේ/ තාක්ෂණික නිලධාරියාගේ කාර්යය වුවද, 2025 දෙසැම්බර් 31 දින වන විට විදුලි පහන් කණු සිටුවීම සඳහා සකස් කළයුතු ස්ථාන 44 කින් ස්ථාන 04 ක වලවල් 07ක් පමණක් සකසා තිබියදී මෙම ව්‍යාපෘතියට අදාළව පළමු අතුරු බිල්පත සඳහා එදිනට ඉටුකළ වැඩ වටිනාකම රු.2,985,020 ක් ලෙස සාවද්‍යව සහතික කර තිබුණි.

(ඊ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ කසල කළමනාකරණ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සමඟ භාවිතා කළයුතු ප්‍රසම්පාදන අත්පොතේ 9.2 (අ) හා (ආ) හි විධිවිධාන පරිදි කටයුතු නොකිරීම මත, මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ කසල කළමනාකරණ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත් කාර්යයන් 02 හි පළමු කාර්යයේ රු.1,101,500 ක එනම් මූලික කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 13 ක් පමණ වූ වැඩ කොටස් සම්පූර්ණයෙන් ඉටු නොකර අත්හැර දමා තිබුණු අතර, දෙවන කොන්ත්‍රාත් කාර්යයේ අතිරේක වැඩ (Extra Works) හා අමතර වැඩ ලෙස රු.1,911,882 ක් එනම් මූලික කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 22 ක් පමණ මුළු විචලනයන් පැවතුණි.

(ii) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.2 හා ප්‍රසම්පාදන අත්පොතේ 9.2 ප්‍රකාරව කොන්ත්‍රාත්වල ඇතිවන විචලනයන් සඳහා අනුමැතිය ලබා ගත යුතු වුවද, දෙවන කොන්ත්‍රාත් කාර්යයේ (Renovation and Rain water drain and Landscaping work in waste store) මූලික කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 22 ක් හෙවත් රු. 1,911,882 ක කොන්ත්‍රාත් විචලනයන් සඳහා එම විධිවිධාන පරිදි කටයුතු කර අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(iii) භෞතික විගණන පරීක්ෂාවේදී පළමු කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් අයිතම අංක 2.1 යටතේ ගඩොල් වැඩ වර්ග මීටර් 272.21ක් සඳහා රු.707,746ක් ගෙවා තිබුණද එම කොටස් නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවීම හේතුවෙන් ස්ථාන 06කින් පමණ ඉහල සිට පහලට පුපුරා තිබුණි. පළමු හා දෙවන කොන්ත්‍රාත්තුවේ

(Concrete Work) සඳහා රු.4,757,940 ක් ගෙවීම් කර තිබුණද කිසිදු අවස්ථාවක තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගෙන ගුණත්වය තහවුරු කරගෙන නොතිබුණි.

(iv) දෙවන කොන්ත්‍රාත් කාර්යයට අදාළ අවසන් බිල්පත් අයිතම අංක 7.1 යටතේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇතිරීම (Interlock Blocks) වර්ග මීටර් 167.04 ක් සඳහා රු.780,077 ක්, අයිතම අංක 6.1 යටතේ එහි පාදම සෑදීම සඳහා ABC මිශ්‍රණය සන මීටර් 25.06 ක් සැපයීම වෙනුවෙන් රු.115,276 ක් හා අයිතම අංක 6.2 යටතේ ABC මිශ්‍රණය ප්‍රවාහනය සඳහා රු.81,194 ක් ගෙවීම් කර තිබුණු අතර අන්තර් සම්බන්ධිත කුට්ටිගල්වල ගුණත්වය සහතික කිරීම සඳහා සෑම ඒකක 800 ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් සම්පීඩන ශක්ති පරීක්ෂණ (Compressive Strength Test) වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, දළ වශයෙන් අන්තර් සම්බන්ධිත කුට්ටිගල් 8018 ක් පමණ සපයා තිබුණද, ඒ සඳහා වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(v) 2026 ජනවාරි 07 සහ 08 යන දෙදින තුළ සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී ලබාගත් මිනුම් අනුව අන්තර් සම්බන්ධිත කුට්ටිගල් යොදා ඇති කොටසේ ප්‍රමාණය වර්ග මීටර් 167.04ක් ද ABC කැටගල් ස්ථරයේ සාමාන්‍ය ඝනකම මි.මී.85ක් ද වූ බැවින් ගණිතා කර ඇති ABC කැටගල් පරිමාව සන මීටර 14.2ක් වුවද අවසන් බිල්පත් අයිතම අංක 7.1, 6.1 හා 6.2 අනුව සන මීටර 25.06ක් සඳහා රු.115,276 ක් ගෙවීම් කිරීම හේතුවෙන් සන මීටර 10.86ක් සඳහා රු.49,956 ක අධි ගෙවීමක් හා එම ප්‍රමාණය ප්‍රවාහනය සඳහා රු.14,661ක ප්‍රවාහන ගාස්තු අධි ගෙවීමක් ලෙස එකතු වටිනාකම රු.64,617 ක අධි ගෙවීමක් පැවතුණි.

(vi) පළමු කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු වැඩ විෂයය අංක 9.1 යටතේ අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇතිරීම සඳහා (Paving Interlock blocks) වර්ග මීටරයක් සඳහා රු.4,200ක ලංසුවක් ඉදිරිපත් කර තිබියදී එම කොටස ඉටු නොකර අතහැර දමා තිබුණු අතර, පසුව එම වැඩ විෂය දෙවන කොන්ත්‍රාත් කාර්යයට ඇතුළත් කර වර්ග මීටර 167.04 ක් නිම කිරීම වෙනුවෙන් අවසන් බිල්පත් අයිතම අංක 7.1 යටතේ වර්ග මීටරයක් සඳහා රු.4,670 බැගින් රු.780,077 ක් ගෙවීම් කර තිබුණි. එකම කොන්ත්‍රාත්කරු වෙතින් පළමු කොන්ත්‍රාත් කාර්යයේදී එකහ වූ මිලට වඩා රු.470 කින් වැඩි රු.4,670 ක මිලක් මත දෙවන කොන්ත්‍රාත් කාර්යයේදී වැඩ විෂය ඉටුකරවා ගැනීම තුළින් වර්ග මීටරයක් සඳහා රු.470 බැගින් රු.78,509 ක පාඩුවක් රජයට සිදුකර තිබුණි.

(vii) අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇතිරීමේදී පාදමෙහි යොදා ඇති ABC කැටගල් ස්ථරයේ සාමාන්‍ය ඝනකම මි.මී.150ක් ලෙස මිණුම්පත්වල දක්වා තිබුණද, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ මාතලේ දිස්ත්‍රික් මහ රෝහලට අනුයුක්ත තාක්ෂණ නිලධාරියෙකු සමඟ සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී පාදමෙහි යොදා තිබුණු ABC කැටගල් ස්ථරයේ සාමාන්‍ය ඝනකම

මී.මී.85ක් බව තහවුරු විය. එසේම ABC මිශ්‍රණය සුසංහසනය කර නොමැති බවත් මේ සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගෙන නොමැති බවත් තහවුරු විය.

(viii) දෙවන කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් අයිතම අංක 7.3 හි Unforeseen Work යටතේ වූ SSR 03 හා SSR 07 සඳහා ඉදිරිපත් කර තිබුණු පිළිවෙලින් රු.110,000ක හා රු.247,500ක වටිනාකම් සහිත පෞද්ගලික ආයතනයේ බිල්පත් එම ආයතනයෙන් සම්පූර්ණ කර ලබා දුන් ඒවා නොවන බවත් එම ආයතනයෙන් හිස් බිල්පත් ලබා දී ඇති බවත් නිරීක්ෂණය වූයෙන් අවිධිමත් ලෙස හිස් බිල්පත් ලබාගෙන අවශ්‍ය වටිනාකම් සඳහන් කර අවසන් බිල්පතට ඇතුළත් කර ඇති බැවින් රු.358,500 ක් ගෙවීමේ නිරවද්‍යතාවය විගණනයේදී පිළිගත නොහැකි විය.

(ix) මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ විදුලි පහන් නොමැති ස්ථානවල අතිරේක විදුලි පහන් සවිකිරීමේ හා කසල කළමනාකරණ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති දෙක සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයට පිළිවෙළින් රු.919,059 ක් හා රු.483,085 ක් වශයෙන් රු.1,402,144 ක් උපදේශන හා අධීක්ෂණ සේවා වෙනුවෙන් ගෙවීම් කර තිබුණ ද, ප්‍රමාණවත් උපදේශනයක් හා අධීක්ෂණයක් නොමැති වීම හේතුවෙන් ඉහල කොන්ත්‍රාත් විවලනයන් පැවතීම, ඉදිකිරීම් අඩුපාඩු හා අධි ගෙවීම් සිදුවීම මෙන්ම විනිවිදභාවයෙන් තොර ගෙවීම් සිදුව තිබුණි.

(උ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහල් රසායනාගාරය සඳහා උපකරණ මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යයන් 3ට අදාළ ලංසු ලේඛනවල CC 15.1.iii.(අ) අනුව එකඟ වූ කාල සීමාව තුළ සැපයුම්කරුට භාණ්ඩ සැපයීමට නොහැකි වුවහොත්, උපරිම වශයෙන් සියයට දහයක (10%) ක් ප්‍රමාද ගාස්තු ලෙස අයකරනු ලබන බව දක්වා තිබුණද එකඟ වූ කාලසීමාව ඉක්මවා සති 4 සිට 12 දක්වා කාල ප්‍රමාදයකින් යුතුව ඇනවුම් කළ උපකරණ සපයා තිබියදී එකතු වටිනාකම රු.651,376 ක් වූ ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ ලබා දීමේ වැය විෂයයෙන් රු.මිලියන 7.6 ක ඖෂධ ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙතින් සෘජුවම මිලදී ගෙන ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාව සඳහා ලබාදී තිබුණි.

(එ) කුරුණෑගල ශික්ෂණ රෝහල විසින් 2024 ජූනි සිට 2025 මැයි දක්වා වූ මාස 12 ක කාල පරිච්ඡේදයට අදාළව පිළියෙල කර තිබුණු අමු ආහාර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 280.44 ක් වුවද. එම කාල පරිච්ඡේදයට අදාළව මිලදී ගෙන තිබුණු අමු ආහාර සඳහා දරන ලද තත්‍ය වියදම රු. මිලියන 171.45 ක් වීමෙන් රු. මිලියන 108.98 ක විවලනයක් නිරීක්ෂණය විය. මේ අනුව නිවැරදි ඇස්තමේන්තු පිලියෙල නොකිරීම හේතුවෙන් තරහකාරී ලංසු කැඳවීම මඟින් රජයට ලබා ගැනීමට තිබුණු ආර්ථිකමය වාසිය අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

(ඒ) කුරුණෑගල ශික්ෂණ රෝහලෙහි ප්‍රධාන පල්දෝරු පද්ධතියේ පැරණි මෝටර් 02 ඉවත්කර නව මෝටර් (Sewage Submersible Pump) 02 ක් (8.5 KW ක ධාරිතාවයෙන් යුතු) සහ එම මෝටර් දෙක ක්‍රියාත්මක කළ හැකි Pump Panel දෙකක් සපයා, සවිකර, ක්‍රියාත්මක කර පෙන්වා නඩත්තු කිරීම (Supply, Installation, Testing, Commissioning & Maintenance) වෙනුවෙන් 2022 දෙසැම්බර් 21 දින රු. මිලියන 8.80 ක VAT රහිත මිලකට රෝහල කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම මෝටර් දෙක 2023 ජනවාරි සවිකර මාසයක් පමණ කාලයක් තුළදී අසාමාන්‍ය ශබ්දයක් හා කම්පන තත්ත්වයක් ඇති වීම මත එදින සිට 2025 දෙසැම්බර් 31 වන විගණිත දිනය දක්වාම එක් මෝටරයක් පමණක් යොදා ගනිමින් රෝහලේ පල්දෝරු කටයුතු සිදුකරනු ලබයි.

(ii) මෙම නව අපජල පොම්ප දෙකෙහි නිතර අවහිරවීම් සිදුව තිබීම හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) පරීක්ෂා කර පල්දෝරු පද්ධතියේ පවත්නා T සම්බන්ධතාව මත අපද්‍රව්‍ය තැන්පත් වී ඇති බව නිරීක්ෂණය කර තිබුණි. මේ හේතුවෙන් එක් මෝටරයක් පැය 817 ක්ද, අනෙක් මෝටරය පැය 23 ක්ද, ලෙස ක්‍රියාත්මක කර තිබුණු අතර නියමිත ප්‍රමිතියෙන් ක්‍රියා කිරීමට හැකි වුවහොත් ඵලදායී ජීවිත කාලය වසර 10 ත් 15 ත් අතර බව වාර්තා කර තිබුණි. Y සම්බන්ධතාවයක් ප්‍රතිස්ථාපනය මඟින් නිසි ක්‍රියාකාරිත්වයක් සහතික කරන තුරු මුළු ප්‍රසම්පාදන වටිනාකමින් සියයට 90 ක මුදලක් ගෙවන ලෙස නිර්දේශ කර 2024 අගෝස්තු 31 දින VAT සහිතව රු. මිලියන 9.34 ක මුදලක් අදාළ ප්‍රසම්පාදනය වෙනුවෙන් ගෙවීම් කර තිබුණුද 2026 මාර්තු 13 විගණිත දිනවන විටද එකී Y සම්බන්ධතාවය ප්‍රතිස්ථාපනය කර පල්දෝරු පද්ධතියේ නිසි ක්‍රියාකාරිත්වය තහවුරු කර නොතිබුණි. මෙහිදී සපයා, සවිකර, ක්‍රියාත්මක කර පෙන්වා නඩත්තු කිරීම (Supply, Installation, Testing, Commissioning & Maintenance) වෙනුවෙන් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතවී තිබුණද, එක් මෝටරයක් පමණක් ක්‍රියාත්මක කරමින් පවතින අවස්ථාවක මුළු වටිනාකමින් සියයට 90 ක මුදලක් ගෙවීමට නිර්දේශ කර තිබුණි.

(ඔ) මහරගම අපේක්ෂා රෝහල හා ඊට අයත් රසායී ගොඩනැගිලි සංකීර්ණය පිරිසිදුකිරීමේ කොන්ත්‍රාත්තුව 2024/2025 වර්ෂය සඳහා වාර්ෂික පිරිවැයෙහි එකතුව රු. මිලියන 150.91කට ද 2025/2026 වර්ෂය සඳහා වාර්ෂික පිරිවැය රු.මිලියන 159.34කට ද පෞද්ගලික සමාගමක් වෙත පිරිනමා තිබුණි. පිරිසිදුකිරීමේ සේවා සපයා ගැනීම හා ඒ වෙනුවෙන් යොදාගනු ලබන රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2025/2026 වර්ෂයට අදාළ කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය අනුව රෝහල හා රසායී ගොඩනැගිල්ල සඳහා පිළිවෙලින් සේවකයින් 125ක් 55ක් වන පරිදි දිනකට පැය 09 සේවය සඳහා වැඩ පරීක්ෂකයින් 09ක්ද කම්කරුවන් 171දෙනෙකුද සේවයේ යෙදවිය යුතුය. ඒ අනුව රසායී ගොඩනැගිල්ල ඇතුළු රෝහලේ පිරිසිදු කිරීමේ සේවා සඳහා වැඩ පරීක්ෂකයින් 07දෙනෙකු සහ කම්කරුවන් 131දෙනෙකු දිවා

සේවා මුරය වෙනුවෙන්ද වැඩ පරීක්ෂකයින් 02දෙනෙකු සහ කම්කරුවන් 40දෙනෙකු රාත්‍රී සේවා මුරය වෙනුවෙන්ද සේවයේ යෙදවිය යුතුව තිබුණි. 2025 ඔක්තෝබර් 07 දින විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවට අනුව එම සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සනාථ කෙරෙන ලේඛනයෙහි එදින දිවා සේවා මුරය වෙනුවෙන් සේවයට පැමිණි ලෙස කම්කරුවන් 124 දෙනෙකු අත්සන් යොදා තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය පරිදි දිනකට සේවයේ යෙදවිය යුතු සේවකයින් 07දෙනෙකු සේවයේ යොදවා නොතිබුණු අතර සේවයට පැමිණි බවට ලේඛනයේ අත්සන් තබා තිබුණු සේවකයින්ගෙන් තෝරාගත් සේවකයින් 18 දෙනෙකු පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී ඉන් සේවකයින් 11දෙනෙකු සේවයේ යෙදී නොසිටි බව අනාවරණය විය. ඒ අනුව සාවද්‍ය ලෙස අත්සන් යොදා වැඩි සේවක සංඛ්‍යාවක් පෙන්වා අදාළ ආයතනය විසින් අයථා ලෙස මුදල් ලබාගැනීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) රෝහල් නිලධාරීන් විසින් 2025 වර්ෂයේ මාර්තු, අප්‍රේල් හා මැයි මාසයන්හි අපේක්ෂා රෝහලට අදාළව ස්ථානීය පරීක්ෂණ 03ක් හා රසායනාගාරයට අදාළව ස්ථානීය පරීක්ෂණ 03ක් සිදුකර තිබුණු අතර එම දිනයන්හිදී රෝහලට අදාළව සේවයට පැමිණි ලෙස අත්සන් තැබූ සේවකයින් 24ක්, 19ක් හා 18ක් හා රසායනාගාරයට අදාළව සේවකයින් 6ක්,3ක් හා 8ක් වශයෙන් සේවයේ යොදවා නොතිබුණි. රෝහල විසින් එම දිනයන්ට අදාළව දිනක සේවක වැටුප් හා දඩ අයකර තිබුණද සත්‍ය වශයෙන් සේවය නොකරන සේවකයින් නිශ්චිතව හඳුනාගෙන එම සේවකයින් ඉවත් කර වැටුප් ගණනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එසේම පරීක්ෂාවට භාජනයවී ඇති දිනයන්හි සේවක නොපැමිණීම් හා සේවයේ නොයෙදවීම් සලකා බලනවිට සේවක පැමිණීමේ ප්‍රතිශතය සියයට 90ට වඩා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය වන අතර ඒ අනුව ලංසු කොන්දේසි 8.6 අනුව වැඩකරන සත්‍ය සේවක අනුපාතය මත පොදුකාර්ය පිරිවැයෙහි අනුපාතික ප්‍රමාණය ගණනය කර ගෙවීම් සිදුකිරීමට කටයුතු කළ යුතු වුවද එසේ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම මෙම ආයතනය දිගින් දිගටම අවම සේවක පිරිසක් යොදවා පවිත්‍රතා සේවාව පවත්වා ගෙන ගොස් තිබීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ගුණාත්මක සේවාවක් රෝහලට ලැබී නිබෙද යන්න විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(iii) 2025 ජුනි දක්වා ආසාදන පාලන නිලධාරී විසින් ලබාදී තිබුණු වාර්තා අනුව සේවා ආයතනය SLS හෝ වෙනත් ප්‍රමිතියක් පිළිබඳ සඳහනක් නොමැති රසායන ද්‍රව්‍ය (TCL නමැති රසායනික ද්‍රව්‍ය හැර) ලබාදී තිබුණි. 2024 පෙබරවාරි මස පරීක්ෂණ සඳහා යොමුකර තිබුණු රසායනික ද්‍රව්‍ය 09ක් සම්බන්ධ ප්‍රමිතිය පරීක්ෂාවේදී ඉන් රසායනික ද්‍රව්‍ය 06ක්ම ප්‍රමිතියේ පරාමිතික අගයන්ට අනුකූලව නොතිබුණු බව 2024 මැයි 16 දිනැති අංක ටීඑවඕ/බී/එමඒඑව/2023/ඒකිව-04 දරන විගණන විමසුම මඟින් පෙන්වා දී තිබියදී 2025 ජුනි දක්වා රසායන ද්‍රව්‍යම භාවිතය සඳහා යොදාගෙන තිබුණි. සපයන ලද රසායන ද්‍රව්‍යවල ඇසුරුමෙහි රසායනික සංයුතිය පිළිබඳ විස්තර හා SLS ප්‍රමිතිය ඇති බවට අන්තර්ගත නොවීම හේතුවෙන් රෝහල

විසින් 2025 පෙබරවාරි සිට ජූනි දක්වා වූ කාලය තුළ ගෙවීම් තාවකාලිකව අත්හිටුවා තිබුණද එම රසායන ද්‍රව්‍ය භාවිතයට ගෙන තිබුණු බැවින් පසුව ගෙවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ප්‍රමිතියෙන් තොර රසායන ද්‍රව්‍ය භාවිතය තුළින් රෝහල අපේක්ෂා කරන ලද සෞඛ්‍ය ආරක්ෂාව නිසි පරිදි ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) 2024/2025 වර්ෂයේ සේවා කොන්ත්‍රාත්තුවට අදාළව එළඹ තිබුණු ගිවිසුමේ 12.6 වගන්තිය අනුව රෝහල් අධ්‍යක්ෂවරයා තීරණය කරන පරිදි භාවිතා කරන රසායන ද්‍රව්‍ය එකහ වූ නියමිත ප්‍රමිතිය, රසායනික සංයුතිය සහිත රසායන ද්‍රව්‍ය බවට ITI ආයතනය වෙතින් තහවුරු කරවාගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා කටයුතු කරනු ලැබිය හැකි අතර එලෙස තහවුරු කිරීම සඳහා වන වියදම් කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතුය. එසේම ලංසු කොන්දේසි 1 අනුව කොන්ත්‍රාත්කරු විසින් නියමිත ප්‍රමිතියට අනුකූලව රසායනික ද්‍රව්‍ය සපයනු ලබන බවට රෝහල් පරිපාලනය විසින් තහවුරු කර ගත යුතු අතර සැපයීම් තුළදී ද අවස්ථානුකූලව ප්‍රමිතිය පිළිබඳ තහවුරු කරගැනීමක් වරින් වර සිදුකළ යුතුය. යථෝක්ත වර්ෂයට අදාළව 2024 දෙසැම්බර් 19 දින රසායනික ද්‍රව්‍ය සාම්පල 09ක් රසායනික හා බැක්ටීරියානුවෙදී තත්ත්ව වාර්තාවක් ලබාගැනීම සඳහා ITI ආයතනය වෙත භාරදී තිබුණද ඇස්තමේන්තුගත පිරිවැය රු.273,702ක් වූ පරීක්ෂණ ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ආයතනය සමඟ ඇතිවූ ගැටළුවක් මත එය ඉටුවී නොතිබුණු අතර ඉදිරිපත් කළ සාම්පල ආපසු ගෙන්වාගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද 2024/2025 වර්ෂයට අදාළව රසායනික ද්‍රව්‍ය පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව ප්‍රමිතිය තහවුරු කරගැනීමකින් තොරව එම කාලසීමාව තුළ රසායනික ද්‍රව්‍ය වෙනුවෙන් රු.මිලියන 25.03ක් ගෙවීම් කර තිබුණි.

(v) වසර 20කට වැඩි කාලයක් තිස්සේ රෝහලේ පවිත්‍රතා සේවා සැපයීම මෙම ආයතනය මඟින් සිදුකර තිබුණි. පවිත්‍රතා සේවාව සම්බන්ධයෙන් රෝහල් අධ්‍යක්ෂ විසින් 2025 මාර්තු 25 දිනැතිව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) වෙත යොමුකල ලිපියකට අනුව රෝහල තුළ තාවකාලික අනවසර ඉදිකිරීම් සිදුකර කම්කරුවන් ඒවායේ පදිංචි වී සිටීම, විෂබීජ නාශක ප්‍රමිතියෙන් තොරවීම, පිරිසිදු කාරක ද්‍රව්‍යයන්හි ක්‍රියාකාරී සංයෝග, තිබිය යුතු ප්‍රතිශතය හා නිර්දේශිත බර අඩංගු වී නොතිබීම, පිරිසිදු කිරීම නියමිත පරිදි සිදුනොවීම, පිරිසිදු කිරීමට අපහසු ශාරීරික දුර්වලතා ඇති කම්කරුවන් හා ආබාධිත අය සේවයේ යෙදවීම, සුපරීක්ෂකවරුන් සඳහා පිරිසිදු කිරීම පිළිබඳ දැනුම, පළපුරුද්ද හා නිසි පුහුණුවක් නොතිබීම සහ සේවයේ යෙදවිය යුතු කම්කරුවන් සංඛ්‍යාව සේවයේ නොයෙදවීම ආදී අඩුපාඩු පවතින බව දක්වා තිබුණද 2025/2026 වර්ෂය සඳහාද මෙම ආයතනය තෝරාගැනීමට කටයුතු කර තිබුණි.

(ඔ) මහරගම අපේක්ෂා රෝහලේ කසල කළමනාකරණය පිළිබඳ විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්යය ඉටුකිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය හා පුද්ගලික සමාගමක් අතර ඇතිකරගත් ත්‍රෛයිපාර්ශ්වික ගිවිසුම ප්‍රකාරව සමාගම විසින් බැහැර කරනු ලබන සායනික අපද්‍රව්‍ය කිලෝග්‍රෑමයක් සඳහා අයකරනු ලබන මිල තුළ එම අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අවශ්‍යවන බෑග් සහ පෙට්ටි (Disposable Bags and boxes) සැපයීම සඳහා වූ මිලක්ද ඇතුළත්ව තිබුණද සේවා සපයනු ලබන රෝහල් වෙත ගිවිසුම ප්‍රකාරව බහාලුම් සැපයීමට අදාළ සමාගම කටයුතු කර නොතිබුණි. ඒ අනුව රෝහල සඳහා අවශ්‍යවන බහාලුම් බාහිරින් මිලදීගැනීමට සිදුවී තිබුණි. මේ හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2022 දක්වා වූ කාලසීමාව තුළ නොසපයන ලද බහාලුම් වෙනුවෙන් අපේක්ෂා රෝහල විසින් අදාළ සමාගම වෙත වැඩිපුර ගෙවන ලද රු. මිලියන 20.77කින් 2024 වර්ෂය තුළ රු.මිලියන 8.86ක මුදලක් අයකර තිබුණු අතර රු. මිලියන 11.91ක් විගණිත දිනය වූ 2025 ජූලි 22 දින වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ii) කෙසේ වුවද සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් විගණන විමසුමට අදාළව ලබාදුන් පිළිතුරට අනුව අදාළ සමාගම විසින් රු.මිලියන 11.79ක වට්නාක සහිත බහාලුම් ප්‍රමාණයක් සපයා ඇති බවත් ඒ අනුව රෝහලට අයවිය යුතු මුදල රු.මිලියන 8.98 ක් පමණක් බවත් මින් රු.මිලියන 8.85ක මුදලක් අයකරගෙන ඇති බැවින් තවදුරටත් අයකරගත යුතු මුදල රු.127,397ක් බව පමණක් දක්වා ඇත. එසේ වුවද රෝහල වෙත අපද්‍රව්‍ය බහාලුම් ලැබුණු බවට ගබඩා තොග පොත්වල තොරතුරු ඇතුළත්ව නොතිබුණු අතර වෙනත් පිළිගතහැකි තහවුරු ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තව ද 2023 වර්ෂයේ සිට නොසැපයූ බහාලුම් වෙනුවෙන් අදාළ සමාගම වෙත වැඩිපුර ගෙවන ලද මුදල කොපමණද යන්න විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ක) මහරගම අපේක්ෂා රෝහලේ ඉදිකිරීම් හා අළුත්වැඩියා කොන්ත්‍රාත් ලබාදීම සම්බන්ධ පරීක්ෂාවෙදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) සමඟ 1991 වර්ෂයේ එළඹ තිබුණු ගිවිසුමකට අනුව ඉදිකිරීම ව්‍යාපෘති සඳහා වූ උපදේශන කාර්යයන් තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව ඉටුකිරීමට එම කාර්යාංශය වෙත පවරා තිබුණි. ඒ අනුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය අපේක්ෂා රෝහලේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් උපදේශක ලෙස ලංසු ලේඛන පිළියෙල කිරීම, ලංසු ලේඛන ඇගයීම, කොන්ත්‍රාත්කරු හා රෝහල අතර සම්බන්ධීකරණය, කාලය දීර්ඝ කිරීමට අදාළ නිර්දේශ ලබාදීම, අතිරේක වැඩ සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, ඉදිකිරීම් වැඩ පිළිබඳ සහතික වීම, අවසන් බිල්පත සහතික කොට ඉදිරිපත් කිරීම දක්වා වූ සියලු කාර්යයන් සඳහා සෘජු මැදහත්වීමක් සිදු කරනු ලබන බව නිරීක්ෂණය වූයෙන් ප්‍රසම්පාදන අස්ථිත්වය වෙනුවෙන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ කාර්යභාරය සීමා වී තිබුණු බව නිරීක්ෂණය විය. තවද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ) සහ (ආ) පරිදි

ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල තාක්ෂණික ඇගයීම් කමිටුවට තම අවශ්‍යතාවය මත බාහිර උපදේශකයෙකුගේ සහය ලබාගත හැකි අතර, එසේ ඉටුකරනු ලබන සේවාවන් එම තාක්ෂණික ඇගයීම් කමිටුවේ මාර්ගෝපදේශකත්වය සහ අධීක්ෂණය යටතේ සිදුවිය යුතු බවත්, ලංසු කැඳවීමේ ලේඛන සමාලෝචනය කොට අනුමත කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව ක්‍රියා කළ යුතු බවත් සඳහන් වුවද ඒ අනුව කටයුතු නොකර එම කාර්යයන් ද බාහිර උපදේශක ලෙස කටයුතු කරන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් සිදුකරන බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් එම කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වූ ගනුදෙනුවල විනිවිදභාවය හා අභ්‍යන්තර පාලනය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

(ii) අපේක්ෂා රෝහල විසින් මිල ගණන් කැඳවන ලද බොහෝමයක් කොන්ත්‍රාත් වැඩ සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා මිල ගණන් ඉදිරිපත් වීම හේතුවෙන් කොන්ත්‍රාත් අවලංගු කිරීමටත්, ඇස්තමේන්තු සංශෝධනය කර නැවත මිල ගණන් කැඳවීමටත් සිදුවී තිබුණු අතර එකම කොන්ත්‍රාත් වැඩය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය නැවත නැවත ක්‍රියාත්මක කිරීමට සිදුවීමත්, ඒ මත වෙළඳපොල මිල ගණන් ඉහලයාමෙන් වැඩි පිරිවැයක් දැරීමට සිදුවීමත්, වැඩ ඉටුකිරීම ප්‍රමාදවීමත් නිරීක්ෂණය විය. එසේම කොන්ත්‍රාත් වැඩවලට අදාළව ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් සීමිත වීම හේතුවෙන් තරහකාරී මිලගණන් ඉදිරිපත් වීම සීමාවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඛ) මහරගම අපේක්ෂා රෝහලේ ඉදිකිරීම් හා අළුත්වැඩියාවලට අදාළ සුළු කොන්ත්‍රාත් පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වාර්ෂිකව සුළු කොන්ත්‍රාත් වැඩ සැලකිය යුතු ප්‍රමාණයක් රෝහල තුළ ක්‍රියාත්මක කරනු ලබන අතර සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ මූල්‍ය පාලන බලතල ප්‍රකාරව 2022 හා 2023 වර්ෂයන් සඳහා රු.300,000 ක් සහ 2024 හා 2025 වර්ෂයන් සඳහා රු.500,000 දක්වා වූ සීමාවන් යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයෙන් (CECB) හෝ තාක්ෂණික නිලධාරී වෙතින් ලබාගත් ඇස්තමේන්තුව පාදක කරගනිමින් එම ඇස්තමේන්තුගත වටිනාකමට ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත සෘජුවම කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. මේ හේතුවෙන් තරහකාරීත්වය තුළින් ලබාගතහැකිව තිබුණු වාසි සහගත තත්ත්වයන් රෝහලට ලබාගැනීමට නොහැකිවී තිබුණි.

(ii) මූල්‍ය පාලන බලතල පැවරීම් වක්‍රලේඛයේ 15.2 ඡේදය ප්‍රකාරව විදුලිය, ජලය, වැසිකිලි පද්ධති, වහලය හා ගොඩනැගිලි සම්බන්ධ ඉතා හදිසි තත්ත්වයේ සුළු කොන්ත්‍රාත් පමණක් ඉහත සීමාවන් යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත ලබාදීමේ හැකියාවක් පැවතියද 2022 වර්ෂයේ සිට 2025 දක්වා ඉටුකරවාගෙන තිබුණු කාර්යයන් පරීක්ෂා කිරීමේදී ඉතා හදිසියේ ඉටුකළ යුතු නොවන තීන්ත ආලේප කිරීම, වාහන රථගාල් ස්ථාපිත කිරීම සහ බිත්ති කඩඩ සෑදීම වැනි කාර්යයන්ද ප්‍රසම්පාදන

ක්‍රියාවලියෙන් බැහැරව ඇස්තමේන්තු වටිනාකමට කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදී තිබුණු බව නිරීක්ෂණය වූයෙන් තරහකාරිත්වය තුළින් ලබාගත හැකිව තිබුණු ආර්ථික වාසි අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) රෝහල විසින් සිදුකරන ලද සුළු කොන්ත්‍රාත් සම්බන්ධයෙන් විගණනය වෙත ඉදිරිපත් කරන ලද ලේඛනය අනුව 2022 වර්ෂයේ සිට 2025 අගෝස්තු දක්වා වූ කාලසීමාව තුළ ඇස්තමේන්තුගත වටිනාකම රු.81,054,853ක් වූ සුළු කොන්ත්‍රාත් 690ක් ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත ලබාදී තිබුණු අතර එම කොන්ත්‍රාත්වලින් 522ක් එනම් සියයට 75කට වැඩි ප්‍රමාණයක් ඉටුකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය දායක වී තිබුණි. ඒ අනුව රෝහලේ සිදුකරනු ලබන සුළු කොන්ත්‍රාත්වලින් වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ සිට සියළුම කාර්යයන් පිළිබඳ සෘජු දායකත්වයක් එම ආයතනය විසින් දරනු ලබන බවට නිරීක්ෂණය වූ අතර ඒ සඳහා මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10ක ගාස්තුවක් අයකර තිබුණි. රෝහලට අනුයුක්තව තාක්ෂණික නිලධාරියෙකු පත්කර සිටියදී සුළු කොන්ත්‍රාත් සම්බන්ධ කටයුතුද මෙම ආයතනය වෙත පවරා ඉටු කරවා ගෙන තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. මේ හේතුවෙන් උපදේශක ගාස්තු ලෙස 2022 වර්ෂයේ සිට 2025 අගෝස්තු මාසය දක්වා වූ කාලසීමාව වෙනුවෙන් වැය කළ මුදල (වැට් බදු සහිතව) රු.4,074,948ක් විය.

(iv) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය විසින් සකස්කළ ඇස්තමේන්තු මිල ගණන් මත සුළු කොන්ත්‍රාත් වැඩ සම්පූර්ණ කිරීම ඇතැම් කොන්ත්‍රාත්කරුවන් ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය වූ අතර 2022 වර්ෂයේ සිට 2024 දක්වා එසේ කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රතික්ෂේප කර ඉටු නොකරන ලද සුළු කොන්ත්‍රාත් 145කට අදාළව එම ආයතනය වෙත රු.1,079,710ක මුදලක් උපදේශන ගාස්තු ලෙස ගෙවීමට සිදුව තිබුණි.

(v) සුළු අලුත්වැඩියා හා නඩත්තු කටයුතු වෙනුවෙන් තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් වෙත කොන්ත්‍රාත් පිරිනැමීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) මාර්ගෝපදේශය පරිදි රු.250,000 ඉක්මවන වැඩ සම්බන්ධයෙන් කාර්යය නිම කළ යුතු දිනය හා අනෙකුත් කොන්දේසි ඇතුළත් විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු වුවද ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණු අතර බොහෝ සුළු නඩත්තු කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත් ප්‍රදානය කර දීර්ඝ කාලයක් ගතවී ඇතත් ඒවා ඉටුකර නොතිබුණි.

(vi) සුළු කොන්ත්‍රාත් සම්බන්ධයෙන් හැකිතරම් දුරට රෝහල් විසින් නඩත්තු ඒකක පිහිටුවීමටත් සුළු අළුත්වැඩියාවන් ඒ තුළින් ඉටුකරගැනීමටත් රෝහල් බලධාරීන් විසින් කටයුතු යෙදිය යුතු බවට මූල්‍ය පාලන බලතල පැවරීම් වක්‍රලේඛය මඟින් දන්වා තිබුණද, රෝහල තුළ නඩත්තු ඒකකයක් පිහිටුවීමට මෙම වාර්තාවේ දිනය වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ග) හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල විසින් ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් අනුමත කර නොතිබුණු ප්‍රසම්පාදන තීරණ 14 ක් පදනම් කර ගෙන 2025 ඔක්තෝබර් විගණිත අවස්ථාව වන විට රු. 2,596,596 ක වටිනාකමින් යුත් භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඇණවුම් ලිපි නිකුත් කර තිබුණි. එසේම 2024 හා 2025 වර්ෂවල රු.1,288,062 ක ඇස්තමේන්තු වටිනාකමකට වාහන අලුත්වැඩියාවන් 08 ක් සිදු කිරීමේ ප්‍රසම්පාදන තීරණවලට එළඹ නොතිබුණු අතර ඒවා ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කර තිබුණි. ඒ අනුව 2006 හා 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 වගන්තිය යටතේ දක්වා ඇති අරමුණුවලට අනුකූල වන පරිදි කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඝ) ගාල්ල ජාතික රෝහලේ 2024/2025 වර්ෂය සඳහා කිලිටි රෙදි පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුව 2024 දෙසැම්බර් 17 දින සිට වසරක කාලයක් වෙනුවෙන් පුද්ගලික ආයතනයක් සමඟ රු.මිලියන 38.58 ක් වූ වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි. 2025 ජූනි මස 10 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතිකර ගත් ගිවිසුමෙහි දෙවන වගන්තිය ප්‍රකාරව රෙදිපිළි සෝදා පිරිසිදු කර, වියලා, ඉස්ත්‍රික්ක කර භාරදීමට එකඟ වී තිබුණද අදාළ ආයතනයේ රෙදි මැදීමේ පහසුකම් නොතිබුණු බව ද තුන්වන වගන්තිය ප්‍රකාරව ලබා දුන් සියළුම රෙදි නියමිත කාලය ඇතුළත පිරිසිදු කර රෝහල වෙත ලබා දීමට එකඟ වී ඇති නමුත් 2025 ජනවාරි හා පෙබරවාරි මාසයන් තුළ දී, දින 06 සිට දින 33 දක්වා කාලයක් ප්‍රමාදවීම් ද ගිවිසුමෙහි 04 වන වගන්තියට පටහැනිව 2025 ජනවාරි මාසයට අදාළව පිරිසිදු කිරීමට දෙන ලද රෙදි අඩුවෙන් භාර දී තිබුණු අවස්ථා මෙන්ම අඩුවෙන් ලබා දුන් රෙදි නැවත රෝහල වෙත ලබා දීමට දින 04 සිට දින 73 ක දක්වා කාලයක් ගත වී ඇති බවද නිරීක්ෂණය විය. තවද ගිවිසුමෙහි 05 වන වගන්තිය ප්‍රකාරව රෙදි පිරිසිදු කිරීමට ගිවිසගත් ස්ථානයේ නිසි යෝග්‍ය තත්වයන් තුළ රෙදි සෝදා පිරිසිදු කරන බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ බලයලත් නිලධාරියෙකු අධීක්ෂණය කළ යුතු වුවද එම ස්ථානයේ නිසි යෝග්‍ය තත්වයන්ගෙන් යුක්තද, ජලය පරිසරයට මුදාහැරීමේ ක්‍රමවේදයන් සහ රෙදි සේදීම සඳහා භාවිතා කරන විෂබීජහරණය කරන සේදුම්කාරක නියමිත ප්‍රමිතියෙන් භාවිතා කරන්නේද යන්න සොයා බැලීමක් විගණිත දිනය තෙක් සිදු කර නොතිබුණි. ගිවිසුමේ 07 වන වගන්තිය ප්‍රකාරව පිරිසිදු කිරීම සඳහා භාර ගන්නා රෙදි /ඇඳුම් නැති වුවහොත් හෝ නැවත භාරදීම පැහැර හැරියහොත් එම රෙදි /ඇඳුම් සඳහා රජය නියම කර ඇති වටිනාකම් ලෙස එම රෙදි /ඇඳුම් නැවත මිලදී ගැනීම සඳහා වැයවන වියදමට සියයට 25 ක දෙපාර්තමේන්තු ගාස්තුද ඇතුළත් වීමෙන් සැකසෙන මුදල් කොන්ත්‍රාත්කරු විසින් ගෙවීමට එකඟ වී තිබුණද 2025 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසයන්ගේ දින 5 ක දී රෙදි ඒකක 10 ක් අඩු වී තිබීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. අදාළ ලොන්ඩ්‍රිය භෞතිකව පරීක්ෂා කිරීමේදී නියමිත රෙදි සේදුම් යන්ත්‍ර කිසිවක් නොමැති බවත් නිසි ප්‍රමිතියකින් තොරව ලොන්ඩ්‍රි සේවා පවත්වාගෙන යන බවත් නිරීක්ෂණය වූයෙන් කිලිටි රෙදි සේදීම සඳහා ගෙවූ මුදල් සඳහා ආර්ථික වටිනාකමක් ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

අතර එම වාහනය අළුත්වැඩියාව සඳහා භාර දී වසර 03කට වැඩි කාලයක් ගත වූ පසු සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (යාන්ත්‍රික) විසින් 2025 මැයි 21 දින රු.1,542,968ක අළුත්වැඩියා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. 2022 වර්ෂයේදී අළුත්වැඩියාව සඳහා භාර දීමේදී ලබා ගත් ඇස්තමේන්තුවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු අතර 2022 හා 2025 වර්ෂය අතර කාල සීමාව තුළ උද්ධමනයේ බලපෑම ඉදිරිපත් කර තිබුණු මිල ඇස්තමේන්තුවේ පැවතිය හැකි බවත් වසර 03 කට අධික කාලයක් අලුත්වැඩියාව සඳහා යොමුකළ ගිලන් රථය පිළිබඳ සොයා බලා නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ජ) ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලට අයත් අංක PB - 0022 දරන කැබ රථය 2025 ඔක්තෝබර් 08 දින අනතුරකට පත්වී තිබුණු අතර විගණිත දිනය වූ 2026 පෙබරවාරි 17 දින වනවිටත් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව ඒ සම්බන්ධව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමටත්, අනතුර හේතුවෙන් වූ අලාභය ගණනය කර ඊට අදාළව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ට) කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහලට අනුයුක්ත අංක LW-1558 දරන ගිලන් රථය අනතුරකට භාජනය වී 2025 ඔක්තෝබර් වන විට වසර 04 ක් ඉක්මවා තිබුණද, රථය අලුත්වැඩියා නොකර සෞඛ්‍ය අමාත්‍යාංශයේ මුල්ලේරියාව වාහන අංගනයේ ගාල් කර තිබුණි. තවද, මු.රෙ. 104 ප්‍රකාරව වාහන අනතුර සම්බන්ධව මූලික විමර්ශනය අවසන් කර නොතිබූ අතර, වාහනය අනතුරට ලක් වන අවස්ථාවේදී වාහනයේ රක්ෂණාවරනයේ වලංගු කාල සීමාව අවසන් වී තිබීම හේතුකොටගෙන රක්ෂණ වන්දි ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද, වසර 04 කට වැඩි කාලයක් එකමතැන ගාල් කර තිබීම හේතුකොටගෙන රථය දිරාපත්වීමේ අවදානමක් පවතින බවද දක්නට ලැබුණි. තවද, හදිසි අනතුරට සම්බන්ධ වගකියයුතු නිලධාරින්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඨ) 2024 මාර්තු 29 දින කරාපිටිය ශික්ෂණ රෝහලෙන් මාලිගාවත්ත වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ ජාතික මධ්‍යස්ථානය වෙත රසායනාගාර පරීක්ෂණ සිදුකිරීම සඳහා Indiko Plus Auto Chemistry Analyzer යන යන්ත්‍රය එවා තිබුණද එම යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය වෙනුවෙන් ප්‍රතික්‍රියක සඳහා රු. 7,277,718 ක මුදලක් වැය වන බැවින් හා එම මිල ගණන් පිළිබඳ තීරණයකට නොඑළඹීම හේතුවෙන් මෙම යන්ත්‍රය විගණිත දිනය වූ 2025 දෙසැම්බර් 31 දින වන විටත් පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා නොකර රසායනාගාරය තුළ නිෂ්කාර්යව පැවතුණි.

(ඩ) වායු සමීකරණය කරන ලද බහාලුම් 03 ක් දීර්ඝ කාලයක් නිස්සේ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රියව වෛද්‍ය පර්යේෂණ ආයතන පරිශ්‍රයේ ගාල්කර පවතින බව නිරීක්ෂණය විය. ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් ඒවා වල් බිහි වී තිබුණු අතර ඒ තුළ නවීන මාදිලියේ නාන කාමර උපාංග කට්ටලයක්, මෙට්ට 3ක් හා ඇඳන් 2ක් සහ වායු සමීකරණ යන්ත්‍ර 3ක් පැවතුණි.

(ඝ) අයිතිය ජන මාධ්‍ය අමාත්‍යාංශය සතු වුවද මෙම වාර්තාවේ දිනය දක්වා ගිණුම් ගත නොකළ පිරිවැය රු.39,500,000 ක් වූ අංක CAD-6806 දරන රථය 2024 වර්ෂයේදී ඇතිවූ දෝෂයක් හේතුවෙන් යාන්ත්‍රික ඉංජිනේරු විසින් අලුත්වැඩියා ආයතනයක් වෙත යොමුකර තිබුණු අතර 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව රථයක අභ්‍යන්තර අලුත්වැඩියාව සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවකුගේ වර්තාවක් ලබා ගත යුතු වුවද එයට අනුකූල නොවන පරිදි අදාළ ආයතනයට රු.15,000 ගෙවා රථය ගලවා තිබුණි. අලුත්වැඩියාවෙන් තොරව මාසයකට පසුව වාහනය අමාත්‍යාංශය වෙත නැවත භාරදී තිබුණු අතර භාරදෙන අවස්ථාවේ පැවති තත්ත්වය පිළිබඳව නිසි ක්‍රමවේදයක් ඔස්සේ පරීක්ෂාවට ලක් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අමාත්‍යාංශ ප්‍රවාහන භාර නිලධාරියා කටයුතු කර නොතිබුණි. තවද මෙම රථය අලුත්වැඩියාව වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දින වන විට රු.4,274,849ක වියදමක් දරා තිබුණි. මෙම වියදම 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 හා අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

(ඞ) 2017 දී ඕස්ට්‍රේලියානු ණය ආධාර ලබන ව්‍යාපෘතිය යටතේ ඒකකයක් එක්සත් ජනපද ඩොලර් 701,335.83කට, අම්පාර දිස්ත්‍රික් මහ රෝහල, කල්මුණේ අෂ්රොෆ් අනුෂ්මරණ රෝහල, කල්මුණේ උතුර මූලික රෝහල, අක්කරපත්තුව මූලික රෝහල හා හලාවත දිස්ත්‍රික් මහ රෝහල වෙත ලබාදී තිබුණු මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 3,506,679.15 ක්වූ මෙටමයිසර් යන්ත්‍ර භාවිතයට නොගන්නා බව නිරීක්ෂණය විය. හලාවත දිස්ත්‍රික් මහ රෝහලට සායනික අපද්‍රව්‍ය අපහරණය සඳහා 2021 වර්ෂයේදී ලබා දී තිබුණු incinerator යන්ත්‍රය මඟින් සායනික අපද්‍රව්‍ය අපහරණය සිදු කෙරෙන බැවින් මෙම යන්ත්‍රයේ අවශ්‍යතාවයක් නොමැති බවත් රෝගීන්ට නේවාසික පහසුකම් වෙනුවෙන් ඉඩ සලසා ගැනීමට මෙම යන්ත්‍රය රෝහල් භූමියෙන් ඉවත් කරදෙන ලෙසත් රෝහල විසින් අමාත්‍යාංශ ලේකම් වෙත දිගින් දිගටම ඉල්ලීම් කර තිබුණද විගණන දිනය වූ 2026 මාර්තු 12 දින වන විටත් යන්ත්‍රය නිෂ්කාර්යව රෝහල් භූමියේ පැවතුණි. 2025 නොවැම්බර් 29 දින රෝහල් පරිශ්‍රයට බලපාන ලද දිවා සුළි කුණාටු තත්ත්වය නිසා මෙම යන්ත්‍රයද ජලයට හසුවී තිබුණු අතර, විගණිත අවස්ථාව වන විටත් යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර නොතිබුණි.

4.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) 2013 ඔක්තෝබර් 04 දිනැති අංක TRC/PF/137 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් පත්වීමේ දින සිට සේවය ස්ථිර කර තිබුණු 2009 පෙබරවාරි 02 දිනැතිව පත්වීම් ලැබූ කරාපිටිය ජාතික රෝහලට අනුයුක්ත සෞඛ්‍ය රියදුරකු විසින් රියැදුරු පත්වීමට අදාළව ඉදිරිපත් කරන ලද අ.පොස. (සා.පෙළ.) ප්‍රතිඵල ලේඛනය ව්‍යාජ ලේඛනයක් බව විභාග දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 29 දින තහවුරු කර තිබුණි. ඒ අනුව පත් කිරීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ගෙන නිබෙද යන්න තහවුරු කරගැනීමට අදාළව අධ්‍යාපන සහතික විභාග දෙපාර්තමේන්තුව මඟින් සනාථ කර ගැනීමකින් තොරව සේවයේ ස්ථිර කර තිබුණු හෙයින් 2009 වර්ෂයේ සිට 2025 ජූලි දක්වා එකතුව රු. 10,929,399 ක වැටුප් හා දීමනා නිසි අධිකාරියකින් තොරව ගෙවා ඇති බව

නිරීක්ෂණය විය. එසේම නිලධාරියා ඉදිරිපත් කරන ලද අධ්‍යාපන සහතික ව්‍යාජ බව 2021 දෙසැම්බර් 29 දින තහවුරු වී ඇතත් වගකිව යුතු නිලධාරීන් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන නිලධාරියා සේවයේ යොදවා තිබුණි.

(ආ) 2025 පෙබරවාරි 25 දින බොරැල්ල මංසන්ධිය ආසන්නයේදී වෛද්‍ය පරීක්ෂණ ආයතනයට අයත් අංක 456476 සිට 456525 දක්වා අංකනය කරන ලද චෙක්පොතෙහි අඩංගු චෙක්පත් 34 ක් අස්ථාන ගත වී තිබුණු අතර චෙක්පත් යැවීමේදී මුදල් රෙගුලාසි 384 (5) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මෙම සිදුවීම පිළිබඳව 2025 නොවැම්බර් 20 විගණිත දිනය වන විට ද මූලික පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රක්තවේද හා පුනරුත්ථාපන රෝහලේ අභ්‍යන්තර ගබඩාවේ පැවති Tramadol Hydrochloride capsule 50mg (Cap Tramadol – Ip 50mg) ඖෂධය සම්බන්ධයෙන් 2025 අගෝස්තු 12 දින සිදුකරන ලද අභ්‍යන්තර පරීක්ෂණ වාර්තාවට අනුව LTHMF 04 කාණ්ඩය යටතේ ඒකක 100ක් හා LTHMF 05 කාණ්ඩය යටතේ ද ඒකක 600ක් වශයෙන් ඒකක 700ක ශේෂයක් පවතින බව දක්වා තිබුණි. විගණනය විසින් 2025 අගෝස්තු 27 දින සිදුකරන ලද භෞතික පරීක්ෂණයට අනුව එදිනට ඒකක 650 ක ශේෂයක් පැවති අතර එය LTHMF 01 කාණ්ඩයේ ඒකක 500කින් හා LTHMF 04 කාණ්ඩයේ ඒකක 150 කින් සමන්විත විය. ඒ අනුව අභ්‍යන්තර පරීක්ෂණයේදී ඉදිරිපත් කරන ලද ඖෂධවල කාණ්ඩ අංක, විගණනයේ භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ කාණ්ඩ අංක හා වෛද්‍ය සැපයුම් අංශය විසින් මෙම රෝහලට සපයන ලද ඖෂධයේ කාණ්ඩ අංක එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය විය.

(ඈ) හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල් රසායනාගාරයට අවශ්‍ය ප්‍රතිකාරක (Reagent) ද්‍රව්‍ය මිලදී ගැනීමේදී සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ලබා ගැනීම, ඇණවුම් නියෝග නිකුත් කිරීම, මිලදී ගැනීම්වලට අදාළව සැපයුම්කරුවන්ගෙන් ඉන්වොයිස්පත් ලබා ගැනීම පොදු 35 වවුවර් පිළියෙල කිරීම යන ප්‍රසම්පාදන නිලධාරියාගේ විෂයට අදාළ කටයුතු ද ඇතුළත්ව ප්‍රතිකාරක ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ සියලු කටයුතු ප්‍රධාන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ (CMLT) විසින් සිදු කිරීමට ඉඩ සලසා තිබීමෙන් රසායනාගාරයට අවශ්‍ය ප්‍රතිකාරක ද්‍රව්‍ය මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුළ විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම නියැදි විගණන පරීක්ෂාවේදී 2024 හා 2025 වර්ෂවල අවස්ථා 03 කදී දේශීය වෙළඳපලෙන් මිලදී ගෙන තිබුණු අත්‍යාවශ්‍ය ප්‍රතිකාරක ද්‍රව්‍ය අයිතම 06 කට අදාළ පිරිවැය රු.864,375 ක්වූ ඒකක 61 ක් වෙනත් රෝහල්වලට නැවත නිකුත් කර තිබුණි. මෙසේ නිකුත් කළ බවට සඳහන් කර තිබුණු ප්‍රතික්‍රියක ද්‍රව්‍ය වර්ග 03 කට අදාළව පිරිවැය රු.589,920 ක්වූ ඒකක 55 ක් අදාළ රෝහල් විසින් ඉල්ලුම් කර නොතිබුණු බවත්, එම ද්‍රව්‍ය එකී රෝහල් වෙත ලැබී නොමැති බවත් විගණනයේ දී තහවුරු විය. ඒ අනුව වෙනත් රෝහල් වෙත රසායනාගාර ප්‍රතික්‍රියක ද්‍රව්‍ය නිකුත් කළ බවට විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය බවත්, ඒ අනුව සාවද්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීම මඟින් ඊට වගකිව යුතු නිලධාරීන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ ඇතුළත් රාජ්‍ය නිලධරයන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධයෙන් පළමුවන උපලේඛනයෙහි දැක්වෙන වැරදි සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය.

4.5 පාඩු හා හානි

(අ) මුදල් රෙගුලාසි 106 හා 113 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය (සටහන (i)) අනුව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ වටිනාකම රු. මිලියන 31.97ක් වුවද රෝහල් හා ආයතන විසින් පිළියෙල කරන ලද ප්‍රකාශනයන් අනුව එම වටිනාකම රු. මිලියන 1,352.19 ක් විය. ඒ අනුව රු. මිලියන 1,320.22 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) රෝහල් හා ආයතන විසින් පිළියෙල කරන ලද 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකරගැනීමට හෝ අත්හැරීමට ඇති පාඩු ප්‍රකාශනයේ මුළු වටිනාකම වූ රු. මිලියන1,352.19 න් රු. මිලියන 419.82 ක් වර්ෂ 05 ට වැඩි වටිනාකම් විය. එය මුළු වටිනාකමින් සියයට 31 ක් වූ අතර කාල විශ්ලේෂණය ඉදිරිපත් නොකළ වටිනාකම රු. මිලියන 1.61 ක් විය.

(ඇ) බදුල්ල පළාත් මහ රෝහලෙහි (දැනට බදුල්ල ශික්ෂණ රෝහල) වැටුප් මුදල් වංචාවකට අදාළ මුදල් රෙගුලාසි 104(4) හා 109 වාර්තා අනුව අලාභය සිදුවූ අවස්ථාවේ තක්සේරු පිරිවැය රු. 1,622,024 ක් වූ අතර එයට අදාළ නඩු තීන්දුව අනුව රු. 1,406,959 ක් 2024 වර්ෂයේදී අවස්ථා 3 කදී අයකරගෙන තිබුණි. එසේවුවද අයකරගත් මුදල පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණු අතර එම සිද්ධියට අදාළ රු. 215,065 ක් වූ ඉතිරි අලාභය පොත්වල දක්වා නොතිබුණි.

(ඈ) බදුල්ල ශික්ෂණ රෝහල විසින් පිළියල කරන ලද පාඩු හා අත්හැරීම් ප්‍රකාශනයෙහි ඖෂධ සොරා ගැනීම් රු .15,378 ක් සහ නව ශ්‍රවණාගාරයේ උපකරණ සොරා ගැනීම් රු. 586,000 ක් සඳහන් වුවද අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද පාඩු හා අත්හැරීම් ප්‍රකාශනයේ එම වටිනාකම් දක්වා නොතිබුණි.

(ඉ) අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ඇමුණුම ii හා රෝහල් ආයතන විසින් පිළියෙල කරන ලද ඇමුණුම ii පරීක්ෂාවේදී මහනුවර ජාතික රෝහලෙහි ඖෂධ කල් ඉකුත්වීම් සම්බන්ධ සිදුවීම් 16 ක එකතුව රු.1,598,048 ක් හා වෙනත් සිදුවීම් 8ක එකතුව රු. 10,092,698ක් අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ප්‍රකාශනයෙහි කපා නොහල ඉදිරියට ගෙන යන ශේෂය ලෙස සඳහන් වුවද රෝහල විසින් ඇමුණුම ii හි මෙම සිද්ධීන් දක්වා නොතිබුණි.

(ඊ) අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම පිළිබඳ ප්‍රකාශනයෙහි (ඇමුණුම ii) රෝහල් හා ආයතන 16 කට අදාළව කපා නොහල ඉදිරියට ගෙන යන රු.42,417,803 ක ශේෂයක් සඳහන් වුවද එම රෝහල් හා ආයතයන විසින් හිස් වාර්තා ඉදිරිපත් කර තිබුණි.

(උ) 2025 නොවැම්බර් දිවයිනට බලපෑ දිවිවා සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ ගබඩාතුළ හානිවී තිබුණු ඖෂධ හා ශල්‍යාකර්ම ද්‍රව්‍යවල පිරිවැය

රු.මිලියන108ක් වූ අතර, අනෙකුත් අංශවල හා වාට්ටු තුළ තිබී හානි වූ ඖෂධ හා ශල්‍යකර්ම ද්‍රව්‍යවල පිරිවැය 2026 මාර්තු 12 දින විගණන අවස්ථාව වන විටත් තක්සේරු කර නොතිබුණි. එම ද්‍රව්‍ය රෝහල් පරිශ්‍රය තුළ ඉදිකෙරෙමින් පවතින ගොඩනැගිල්ලක ගොඩ ගසා තිබුණි. මෙම ආපදා තත්ත්වය හේතුවෙන් විකිරණවේදී අංශයේ ස්ථාපිත කර තිබුණු පිරිවැය රු. මිලියන 41ක් වූ CT ස්කෑන් යන්ත්‍රයට හා භෞතික වෛද්‍ය අංශයෙහි පිරිවැය රු. මිලියන 14.99ක් වූ Ultra Sound යන්ත්‍රය හා Short wave යන්ත්‍රය හානියට පත්ව තිබුණු අතර, ජීව වෛද්‍ය ඉංජිනේරු ආයතනය මෙම යන්ත්‍ර දෙක අලුත්වැඩියා කිරීමට නොහැකි බව රෝහල් කළමනාකරණය වෙත දන්වා තිබුණි. මේ හේතුවෙන් CT හා X-ray පරීක්ෂණ සේවාව පෞද්ගලික රෝහල් මඟින් සිදුකිරීම නිසා 2026 ජනවාරි හා පෙබරවාරි මාසවල රු.මිලියන 3 කට ආසන්න මුදලක් රෝහල මඟින් දරා තිබුණි.

(ඌ) රක්තවාතවේද හා පුනරුත්ථාපන රෝහලේ ඖෂධ ගබඩාව භාරව කටයුතු කළ ඖෂධවේදිනිය සේවයට වාර්තා නොකිරීම මත, රෝගී සත්කාර සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණින් ඇය භාරයේ පැවති ඖෂධ ගබඩාවේ ඖෂධ හා සැරහුම්වල භෞතික ශේෂය ගණනය කර විධිමත් පරිදි ප්‍රධාන ඖෂධවේදී වෙත භාරදීම සඳහා කමිටුවක් පත්කර තිබුණි. ඒ අනුව 2025 මාර්තු 06 දින කමිටුව විසින් භෞතික පරීක්ෂණයක් සිදුකර භෞතිකව පැවති ශේෂයන් පමණක් ස්වස්ථා පද්ධතියේ වෙනම ඒකකයක් ලෙස (PHA 2)ඇතුළත් කර තිබුණි. එසේ වුවද පැරණි ඒකකයේ (PHA 01) දත්ත අනුව ගබඩාවේ පැවතිය යුතු කල් ඉකුත් වූ ඖෂධ වර්ග 77කට අදාළ ඒකක 422,582ක ප්‍රමාණයක් භෞතිකව එදිනට ගබඩාවේ නොතිබුණි.

(එ) 2024 අගෝස්තු සිට 2025 ජූලි දක්වා කාල පරිච්ඡේදය තුළ කුරුණෑගල ශික්ෂණ රෝහලේ රුධිර කාන්දුපෙරණ ඒකකය විසින් රෝගීන් සඳහා රුධිර කාන්දුපෙරණ 15343 ක් සිදුකර තිබුණි. එහිදී ඉවත් කරන ලීටර් 5 හා ලීටර් 10 ප්ලාස්ටික් කෑන් ප්‍රමාණයේ එකතුව 30,686 ක් විය. මින් ප්ලාස්ටික් කෑන් 22,394 ක් පමණක් අබලි ගබඩාවට හා වාරියපොළ යුධ හමුදා කඳවුරට නිකුත් කර තිබුණු අතර ඒ අනුව අස්ථානගත වූ ප්ලාස්ටික් කෑන් 8,292 ක් වෙනුවෙන් රු.1,221,870 ක ආදායමක් අහිමි වී තිබුණි. රුධිර කාන්දුපෙරණ ඒකකය මඟින් නිකුත් කරන ප්ලාස්ටික් කෑන් අසුරා තැබීමට අබලි ගබඩාවේ පහසුකම් තිබියදීත් සලකා බලන කාලපරිච්ඡේය තුළ අබලි ගබඩාවට ලබා දුන් ප්ලාස්ටික් කෑන් ප්‍රමාණයෙන් ප්ලාස්ටික් කෑන් 10,911 ක් අස්ථානගතවීමෙන් රු.1,363,473 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඒ) මහනුවර ජාතික රෝහලේ ගිලන් රථයක් 2020 සැප්තැම්බර් 23 දින අනතුරකට පත්ව තිබුණු අතර එම අවස්ථාව වන විට එහි වෙළඳපොළ අගය වූ රු.මිලියන 11.80 ක් පූර්ණ හානි ක්‍රමය යටතේ ගෙවීමට රක්ෂණ ආයතනය 2021නොවැම්බර් 08 දිනැති ලිපියෙන් එකඟ වී තිබුණද ඊට එකඟ නොවී විධිමත් කමිටුවක පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව ඇස්තමේන්තු අගය රු. මිලියන 8.30කට ගිලන් රථය අළුත්වැඩියා කිරීමට 2022 අගෝස්තු 03 දින පෞද්ගලික ආයතනයකට භාරදී තිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 23 වන දින රු. මිලියන 6.23 ක් රක්ෂණ සමාගමෙන් ගරාජයට ගෙවීම් කර තිබුණි. අළුත්වැඩියා කටයුතු සඳහා භාරදී 2026 පෙබරවාරි 05 දින වන විට වසර 3½ක් ගතව තිබියදීත් අළුත්වැඩියා කටයුතු නිම කර රථය රෝහල වෙත භාර නොදීම සම්බන්ධයෙන්

නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණු අතර ඉතිරි රක්ෂණ වන්දි මුදල් නොගෙවීමටද රක්ෂණ ආයතනය තීරණය කර තිබුණි.

(ඔ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය අධ්‍යාපන ඒකකයේ ප්‍රතිපාදන යටතේ 2018 නොවැම්බර් 21 දින මිලදී ගත් බෝ නොවන රෝග පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරණ පුවරුවක් කරාපිටිය ශික්ෂණ රෝහලට ලබා දී තිබුණු අතර එය 2024 ජූලි 18 වන දින ගලවා ඉවත් කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2018 කාර්යසාධන සැලැස්මට අනුව දිග අඩි 20 ක් හා පළල අඩි 10 ප්‍රමාණයේ LED ප්‍රචාරණ පුවරුවක් කරාපිටිය ශික්ෂණ රෝහලෙහි සවි කිරීම සඳහා රු. මිලියන 6 ක් ඇස්තමේන්තු කර ඇති බව නිරීක්ෂණය වූ නමුත් පුවරුව මිලදී ගැනීම, රෝහලෙහි ස්ථාපිත කිරීම හා ඒ හා අනුශාංගික අනෙකුත් පිරිවැය කොපමණද යන්න සඳහා විගණනයට සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොකෙරුණි. මෙම පුවරුව වර්ෂයක පමණ කාලයක් භාවිතා කර තිබුණු අතර 2022 මාර්තු 06 වන දින සිට ක්‍රියා විරහිතව පැවත 2024 ජූලි මස 18 වන දින රෝහල් භූමියෙන් ගලවා ඉවත් කර තිබුණි. ප්‍රචාරණ පුවරුවට අදාළ පරිගණකය සහ අනෙකුත් උපාංග 18 ක් හා යකඩ කණු, සෞඛ්‍ය අධ්‍යාපන හා සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකයේ කාර්යභාර භෙද නිලධාරී තුමිය භාරයේ තිබුණු අතර එම උපාංග 36/12 නිල නිවාසයෙහි අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. 2025 ජූනි 27 වන දින රෝහල විසින් සිදු කළ පරීක්ෂාවේදී පැනලය සවි කිරීමට භාවිතා කළ C බාර් අඩි 20 හා 8 දිග කණු 5 ක් හා H බාර් අඩි 8 දිග අගල් 01 පළල, අඩි 09 දිග අගල් 06 පළල, අඩි 08 දිග අගල් 06 පළල හා අඩි 04 දිග අගල් 6 පළල කණු 6 ක් වූ එකතුව යකඩ කණු 11 ක් සොරකම් කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර මෙම ප්‍රචාරණ පුවරුව සඳහා වැය කළ මුදල් නිශ්කාර්යව වියදම් වීමට ඉඩ හැර බවත් නිරීක්ෂණය විය. එසේම මෙම සොරකම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.6 අනාර්ථික ගනුදෙනු

(අ) 1897 අංක 3 දරන නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥා පනත සංශෝධනය කිරීම සඳහා සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින් රු.මිලියන 2.11 ක මුදලකට විශේෂඥයෙකු 2020 වර්ෂයේදී නිරෝධායන ඒකකයට බඳවාගෙන තිබුණි. මෙම විශේෂඥයා විසින් 2021 ජූලි 05 දින ලබාදී තිබුණු අවසාන වාර්තාව මඟින් ප්‍රමාණවත් ආවරණයක් සිදු කර නොමැති බැවින් එම වාර්තාව අනුමත කර නොතිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා එම්බුස් ලාදුරු මර්දන ව්‍යාපෘතිය නමින් 1994 සැප්තැම්බර්14 වන දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු අංක 64-7610 දරන වාහනය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධ්‍යක්ෂ විසින් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ප්‍රවාහන) වෙත යොමු කරන ලද 2023 දෙසැම්බර් 13 දිනැති ලිපිය මඟින් 2017 වර්ෂයේ සිට කාර්මික දෝෂයක් හේතුවෙන් රථය ධාවනය කර නොමැති බවත් මේ හේතුවෙන්

වාහනය සුළු වශයෙන් දිරාපත්වීම්වලට ලක්ව පැවති බවත් දන්වා තිබුණි. තවද රාජ්‍ය නොවන ව්‍යාපෘතියක් නමින් ලියාපදිංචි කර තිබුණු මෙම රථය සඳහා 2008 වර්ෂයේ සිට ආදායම් බලපත්‍රයක් ලබාගෙන නොමැති බැවින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචිය අවලංගු කිරීමට තීරණය කර ඇති බව දන්වා තිබුණද මෙම වාහනයෙහි අයිතිය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශය මෙම වාහන භාරගැනීමෙන් පසුව 2025 පෙබරවාරි 24 දින වන විට අවස්ථා කිහිපයකදී එකතුව රු.727,983 ක් වැයකර අලුත්වැඩියාවන් සිදුකර තිබුණද මෙම වාහනය අමාත්‍යාංශ පරිශ්‍රයේ නිෂ්කාර්යව ගාල්කර පැවතුණි. මින් ඇතැම් අලුත්වැඩියාවන් වගකීම් කාලයක් සහිතව සිදුකර තිබුණද වාහනය ධාවනයකින් තොරව නිෂ්කාර්යව තිබීයදීම එම වගකීම් කාලයන් ඉක්මවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2023 වර්ෂයේදී රු. මිලියන 34.2 ක් වැයකර මිලදී ගන්නා ලද Automated Immunoassay/ Hormone analyzer යන්ත්‍ර උපයෝජනය පිළිබඳ පරීක්ෂාව මැයෙන් 2025 පෙබරවාරි 05 දින නිකුත් කරන ලද විගණන විමසුමට 2025 දෙසැම්බර් 31 දින ලබාදුන් පිළිතුරු පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම උපකරණ රෝහල්වල ඉල්ලීම අනුව ලබාදී ඇති බව සඳහන් කර තිබුණද ඒ බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මූලික රෝහල මූතුර් වෙත ලබාදී තිබුණු උපකරණය පසුව ශික්ෂණ රෝහල බදුල්ල වෙත ලබාදී තිබුණද එම රෝහලෙන් එවැනි උපකරණයක අවශ්‍යතාවයක් සඳහන් කර නොතිබීයදී එම රෝහලට උපකරණය මාරු කර තිබුණි. බදුල්ල ශික්ෂණ රෝහල සතුව පූර්ණ ස්වයංක්‍රීය විශ්ලේෂණ යන්ත්‍රයක් පවතින බවත්, එම උපකරණය සඳහා අදාළ සමාගම විසින් ජීවිත කාලය සඳහාම සේවා හා නඩත්තු ගාස්තු අයකිරීමකින් තොරව සිදුකරන බවත්, එම උපකරණය මඟින් සම්පූර්ණ ඌව පළාතටත් දිස්ත්‍රික් මහ රෝහල අම්පාර හා නුවරඑළියටත් සේවා සපයන බවත්, එසේ සේවා සැපයීමේදීවත් එම උපකරණය ප්‍රශස්ථ මට්ටමින් භාවිතා නොකරන බවත්, අළුතින් ලබාදීමට යෝජිත උපකරණය පවතින උපකරණයේ ධාරිතාවයටත් වඩා වැඩි බවත්, පවතින උපකරණය සඳහාවත් ප්‍රමාණවත් සාම්පල ප්‍රමාණයක් නොලැබෙන බවත්, එම තත්ත්වය තුළ තවත් උපකරණයක් අවශ්‍ය නොවන බවත් අංශභාර වෛද්‍යවරිය විසින් 2024 නොවැම්බර් 22 දින රෝහල් අධ්‍යක්ෂකට ලිඛිතව දන්වා තිබුණි. නමුත් එම කරුණු කිසිවක් පිළිබඳව නොසලකා මූලික රෝහල මූතුර් වෙත ලබාදී තිබුණු උපකරණය බදුල්ල ශික්ෂණ රෝහල වෙත නිකුත් කර තිබුණි.

(iii) බදුල්ල ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ විසින්ද 2024 දෙසැම්බර් 19 දින වන විටත් රෝහලේ පවතින විශ්ලේෂණ යන්ත්‍රයද පූර්ණ ධාරිතාවයකින් උපයෝජනය නොකරන බැවින් තවත් උපකරණයක අවශ්‍යතාවයක් නොමැති බව

අධ්‍යක්ෂ(රසායනාගාර) වෙත දන්වා තිබුණි. ලබාදී තිබුණු පිළිතුරේ ඉදිරියේදී ඌව පළාතම ආවරණය වන පරිදි පරීක්ෂණ සිදුකිරීමට සැළසුම් කර ඇති බව දක්වා තිබුණද මෙම උපකරණ මිලදී ගැනීමට පෙර සිටම බදුල්ල ශික්ෂණ රෝහල සතු විශ්ලේෂණ උපකරණය මඟින් ඌව පළාත හා ඊට අමතරව අම්පාර හා නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල් දෙකටද සේවාවන් සපයා තිබුණි. මේ අනුව කිසිදු ඉල්ලීමක් හෝ අවශ්‍යතාවයක් රහිතව මෙම උපකරණය බදුල්ල ශික්ෂණ රෝහල වෙත ලබාදී ඇතිබවත් මෙහිදී වගකිව යුතු නිලධාරීන් වගකීම් විරහිතව කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය විය.

(iv) මූලික රෝහල කාත්තංකුඩි වෙත ලබාදී තිබුණු උපකරණය අම්පාර මහ රෝහල වෙත ලබාදී තිබුණද එම රෝහලෙන් ඒ සඳහා ලැබුණු ඉල්ලීමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම රෝහලට අදාළ සාම්පල් පරීක්ෂාව ඒවන විට ශික්ෂණ රෝහල බදුල්ල විසින් සිදුකරමින් පැවතුණි.

(v) පොතුවිල් මූලික රෝහල වෙත ලබාදී තිබුණු උපකරණය පලමුණේ දිස්ත්‍රික් රෝහල වෙත මාරු කළ බව දක්වා තිබුණද ඒ සඳහා ලැබුණු ඉල්ලීම් ලිපියක් හෝ ආවරණය කිරීමට අපේක්ෂිත රෝහල් පිළිබඳව හෝ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මීට පෙර විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව පොතුවිල් මූලික රෝහල වෙත උපකරණයක් ලබාදුන් බව සඳහන් කර නොතිබුණු අතර පලමුණේ දිස්ත්‍රික් රෝහල තුළ 2023 ජුනි 30 දින උපකරණය ස්ථාපිත කළ බව දක්වා තිබුණි.

(vi) කලවන්චිකුඩි මූලික රෝහල වෙත ලබාදී ඇති උපකරණය මඩකළපුව පුහුණු මධ්‍යස්ථානය වෙත මාරු කිරීමට යෝජිත බව දක්වා තිබුණද ඒ සඳහා ලැබුණු ඉල්ලීමක් හෝ ආවරණය කිරීමට අපේක්ෂිත රෝහල් පිළිබඳව හෝ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම මිලදීගෙන වසර 03 ක් ගතවී තිබියදීත් 2025 දෙසැම්බර් 31 දිනවන විටත් උපකරණය ස්ථාපිත කර උපයෝජනය ආරම්භ කිරීමට නොහැකි වී තිබීම තුළ අවශ්‍යතාවයකින් තොරව උපකරණ මිලදීගෙන ඇති බව නිරීක්ෂණය විය.

(vii) කලවන්චිකුඩි මූලික රෝහල වෙත ලබාදී ඇති උපකරණය අළුත්වැඩියාවන් සඳහා අම්පාර දිස්ත්‍රික් මහ රෝහල වෙත යවා ඇති බව සඳහන් කර තිබුණි. යන්ත්‍රය ස්ථාපිත කිරීමටත් පෙර සිදුකළ යුතු අළුත්වැඩියාව කුමක්ද යන්න පැහැදිලි නොවීය.

(viii) ලබාදී තිබුණු පිළිතුර අනුව අඩු පරීක්ෂණ ප්‍රමාණයක් සිදුකළ හැකි උපකරණවල මිල ඉතා අධික බව දක්වා තිබුණද ඒ බව තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. පරීක්ෂණ 50 ක් පමණ සිදුකළ හැකි උපකරණයක මිලට වඩා පරීක්ෂණ 8 ක් 10 ක් පමණ කළ හැකි උපකරණයක මිල ඉතා අධික බව සඳහන් කිරීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ix) උපකරණ 10 ලබාදී ඇති ආයතන විසින් එම උපකරණ මඟින් සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු, උපකරණ වෙනුවෙන් දරන ලද සේවා නඩත්තු හා අළුත්වැඩියා වියදම් පිළිබඳ තොරතුරු, ප්‍රතික්‍රියක සඳහා දරන ලද වියදම් පිළිබඳ තොරතුරු සහ උපකරණ නැවත ස්ථාපිත කිරීම සඳහා දරන ලද වියදම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(x) අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමෙන් පසුව මෙම මිලදී ගැනීම සම්බන්ධයෙන් පූර්ණ විධිමත් විමර්ශනයක් සිදුකරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් නියෝග කරන ලදි. නමුත් එම විමර්ශනය සිදුකළ / සිදුකරන බවක් පිළිතුරේ සඳහන් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා රු.29,287,411ක් ඇස්තමේන්තු කර ගෙවීමේ පදනම මත ගාල්ල ජාතික රෝහල සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි කාර්මිකයන් අනුයුක්ත කර තිබුණි. මෙම විදුලි කාර්මිකයන් සඳහා ඔවුන් වැඩ කරන දින ගණන පදනම් කරගෙන වේතන ඇස්තමේන්තුව සකස් කරන බව නිරීක්ෂණය වූ අතර එක් දිනයක් තුළ විදුලි කාර්මිකයන් දෙදෙනකු පැය 24 ක රෝහල් විදුලි නඩත්තු සේවයේ යෙදී සිටීම මත සාමාන්‍ය දිනයක (පොහොය හා ඉරිදා දින හැර) රු.30,024 ක් ද ඉරිදා හෝ නිවාඩු දින සඳහා රු.45,036 ක් ද වශයෙන් විදුලි කාර්මිකයින් දෙදෙනෙකු සඳහා මසකට රු.2,041,620 ක වේතනයක් ගෙවනු ලබන බව නිරීක්ෂණය විය. නමුත් සිදු කළ යුතු කාර්යයන් හෝ පවරා ඇති රාජකාරී හා ගෙවීම් සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ලිඛිත ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. කෙසේ වෙතත් විදුලි කාර්මිකයකුගේ රු.1,251 ක් වූ පැයක වේතන රේටය තීරණය කිරීමට පදනම් වූ කරුණු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා ඔවුන් විසින් ඉටු කර ඇති විදුලි නඩත්තු සහ සේවාවන් ප්‍රමාණයන් සලකා බැලීමේදී ඉන් සියයට අනූවකට අධික ප්‍රමාණයක් බල්බ සවි කිරීම, ෆෑන් සවි කිරීම, Plug Base සහ Plug Top සවි කිරීම හා නඩත්තු කිරීම, විදුලිය විසන්ධි වීම යථාවත් කිරීම සහ පරීක්ෂා කිරීම හා නිවැරැදි කිරීම ආදී සුළු නඩත්තු කටයුතු සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද නඩත්තු වාර හා ඒවායේ ස්වභාවය සලකා බැලීමේදී එක් එක් මාසයේදී බල්බ සවිකිරීම් සිදු කර ඇති වාර ගණන මුළු නඩත්තු වාර ගණනින් සියයට 38 සිට සියයට 58 දක්වා ප්‍රතිශතයක් ගෙන ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව රෝහල් තුළ පවතින නඩත්තු අංශය මඟින් ද සුළු විදුලි නඩත්තු වැඩ සිදු කිරීමට හැකියාව පවතින අතරතුර ලංකා විදුලිබල මණ්ඩලය වෙත එක් මසකට විදුලි කාර්මිකයන් දෙදෙනෙකුට රු.2,041,620 ක විශාල මුදලක් ගෙවීම් කරමින් විදුලි නඩත්තු සේවා ඉටු කරවා ගැනීම රජයේ මුදල් නිශ්කාර්යව වියදම් වීමට ඉඩ හැරීමක් බව නිරීක්ෂණය විය.

(ඉ) ගාල්ල ජාතික රෝහල විසින් 2024 වර්ෂය සඳහා පිරිවැය රු 2,331,445 ක් වූ විදුලි බුබුළු ඒකක 3508 ක් මිලදී ගෙන ඉන් විදුලි බුබුළු 1581 ක් භාවිතා කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා පිරිවැය රු 2,403,335 ක් වූ විදුලි බුබුළු 1228 ක් මිලදී ගෙන ඒකක 1179 ක් භාවිතා කර තිබුණි. තවද විදුලි බල්බ මිලදී ගැනීමේදී අවුරුදු 02 හෝ 03 ක වගකීම් කාලයක් හිමිවන නමුත් වගකීම් කාලය තුලදී විදුලි බුබුළු ක්‍රිය විරහිත නොසලකා නව විදුලි

බුබුළු නිකුත් කිරීම හේතුවෙන් විදුලි බුබුළු සඳහා නිශ්කාර්යව මුදල් වැය කරන බව නිරීක්ෂණය විය. එසේම වර්ෂ දෙක තුළ මිලදීගෙන තිබුණු විදුලි බුබුළු වලින් විදුලි බුබුළු 1976 ක් භාවිතා කළ ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) රජයේ රෝහල් සඳහා නිකුත් කළ වෛද්‍ය සැපයීම් අතරින් පිරිවැය රු. මිලියන 1,210.52 ක ඖෂධ, ශල්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්වීම මත සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර තවත් පිරිවැය රු. මිලියන 1,409.23 ක වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත් වීම මත තාවකාලිකව භාවිතය අත්හිටුවා ඇති බව නිරීක්ෂණය විය. තත්ත්වයෙන් අසමත්වීමට හේතු වශයෙන් ඇතැම් ඖෂධවල දෘෂ්‍ය අංශු පැවතීම, ප්‍රතිනාම්‍ය හා එක්සත් ජනපද ඖෂධවේද පිරිවිතරයන්ට අනුකූල නොවීම, වර්ණය වෙනස් වීම, බෝතලයේ අඳුරු පැහැති පැල්ලම් තිබීම, අහිතකර ප්‍රතික්‍රියාවන් ඇතිවීම් ආදී කරුණු හඳුනාගෙන තිබුණු අතර ඒ හේතුවෙන් භාවිතය ඉවත් කර හෝ භාවිතය අත්හිටුවා තිබිණි. එලෙස තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කළ වෛද්‍ය සැපයීම් අතර අක්ෂි රෝග, බැක්ටීරියා ආසාදන, දියවැඩියා, හෘද රෝග, පිළිකා, ස්වසන රෝග, සමේ රෝග, මානසික රෝග හා වේදනා නාශක ලෙස භාවිත කරන ඖෂධ තිබුණු බව නිරීක්ෂණය විය. මහනුවර ජාතික රෝහල, සිරිමාවෝ බණ්ඩාරනායක, කුරුණෑගල, ඇඹිලිපිටිය හා කැගල්ල රෝහල්වල පිරිවැය රු. මිලියන 25.71 ක් වූ තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් වර්ග 34 කට වැඩි ප්‍රමාණයක් පැවති අතර එම ඖෂධ හා ශල්‍ය පරිභෝජ්‍ය ද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත් බව නිවේදනය කරන විට ඒවායෙන් සැලකිය යුතු ප්‍රමාණයක් රෝගීන් වෙත නිකුත් කර තිබුණි.

4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, 2025 අප්‍රේල් 07 දින වන විටත් පිළිතුරු නොලත් මුළු විගණන විමසුම් සංඛ්‍යාව 128 ක් වූ අතර, වසරකට වැඩි කාලයක් ගතව ඇතත් පිළිතුරු ඉදිරිපත් නොකළ විගණන විමසුම් සංඛ්‍යාව 45 ක් විය.

4.8 කළමනාකරණ දුර්වලතා

(අ) ගිවිසුම් බැඳුම්කර කඩකළ වෛද්‍ය නිලධාරින්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2025 සැප්තැම්බර් 29 දින නිකුත් කරන ලද සේවය හැරගිය රජයේ වෛද්‍ය නිලධාරින්ගෙන් රජයට අයවිය යුතු ඖෂධ මුදල් හා විදෙස් පුහුණුව ලද විශේෂඥ වෛද්‍ය නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් ගිවිසුම් කඩකළ වෛද්‍ය නිලධාරින් 705 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවති රු. මිලියන 1,156.56 ක මුදලක් අයකරගැනීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) විශේෂ විගණනයේදී විගණනයට ඉදිරිපත් නොකළ වෛද්‍යවරුන් 485 දෙනෙකුගේ පුද්ගලික ලිපිගොනු මෙම වාර්තාවේ දිනය දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම මෙසේ පුද්ගලික ලිපිගොනු ඉදිරිපත් නොකළ වෛද්‍ය නිලධාරීන් 116 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවති රු. මිලියන 119.40 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) විශේෂ විගණන වාර්තාවට අදාළ නියැදිය තොරා ගැනීමෙන් පසුව 2024 සැප්තැම්බර් 29 දින දක්වා හඳුනාගත් සේවය අතහැරගිය වෛද්‍ය නිලධාරීන් 33 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ දිනය දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iv) විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් සේවය අතහැර ගොස් තිබුණු එහෙත් රජය සමඟ ගිවිසුම් බැඳුම්කර අත්සන් කර නොතිබුණු වෛද්‍ය නිලධාරීන් 05 ක් වෙත ගෙවා තිබුණු රු. මිලියන 1.04 ක වැටුප් හා දීමනා සහ අත්තිකාරම් ශේෂ අයකරගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(v) විශේෂ විගණනයේදී හඳුනාගත් සේවය අතහැර ගොස් තිබුණු වෛද්‍ය නිලධාරීන් 1680 කින් වෛද්‍ය නිලධාරීන් 1621 ක් අසාධු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයන් කවරේද යන්න මෙම වාර්තාවේ දිනය දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(vi) විශේෂ විගණන වාර්තාව නිකුත් කිරීමෙන් පසුව හඳුනා ගත් සේවය අතහැර ගිය වෛද්‍ය නිලධාරීන් 344 කගෙන් අයවිය යුතු මුදල් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර මොවුන් අසාධු ලේඛනගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(vii) 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2010/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති XV වැනි පරිච්ඡේදයේ 214 වැනි රීතිය අනුව තනතුර අතහැර ගියා සේ සලකනු ලබන නිලධරයෙකුට ඒ බව වහාම ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ. නමුත් අමාත්‍යාංශය විසින් අනුමත නිවාඩු අවසන් වීමෙන් පසු රාජකාරියට වාර්තා නොකළ වෛද්‍ය නිලධාරීන්ට සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමේ ප්‍රමාද කාලය මාස 02 සිට මාස 239 ක් වැනි දිගු කාල පරාසයක් ගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ආ) කළුතර මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී මහතෙකු තනතුර අතහැර යාම පිළිබඳ පරීක්ෂාව මැයෙන් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 07 දිනැති විගණන වීමසුමට 2022 ජූනි 29 හා 2024 මැයි 27 ලබාදුන් පිළිතුරු පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(i) වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රගතිය විගණනයට වාර්තා නොකෙරුණු අතර වෛද්‍ය නිලධාරීන් 38 කගේ පුද්ගලික ලිපිගොනු අස්ථාන ගතවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරන බව දන්වා තිබුණද එහි ප්‍රගතිය විගණනයට වාර්තා නොකෙරුණි.

(ii) අස්ථාන ගතවූ පුද්ගලික ලිපිගොනු 38 ට අදාළව විගණනය විසින් ඉල්ලුම් කළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණුව සඳහා අවිධිමත් ලෙස පුහුණුවන්නියක් ඇතුළත් කර ගැනීම පිළිබඳ පරීක්ෂාව මැයෙන් 2023 ජුනි 30 හා 2024 මැයි 30 දිනැති විගණන විමසුම් දෙකට 2024 මැයි 25 හා 2024 දෙසැම්බර් 04 දිනයන්හි ඉදිරිපත් කරන ලද පිළිතුරු පරීක්ෂා කිරීමේදී විමර්ශන නිර්දේශ මත වැඩ තහනම් කරන ලද නිලධාරියා සම්බන්ධයෙන් පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණයේ ප්‍රගතිය හා මෙම ක්‍රියාව හේතුවෙන් රජයට අයවිය යුතු රු.3,744,271 ක මුදල අයකර ගැනීමේ ප්‍රගතිය විගණනයට වාර්තා නොකෙරුණි.

(ඈ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහල් පරිශ්‍රයේ ස්ථාන බදුදීම මඟින් ආදායම් ඉපයීම හා එම ආදායම් රජයේ ආදායමට බැරවීම පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2023 දෙසැම්බර් 31 දිනැති අංක HM/CEO/FR135/2024 දරන මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීම-2024 යන මැයෙන් වූ සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛයේ 10.3.5 හා 34.1 හි උපදෙස් මෙන්ම 2024 දෙසැම්බර් 31 දිනැති අංක HM/CEO/FR135/2025 දරන මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීම -2025 වර්ෂය යන මැයෙන් වූ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛයේ 34.1හි උපදෙස් අනුව ආපනශාලා වලින් ලැබෙන ආදායම රජයේ ආදායමට බැරකල යුතු වුවත්, රෝහල් පරිශ්‍රය තුළ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා වෙන්කර ඇති විවේකාගාර ගොඩනැගිල්ලේ වර්ග අඩි 492 ක පමණ ප්‍රමාණයක් සඳහා වර්ෂ 3ට ආසන්න කාලයක් පුරා පවත්වාගෙන යනු ලබන ආපනශාලාවේ කුලී ලෙස රු.7,500 ක් රජයේ ආදායමට බැර නොකර සුභසාධන ගිණුමකට බැර කර තිබුණි.

(ii) ආපනශාලාව ඉරිදා සහ පෝය දින හැර අනෙකුත් දිනවල පෙ.ව. 7.00 සිට ප.ව.6.00 දක්වා විවෘතව පවතින අතර, මේ සඳහා රයිස් කුකර් 02 (5kg සහ 2kg) ක්, දොර දෙකේ ශීතකරණයක්, බ්ලෙන්ඩර් 01 ක් සහ විදුලි හීටරයක් යන විදුලි උපකරණ භාවිතා කරන නමුත් මෙම විදුලි උපකරණ භාවිතා කිරීම සඳහා වන විදුලි ඒකක ප්‍රමාණය සහ පරිභෝජනය කරන ජල ඒකක ප්‍රමාණය තක්සේරු කර ආපනශාලාව පවත්වාගෙන යන අයගෙන් විගණිත දින දක්වාම අයකර ගැනීමට හෝ ඒ සඳහා සුදුසු විකල්ප වැඩ පිළිවෙලක් සකස් කිරීමට රෝහල විසින් කටයුතු කර නොමැති අතර, රෝහල විසින් එම වියදම දරමින් පැවතුණි.

(iii) රෝහල් පරිශ්‍රය තුළ දැනට වසර 04 ක පමණ කාලයක් පුරා පවත්වාගෙන යන සන්නිවේදන පියස පවත්වාගෙන යන පෞද්ගලික පාර්ශවය සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර, රෝහල වෙත රු.3,000 ක මාසික කුලී මුදලක් පමණක් ගෙවමින් පැවතියද, ව්‍යාපාර කටයුතු වෙනුවෙන් ඡායා පිටපත් යන්ත්‍රයක්, විදුලි පංකාවක්, පරිගණක යන්ත්‍රයක් සහ ලැමිනේටින් යන්ත්‍රයක් යන විදුලි උපකරණ භාවිතා කරන නමුත් ඒ සඳහා වැයවන විදුලි ඒකක වෙනුවෙන් ගාස්තුවක් අය නොකර එම වියදම රෝහල මඟින් දරමින් පැවතුණි.

(iv) රෝහල තුළ ස්ථාපිත කොට ඇති ATM යන්ත්‍රය සම්බන්ධයෙන් අදාළ බැංකුව සමඟ ලිඛිත එකඟතාවයක් නොතිබුණි. යන්ත්‍රය වෙනුවෙන් වැයවන විදුලි වියදම රෝහල විසින් ගෙවා තිබුණි.

(v) රෝහල වෙත පැමිණෙන සායනික රෝගීන් සහ රෝගීන් බැලීමට පැමිණෙන අමුත්තන් තාවකාලිකව රැඳී සිටින ගොඩනැගිල්ලේ වර්ග අඩි 100 ක පමණ ප්‍රමාණයක් තුළ 2024 වසරේ සිට පවත්වාගෙන යන වෙළඳසැල සඳහා 2026 ජනවාරි 21 දක්වා වෙළඳසැල් හිමියා විසින් දෙනිකව රු.1,000 ක් බැගින් ගෙවූ රු.340,500 ක මුදලක්, මෙම පරිශ්‍රය වෙනත් බැහැර වෙළඳුන් හට වරින්වර කුලියට ලබා දී 2024 ජනවාරි සිට 2026 ජනවාරි 21 වූ කාල පරිච්ඡේදය තුළ ඉපයූ රු.78,000 ක මුදලක් මෙන්ම රෝහල වෙත පැමිණෙන ජංගම වෙළඳුන්ගෙන් මෙම කාලපරිච්ඡේදය තුළ අයකළ රු.164,600 ක මුදලක් ලෙස එකතු වටිනාකම රු. 583,100 ක මුදලක් රජයේ ආදායමට බැර නොකර රෝහලේ සුභසාධක සමිති ගිණුමට බැරකර තිබුණි. මෙම ස්ථානවලින් ලැබෙන කුලී මුදල් සුභසාධක සංගමයට අයකර ගැනීමට සහ ඉන් සියයට 50 ක මුදලක් රෝහලේ සුළු සංග්‍රහ වියදම් දැරීම සඳහා වූ 2023 නොවැම්බර් 03 දිනැති ඉල්ලීම් ලිපියට රෝහල් අධ්‍යක්ෂ විසින් අනුමැතිය ලබා දී තිබුණ ද, වාර්තා කඩාගැනීමකින් තොරව සුභසාධක සංගමය විසින් රෝහලේ සිදුකරන සුළු සංග්‍රහ වියදම් දරමින් පැවතුණි.

(ඉ) උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ 2025 නොවැම්බර් හා දෙසැම්බර් තුළ පැමිණීමේ ලේඛන පරීක්ෂා කිරීමේදී කාර්යාල කාර්ය මණ්ඩලයේ 23 දෙනෙකු අඛණ්ඩව දින 03ක් තිස්සේ රෝහල තුළ සේවයේ නිරතව තිබුණි. සාමාන්‍ය පුද්ගලයෙකුට මෙසේ විවේකයෙන් තොරව එක දිගට පැය 60කට ආසන්න කාලයක් සේවයේ නිරත විය නොහැකි බැවින් පැමිණීමේ ලේඛනවල නිරවද්‍යතාවය විගණනයේදී පිළිගත නොහැකි විය. දිගුකාලීනව සිදුවන මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කර නිලධාරීන්ගේ පැමිණීම පිටවීම සම්බන්ධ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට රෝහල් කළමනාකරණය පියවර ගෙන නොතිබුණි. තව ද පැමිණීමේ ලේඛනය පෙ.ව.8.30ට වසා දැමීමට කටයුතු නොකරන බැවින් සියලුම නිලධාරීන් පෙ.ව.7.00 යොදා අත්සන් කර තිබුණු බවද නිරීක්ෂණය වූ අතර විගණනයට ලක් කරන ලද 2025 දෙසැම්බර් 18 දින පමණක් විගණන නිලධාරීන් පෙ.ව.8.30ට පැමිණීමේ ලේඛනය වසා දැමූ බැවින් බොහෝ නිලධාරීන් පෙ.ව.8.30න් පසු පැමිණි වේලාව සටහන් කර තිබුණි.

(ඊ) ජල සහ විදුලි බිල්පත් සඳහා නියමිත දිනට ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය 2023-2025 කාල පරිච්ඡේදයට අදාළව ජල බිල්පත් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.762,509ක් ද විදුලි බිල්පත් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.144,566 ක් ද රක්තවාතවේද හා පුනරුත්ථාපන රෝහලෙහි 2023-2025 කාල පරිච්ඡේදයට අදාළව ජල බිල්පත් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.361,169 ක් ද විදුලි බිල්පත් සඳහා රු.1,880,076ක් ද දඩ මුදල් ලෙස ගෙවා තිබුණි. එසේම අම්පාර දිස්ත්‍රික් මහ රෝහල විසින් 2023 ජූලි සිට 2025 අගෝස්තු දක්වා නියමිත දිනට විදුලි බිල්පත් පියවීමට අපොහොසත් වීමෙන් රු.7,392,588 ක දඩ මුදල් ගෙවා තිබුණි.

(උ) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලයක් මඟින් වාර්ෂිකව තොග සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද රක්තවාතවේද හා පුනරුත්ථාපන රෝහලේ ඖෂධ ගබඩාවේ 2021 වර්ෂයෙන් පසු වාර්ෂික තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. එසේ වුවද උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂකගේ 2023 මැයි 29 දිනැති අංක CC/49/RRH/D/2023 දරන ලිපිය මඟින් ඖෂධ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර 2023 මැයි 29 දින අභ්‍යන්තර බෙහෙත් ගබඩාවේ ඖෂධ තොග සමීක්ෂණයක් සිදුකර තිබුණි. ඒ අනුව එදිනට පැවති භෞතික තොග ශේෂයන් ආරම්භක ශේෂයන් ලෙස ගෙන නව තොග පොත් පිළියෙල කර තිබුණි. පැරණි පොත්වල අවසන් ශේෂයන් නව පොත්වල ආරම්භක ශේෂයන් ලෙස සටහන් කිරීමේදී ඖෂධ අයිතම 18කට අදාළව නිවැරදිව සටහන් කර නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.ඒ අනුව ඖෂධ අයිතම 10කට අදාළව ඒකක 9325ක ඌනතාවයක් හා අයිතම 8කට අදාළව ඒකක 3101ක අතිරික්තයක් පැවතුණි.

(ඌ) රක්තවාතවේද හා පුනරුත්ථාපන රෝහලෙහි හා වැලිසර ස්වසන රෝග පිළිබඳ ජාතික රෝහලෙහි, වසර 10 කට අධික කාලයක සිට කිලිටි රෙදිසේදීමේ කොන්ත්‍රාත්තුව ලබාගත් කොන්ත්‍රාත්කරු විසින් රෙදි සෝදා පිරිසිදු කර, වියලා, ඉස්ත්‍රික්ක කිරීම යනාදී සියලු කාර්යයන් රෝහල් පරිශ්‍රයේම සිදු කරනු ලබයි. මේ වෙනුවෙන් වැයවන විදුලිය , ජලය රෝහල මඟින් දරනු ලැබුවද ජල හා විදුලි මීටර් සවිකර එම වැයවන මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) වක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව අක්කරපත්තුව මූලික රෝහල ඇඟිලි සලකුණු මත පදනම් වූ පැමිණීමේ පද්ධතියක් භාවිතා කර නොතිබුණු අතර විගණනය විසින් සිදුකරන ලද පරීක්ෂාවන්ට අනුව ව්‍යාජව පැමිණීම හා පිටවීම සටහන් කිරීම තහවුරු විය. විශේෂයෙන් සති අන්තවල, නියමිත රාජකාරි නොමැතිව අතිකාල දීමනා අක්‍රමවත් ලෙස ගෙවන ලද අවස්ථා අනාවරණය විය. ඒ අනුව, රෝහලේ පරිපාලන හා මූල්‍ය අංශවලට අනුයුක්ත නිලධාරීන්ට රුපියල් 5,654,878 ක් අතිකාල විධිමත් නොවන ලෙස ගෙවා තිබුණි.

(ඒ) ගාල්ල ජාතික රෝහල් පරිශ්‍රය තුළ බාහිර කොන්ත්‍රාත්කරුවන් හා බාහිර ආයතන 06 ක් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධිමත් අවසරයක් හෝ අනුමැතියකින් තොරව රෝහල් පරිශ්‍රයේ වර්ග මීටර් 1207.4 ක පමණ භූමි ප්‍රමාණයක අනවසරයෙන් වැඩබිම් හා කාර්යාල පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. මෙම කාර්යාල සඳහා බිම් කුලී අයකිරීමක් හෝ

කාර්යාල සඳහා භාවිතා කරනු ලබන ජලය හා විදුලිය වෙනුවෙන් කිසිදු ගාස්තුවක් රජයට අයකිරීමකින් තොරව පවත්වාගෙන යාමට රෝහල් බලධාරීන් විසින් ඉඩ ලබා දී ඇති බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 04 වන වගන්තියට අනුකූල නොවන පරිදි අංක 36/23 දරන නිල නිවස, ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ කාර්යාලය වෙනුවෙන් වෙන් කර දී තිබුණු අතර අදාළ පරිච්ඡේදයේ 05 වන වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා 2024 සැප්තැම්බර් 05 දිනැති තක්සේරු වාර්තාවට අනුකූලව, එකතුව රු. 716,000 ක් වූ නිවාස කුලී අයකර නොතිබුණි.

(ඔ) 2015 නොවැම්බර් 06 දිනැති අංක 15/1692/718/018 දරන සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කරන ලද "තෝරාගත් තෘතීය සත්කාර රෝහල්වල රාජකාරී වේලාවෙන් පසු සිදු කෙරෙන ශල්‍යකර්ම ආරම්භ කිරීම" නම් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව හදවත් සැත්කම් කඩිනම් කිරීම තුළින් ඒ සඳහා පවතින දිගු පොරොත්තු ලේඛන අවම කිරීමේ අරමුණින් රාජකාරී වේලාවෙන් පසු සේවය කරන කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් යාන්ත්‍රණයක් සහිතව ජනාධිපති අරමුදලේ ප්‍රතිපාදන යටතේ එවකට කරාපිටිය ශික්ෂණ රෝහලේ හා තවත් රෝහල් 03 කට හෘද ශල්‍යකර්ම කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ එක් ශල්‍යකර්මයකට රු. 57,500 ක් බැගින් වූ දිරි දීමනාවක් ගෙවීමට ජනාධිපති කාර්යාලයේ 2016 මැයි 02 දිනැති අංක පීඑෆ්/ඕ/23812 දරන වක්‍රලේඛය මඟින් අධිකාරිය ලබාදී තිබුණි. එක් මසක් ඇතුළත එක් ශල්‍ය ඒකකයක් තුළ රාජකාරී වේලාවෙන් පසුව අවම වශයෙන් සිදු කරන විවෘත හදවත් සැත්කම් ප්‍රමාණය 50 ක් ඉක්මවන විට, 2016 ජූලි 01 සිට එක් විවෘත හදවත් සැත්කමක් වෙනුවෙන් ගෙවන දිරි දීමනාව රු.81,000 ක් දක්වා වැඩිකර තිබුණු අතර පසු කාලීනව එම දීමනාව නැවතත් රු.95,000 හා 125,000 ක් දක්වා වැඩිකර තිබුණි. මෙම දිරි දීමනාව කාර්යමණ්ඩලයට ගෙවීමට කොන්දේසි 8 ක් සම්පූර්ණ කළ යුතු බවට සඳහන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් කරාපිටිය ජාතික රෝහලට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ජනාධිපති අරමුදලේ ලේකම්ගේ 2016 මැයි 02 දිනැති අංක පීඑෆ්/ඕ/23812 දරන වක්‍රලේඛයේ 2 කොන්දේසියට අනුව ශල්‍යකර්ම සඳහා ගෙවීම් කිරීමට හැකි වන්නේ ශල්‍ය කණ්ඩායමක් රාජකාරී වේලාවෙන් පසුව (සවස 4 න් පසුව) සිදුකරන සැත්කම් සඳහා වුවත් ගාල්ල ජාතික රෝහල විසින් විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව 2020 සිට 2025 වර්ෂයේ මැයි මාසය දක්වා කාලය තුළ සිදු කළ විවෘත හදවත් සැත්කම් 1133 ක් වෙනුවෙන් රු. 84,124,500 ක් ගෙවීම් කර තිබුණ ද ඉන් සැත්කම් 1092 ක්ම රාජකාරී වේලාව තුළදී සිදු කර ඇති බව නිරීක්ෂණය විය.

(ii) ජනාධිපති ලේකම් කාර්යාලය විසින් රෝහල වෙත යොමුකර තිබුණු 2018 අගෝස්තු 03 දිනැති හා අංක පීඑෆ්/ඕ/23812 දරන ලිපිය ප්‍රකාරව එක් මසකට සිදු කරනු ලබන විවෘත හදවත් සැත්කම් ප්‍රමාණය 50 කට වැඩි නම් පමණක් රාජකාරී වේලාවෙන් පසුව සිදු කරනු ලබන එක් හදවත් සැත්කමක් සඳහා රු. 81,000 ක දීමනාවක් ගෙවීම් කිරීමට නිර්දේශ කර තිබුණි. ඒ අනුව විගණන පරීක්ෂාවට

ලක්වුණු 2020 වර්ෂයේ සිට 2025 මැයි දක්වා කාලය තුළදී මසකට සිදු කරනු ලබන විවෘත හදවත් සැත්කම් ප්‍රමාණය එක් එක් මාසවලදී 50 ක සීමාව ඉක්මවා නොතිබිය දී හා රු.81,000 ක දීමනාවක් ගෙවීමට අවශ්‍ය කොන්දේසි ද සපුරා නොමැතිව අදාළ කාලපරිච්ඡේදය තුළ සිදුකර තිබුණු මුළු හදවත් සැත්කම් 1133 ක ප්‍රමාණයක් වෙනුවෙන් එකතුව රු.18,977,000 ක් දීමනා නිසි අධිකාරියකින් තොරව ගෙවා තිබුණි.

(iii) ජනාධිපති ලේකම්ගේ 2018 අගෝස්තු 03 දිනැති හා අංක පීඑස්/ඕ/23812 දරන චක්‍රලේඛයේ (3) කොන්දේසිය ප්‍රකාරව "මෙම ගෙවීම් ලබන සේවක පිරිස්වලට අතිකාල සහ වෙනත් ගෙවීමක් සඳහා හිමිකම් නොලැබේ" ලෙස සඳහන් වූවද, අදාළ සැත්කම් සිදුකළ වෛද්‍යවරුන් ඇතුළු සමස්ථ කාර්යමණ්ඩලය සඳහා චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූල නොවී 2022, 2023 හා 2024 වර්ෂවලදී පමණක් එකතුව රු.124,209,296 ක්වූ අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවා තිබුණි.

(ඕ) ගාල්ල ජාතික රෝහල තුළ පවත්වාගෙන යනු ලබන ආපනශාලා හා අලෙවිසැල් 07 ක් වෙනුවෙන් එක් එක් බදුකුලී හිමියන් විසින් 2024 වර්ෂයේ සිට 2025 ඔක්තෝබර් 31 දක්වා කාලය තුළ දී එකතුව රු.24,632,747 ක්වූ බදුකුලී ආදායම් රෝහලට ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2025 ජනවාරි 01 දිනැති අංක MH/DEV/WF/02/2025 දරන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලිපිය හා 2023 ජුනි 23 වැනි දිනැති අංක 02 – 92/2023 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව රෝහල් සඳහා ආපනශාලා පවත්වාගෙන යාමේ සැපයුම්කරුවන් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් තෝරාගත යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 හා 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහවල මාර්ගෝපදේශයන්ට අනුගතවීමෙන් තොරව හෙද නිලධාරී ආපනශාලාව හෙද නිලධාරී සුබසාධක සංගමය විසින් පවත්වාගෙන ගෙන ගොස් තිබුණු අතර වෙනත් බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට විවිධ කාල පරාසයන් සඳහා රු.60,000, රු.80,000 හා රු.130,000 බැගින් වූ බදුකුලියක් මාසිකව සුබසාධක සංගමයට ගෙවීමේ පදනම මත උප බදු ලබා දී සුබසාධක සංගමය විසින් මාසිකව ආපනශාලා තක්සේරු කුලිය පමණක් රෝහලට ගෙවා තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ සිට 2026 ජූලි දක්වා වූ විගණිත කාල පරිච්ඡේදයට අදාළව රෝහලට උපයා ගැනීමට හැකිව තිබුණු එකතුව රු. 1,960,000 ක් වූ බදුකුලී ආදායමක් අහිමි වී තිබුණි.

(ii) හෙද නිලධාරී ආපනශාලාව 2023 ජූලි 01 සිට 2025 ජුනි 30 දක්වා වසර 2 ක කාලයකට රු. 30,000 බැගින් ද 2025 ජූලි 01 දින සිට අවුරුදු 2 ක කාලයක් සඳහා රු. 45,000 බැගින්ද බදුකුලිය තක්සේරු කර තිබුණු අතර, ආපනශාලාව හෙද නිලධාරීන් පමණක් භාවිතා කරන බව පාදක කරගනිමින් තක්සේරු වටිනාකමින් සියයට 50 ක් අඩුකර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු බදුකුලිය ගණනය කර තිබුණු අතර 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12

(3) ව්‍යවස්ථාවට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණි. ඒ අනුව රජයට උපරිම වාසියක් ලැබෙන පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් 2023 ජූලි 01 සිට 2025 නොවැම්බර් 30 දක්වා එකතුව රු.1,065,000 ක බදු කුලියක් රෝහලට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

(iii) වෛද්‍ය නිලධාරී ආපනශාලාව ආරම්භ කළ දින සිටම වෛද්‍ය නිලධාරී සුභසාධන සංගමය මඟින් පවත්වාගෙන යමින් රජයට තක්සේරු කුලිය පමණක් ගෙවා තිබුණු අතර විගණිත දිනය වන විට එසේ රාජ්‍ය ආදායමට බැර නොකර පවතින රු.310,000 ක මුදලක් වෛද්‍ය නිලධාරී සුබසාධක සංගමය තුළ පැවතුණි. වෛද්‍ය නිලධාරී ආපනශාලාව තක්සේරු කිරීමේදී ආපනශාලාවට අයත් කෑම ගන්නා ස්ථානයේ (Dining area) වර්ග අඩි 529 ක් තක්සේරුවට භාජනය නොකර කෑම පිසීමට භාවිතා කරන ස්ථානයේ ඇති වර්ග අඩි 470 ක් පමණක් සැලකිල්ලට ගෙන තක්සේරු වටිනාකම ගණනය කර තිබුණු බැවින් මාසික තක්සේරු බදුකුලිය අඩුවෙන් තක්සේරු කර තිබුණි.

(iv) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිවිඡේදයේ 12(3) ව්‍යවස්ථාවට අනුකූල නොවන පරිදි වෛද්‍ය වරුන්ගේ ආපනශාලාව වෛද්‍යවරුන්ට පමණක් ඇතුළුවිය හැකි ලෙස ගණුදෙනුකරුවන් සීමා කිරීම හේතුවෙන් තක්සේරු වටිනාකමින් සියයට 50 ක් අඩුකර මාසික බදුකුලිය ගණනය කර තිබුණු අතර 2025 ජූලි 01 සිට 2025 නොවැම්බර් දක්වා වර්ග අඩියක් සඳහා රු.200 බැගින් වර්ග අඩි 999 ක් සඳහා එකතුව රු.199,800 ක් ලෙස තක්සේරු විය යුතු වුවත්, එය රු. 45,000 ක් ලෙස තක්සේරු කිරීමෙන් රු.154,800 ක් අඩුවෙන් තක්සේරු කර තිබුණි. එසේම 2023 ඔක්තෝබර් 26 සිට 2025 ජුනි 30 දක්වා වර්ග අඩියක් රු.175 ක් ලෙස වෙළඳපොළ මාසික කුලිය රු. 174,825 ක් ලෙස තක්සේරු විය යුතු වුවත් එය රු. 35,000 ක් ලෙස එනම් රු. 139,825 ක් අඩුවෙන් තක්සේරු කර තිබුණි. ඒ අනුව නිවැරදිව වෙළඳපොළ බදුකුලිය තක්සේරු නොකිරීම නිසා 2023 නොවැම්බර් සිට විගණිත දිනය වූ 2025 නොවැම්බර් දක්වා එකතුව රු.2,981,300 ක බදුකුලී ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(v) 2022 අගෝස්තු 25 දිනැති අංක 2294/51 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා 2024 අගෝස්තු 21 දිනැති අංක 2398/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයන් අනුව, ජල සම්පාදන මණ්ඩලය මඟින් රෝහල් සඳහා අනුමත ඒකක ජල ගාස්තුව පිළිවෙලින් රු. 69 ක් හා 95 ක් වුවත් රු. 58 බැගින් ආපනශාලා සඳහා ජල ගාස්තු අයකර ඇති බව නිරීක්ෂණය වූ අතර 2024 වර්ෂයේ සිට විගණිත දිනය දක්වා එකතුව රු.184,462 ක් අඩුවෙන් අයකිරීම හේතුවෙන් රජයට අලාභයක් සිදු වී තිබුණි.

(ක) ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහලෙහි 2024/2025 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවාව සඳහා වාර්ෂික මුළු පිරිවැය රු.54,391,073 කට එකඟව තිබුණි. එහි අඩංගු වෙනත් පොදු කාර්ය පිරිවැය සඳහා රු.11,313,600 ක වටිනාකමක් ඇතුළත් කර තිබුණු අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 99 ක වර්ධනයක් බව ද සේවයේ නියුතු සේවක සංඛ්‍යාව

37 සිට 65 ක් ලෙස පෙර වසරට සාපේක්ෂව සියයට 76 කින් වැඩි වී තිබුණු බව ද විගණනයේදී නිරීක්ෂණය විය. ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල් ගොඩනැගිල්ලේ බිම් මහලේ සිට පස්වන මහල දක්වා සමස්ත වර්ග මීටර් ප්‍රමාණය 28173.81 ක්ව තිබුණු අතර රෝහලේ කොරිඩෝ සහ ලොබි වලට අයත් වර්ග මීටර් ප්‍රමාණය 8631.39 ක් වී තිබූ අතර එය රෝහලේ මුළු වර්ගමීටර් ප්‍රමාණයෙන් සියයට 30 ක් වූයෙන් පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය හා පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය වැඩි කිරීමට සිදු වී තිබීමෙන් පොදුකාර්ය පිරිවැයට හා පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලයට කරන ගෙවීම් සඳහා විශාල මුදලක් රෝහලට වැය වී තිබුණි. කෙසේ නමුත් රු.4,631,400 ක් වූ පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය ලැයිස්තුව අනුව නියමිත රසායනික ද්‍රව්‍ය සංයුතිය හා ප්‍රමාණය අඩංගු බවට ඇසුරුමෙහි විධිමත් පරිදි සඳහන් විය යුතු වුවත්, 2025 පෙබරවාරි 14 වන දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අදාළ පිරිසිදු කිරීමේ ද්‍රව්‍යවල ඇසුරුමෙහි අදාළ ප්‍රමිතින් විධිමත් පරිදි සඳහන් නොවූ බැවින් නියමිත ප්‍රමිතියෙන් හා වර්ගයෙන් යුත් පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සහ උපකරණ භාවිතා නොකිරීම හේතුවෙන් කොරිඩෝවල ඇති ටයිල් කලු පැහැතිව දුර්වර්ණව පැවතුණි. වාර්ෂික පිරිවැය ලේඛනයෙහි අංක 07 හි වෙනත් පොදුකාර්ය යටතේ මාසිකව/වාර්ෂිකව සැපයිය යුතු එකතුව රු.3,513,600 ක් වටිනා උපකරණ ලැයිස්තුවට අනුව සැපයීමට එකඟ වූ උපකරණ වලින් ඒකක 78 ක් සපයා නොතිබුණු බවද සැපයීමට එකඟ වී ඇති වර්ගයන්ගෙන් හා ප්‍රමිතියෙන් තොර බව ද නිරීක්ෂණය වූයෙන් පිරිසිදු කිරීමේ සේවා වලින් ගුණාත්මක හා සතුටුදායක සේවාවක් ඉටුවී නැති බවට නිරීක්ෂණය විය.

(ඛ) කළුතර ශික්ෂණ රෝහල 2024/2025 වර්ෂයේදී පිරිසිදු කිරීමේ කටයුතු සඳහා යොදා ගනු ලබන ගිවිසුම්ගත කම්කරුවන් සංඛ්‍යාව වූ 150 ක ප්‍රමාණය ඉකුත් වර්ෂයේ සංඛ්‍යාව සමඟ සැසඳීමේදී කම්කරුවන් 10 දෙනෙකුගේ ප්‍රමාණයෙන් වැඩිවී ඇති බැවින් ඉකුත් වර්ෂයේ ගෙවා ඇති පොදුකාර්ය පිරිවැය අගයට සියයට 20 ක ප්‍රතිශතයක් එකතුකොට ගෙවීම සුදුසු බවට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබුණි. එසේ වුවද 2025 ජනවාරි සිට ජුනි දක්වා කාල පරිච්ඡේදයට අදාළව වැටුප් ගෙවීමට පදනම් කර ගෙන තිබුණු මාසික පැමිණීමේ වාර්තා අනුව සත්‍ය වශයෙන් සේවයේ යොදා තිබුණු කම්කරුවන් සංඛ්‍යාව 140 කට වඩා අඩු තත්ත්වයක් යටතේ කම්කරුවන් සංඛ්‍යාව වැඩි කිරීමකින් තොරව පෙර වර්ෂයේ පිරිවැයට සියයට 20 ක් එකතු කොට මාසිකව රු. 181,484 ක් බැගින් මාස 06 ක කාල පරිච්ඡේදයක් සඳහා රු.1,088,904 ක මුදලක් පොදුකාර්ය පිරිවැය ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

(ග) 2023 අගෝස්තු 15 දින කාර්මික තාක්ෂණ ආයතනයේ තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා යොමුකර තිබුණු කළුතර ශික්ෂණ රෝහලේ පිරිසිදු කිරීමේ කටයුතුවලට යොදා ගනු ලබන රසායනික ද්‍රව්‍ය සාම්පල් තත්ත්ව පරීක්ෂණ තුලින් අසමත් බවට වාර්තා කර තිබුණද එම තත්ත්වය පසුව නිවැරදි වී ඇද්ද යන්න තහවුරු කර ගැනීමට නැවත පරීක්ෂණයක් සිදුකිරීම 2024 දෙසැම්බර් 26 දින දක්වා ප්‍රමාද කර තිබුණි. එසේම පරීක්ෂණ දින වන විට වර්ෂයකට අධික කාලයක් සාම්පල් අසමත් බවට තහවුරු වූ තත්ත්වයෙන් බාල රසායනික ද්‍රව්‍ය පිරිසිදු කිරීමේ කටයුතු වෙනුවෙන් යොදාගෙන තිබුණද රෝහල මඟින් පත්කරන ලද කමිටු තීරණයක් මත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සපයා තිබුණු තත්ත්වයෙන් බාල රසායනික ද්‍රව්‍යවලට අදාළ මුදල් සේවා සැපයුම්කරුගෙන් අයකර

ගෙන තිබුණද එසේ 2024 වර්ෂය වෙනුවෙන් අය කර ගත යුතු රු.864,550 ක මුදලක් සේවා සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඝ) ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල සම්බන්ධයෙන් 2025 අප්‍රේල් 10 දින නිකුත් කළ විගණන විමසුමෙහි සඳහන් පහත කරුණු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි වැටලීම් අංශය විසින් විමර්ශනයක් සිදුකරමින් පවතින බවත්, එකී වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් 2025 ජූලි 19 දින විගණනයට වාර්තාකර තිබුණද, මෙම වාර්තාවේ දිනය දක්වා ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග හෝ අදාළ විමර්ශන වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(i) අධ්‍යක්ෂකගේ නිල නිවාසය සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීමකින් තොරව රු.239,535 ක් වටිනා ශෘහභාණ්ඩ හා විදුලි උපකරණ මිලදී ගැනීම.

(ii) අධ්‍යක්ෂකගේ නිල නිවාසයේ 2024 දෙසැම්බර් 02 දිනට පසු කුකුල් කූඩුවක් සකස් කර එය 2025 මාර්තු 25 දින වනවිට කඩාදමා තිබීම.

(iii) රෝහල සතු ගිලන් රථයක් අධ්‍යක්ෂකගේ පුද්ගලික නිවස වෙත යාම සඳහා භාවිතා කිරීම.

(ච) කැගල්ල දිස්ත්‍රික් මහ රෝහලෙහි සායනික අපද්‍රව්‍ය දහනය සඳහා පැයකට අපද්‍රව්‍ය කිලෝ 150 ක් දහනය කළ හැකි කසල දහන යන්ත්‍රයක් යුනිස්කෝ සංවිධානයේ අනුග්‍රහයෙන් ලබා දී 2024 සැප්තැම්බර් 02 දින වන විට සවි කිරීම කටයුතු නිම කර ඇති බව සහ 2025 ජනවාරි 05 දින ඊට අදාළ වගකීම් සහතික යුනිසෙෆ් ආයතනය සහ කැගල්ල මහ රෝහල වෙත සැපයුම් ආයතනය ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම යන්ත්‍රය රෝහල වෙත විධිමත්ව භාර ගැනීම 2025 සැප්තැම්බර් 17 දක්වා ප්‍රමාදව තිබුණි. ඒ අනුව යන්ත්‍රය භාර ගැනීම/භාර දීම ප්‍රමාද වීම හේතුවෙන් සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික ආයතනයක් වෙත රු.4,813,813 ක් ගෙවීම් කර තිබුණි.

(ii) කසල දාහක යන්ත්‍රය (incinerator) රෝහල විසින් 2025 සැප්තැම්බර් 17 දින විධිමත්ව භාර ගෙන තිබුණු නමුත්, 2025 සැප්තැම්බර් 18 දින අපද්‍රව්‍ය කිලෝ එකකට රු.260 බැගින් වැට් රහිත මිලට කසල කිලෝ 60,000 ක් දහනය කිරීම සඳහා පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කර තිබුණු අතර, 2025 සැප්තැම්බර් 19 සිට ඔක්තෝබර් 24 දක්වා මාස 02 ක කාලය සඳහා පමණක් කසල කිලෝ 40125 ක් බැහැර කිරීම සඳහා වැට් සහිත වටිනාකම රු.12,310,350 ක් ගෙවීමට කටයුතු කර තිබුණි.

(iii) යුනිසෙෆ් ආයතනයේ අනුග්‍රහයෙන් ලබා දුන් කසල දහන යන්ත්‍රය (incinerator) සඳහා අදාළ සැපයුම්කාර ආයතනය අවම යන්ත්‍ර ක්‍රියාකාරුවන් දෙදෙනෙකුට නඩත්තු කටයුතු සම්බන්ධ පුහුණුවක් ලබා දීමට ගිවිසුම්ගත වී තිබුණි. එසේම,

යන්ත්‍රය සියයට 80 ක ධාරිතාවයෙන් ක්‍රියාත්මක කළද, රෝහල් දත්ත අනුව සාමාන්‍ය මාසිකව ජනනය වන කසල ප්‍රමාණය දින 09 ක් තුළ දහනය කිරීමේ හැකියාව තිබියදී යන්ත්‍රය රෝහල මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකර වෙනත් බාහිර ආයතනයකට සායනික අපද්‍රව්‍ය කිලෝ එකකට රු.60 බැගින් දහනය කිරීම සඳහා ලංසු ප්‍රදානය කිරීම නිසා අවම වශයෙන් වර්ෂකයට රු.7,560,000 ක් වැය කිරීමට සිදු වීමෙන් රජයට අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

(ඡ) කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරය පිළිබඳ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ASHRAE/ASHE STANDRD අනුව එදිනෙදා සාමාන්‍ය මළ සිරුරු ගබඩා කිරීම සඳහා සෙල්සියස් අංශක +2 ත් +4 ත් අතර මට්ටමේ ශීතාගාර භාවිතා කළ යුතු අතර හදුනා නොගත් මළ සිරුරු ගබඩා කිරීම සඳහා සෙල්සියස් අංශක -15 ත් -25 ත් අතර මට්ටමේ ශීතාගාර භාවිතා කළ යුතුය. ජාතික රෝහලේ මෘත ශරීරාගාරය තුළ පවතින ශීතාගාර 08 ම සෙල්සියස් අංශක +5 මට්ටමේ පවතින බැවින් මළ සිරුරු නරක් වීමෙන් ඇතැම් දිනවල රෝහල අවට දැඩි දුර්ගන්ධයක් වහනය වන අතර විෂබීජ පැතිරීමේ නොවැළැක්විය හැකි අවදානමක් පැවතුණි.

(ii) භාවිතා කරනු ලබන මෘත ශරීරාගාරය තුළ එකවර මළ සිරුරු 64 ක් ගබඩාකළ හැකි පරිදි ශීතාගාර 08 ක් පැවතියද ඉන් සිරුරු 22 ක් ගබඩා කළ හැකි ශීතාගාරය හා එකවර මළ සිරුරු 06 බැගින් ගබඩා කළ හැකි ශීතාගාර 05 ක් ඉතා පැරණි මෙන්ම නිරන්තරයෙන් අක්‍රිය තත්ත්වයට පත්වන අතර නිතර අළුත්වැඩියා කිරීමට සිදුවේ. ඒ හේතුවෙන් දෛනිකව මෘත ශරීරාගාරය වෙත භාරදෙන මළ සිරුරු ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ශීතාගාර පහසුකම් නොමැතිවීම හේතුවෙන් එක් මළ සිරුරක් ගබඩාකළ හැකි ශීතාගාර කුටියක් තුළ සිරුරු කිහිපයක් ගබඩා කිරීමට සිදුවී තිබුණි.

(iii) ශීතාගාර මුදල් රෙගුලාසි 454 (2) පරිදි ඉන්වෙන්ට්‍රි ගත කිරීමක් සිදු කර නොතිබුණු බවත් මුදල් රෙගුලාසි 756 පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් විසින් සමීක්ෂණයට ලක්කර පාවිච්චියට ගත නොහැකි ශීතාගාර පවතිනම් ඒ පිළිබඳ ආයතන ප්‍රධානීන් දැනුවත් කළ යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි.

(iv) 2025 අගෝස්තු 14 දින සිදුකරන ලද විගණන පරීක්ෂාවේ දී මෘත ශරීරාගාරය තුළ හඳුනානොගත් මළ සිරුරු 15ක් ගොඩගැසී තිබුණු අතර එම මළ සිරුරු දින 11ත් දින 483ත් අතර කාල පරාසයක් තිස්සේ ශීතාගාර තුල ගබඩා කර තිබුණි. ඉතා පැරණි මළ සිරුරු දියවී ගොස් හඳුනාගත නොහැකි අන්දමින් අස්ථි පමණක් ඉතිරිව තිබුණු බවත් නැවතත් 2026 ජනවාරි 14 දින සිදු කරන ලද පරීක්ෂාවේදී හඳුනානොගත් මළ සිරුරු 37ක් පවතින බවත් ඒවා දින 02 ක් හා දින 117 අතර කාලයක් තිස්සේ ශීතාගාර තුළ රඳවා තිබුණි. මෙලෙස ප්‍රධාන මෘතශරීරාගාරයෙහි

ශීතාගාර තුළ දිගු කාලයක් තිස්සේ මළ සිරුරු ගබඩා කර පැවතීම හේතුවෙන් ශීතාගාර ඉඩකඩ අවශ්‍ය අලුතින් එකතු වන මළ සිරුරු සඳහා ශීතාගාර ඉඩ පහසුකම් අවහිරවීමක් සිදුවන බැවින් එම මළ සිරුරු හැකි ඉක්මනින් භාරකරුවන් වෙත භාර දීම සඳහා පවතින ක්‍රමවේදය විධිමත් කිරීමට කටයුතු කළයුතු බව නිරීක්ෂණය විය.

(v) මෘත ශරීර 06 බැගින් ගබඩා කළ හැකි මෘතශරීරාගාර ශීතකරණ 07 හි එයට අදාළ සියළුම කොටස් එක ඒකකයක් ලෙස පවතින බැවින්, ඒවායෙන් පිටවෙන උණුසුම් වාතය ඉවතට නොයෑම හා මෘත ශරීරාගාරය තුළ උෂ්ණත්වය වැඩිවීම ශීතකරණවල කාර්යක්ෂමතාවය හීනවීම කෙරෙහි බලපානු ලබයි. ශීතාගාර ස්ථානගතව ඇති කොටසෙහි වාතය සංසරණය වීම සඳහා පිටයුරු පංකා (Exhaust fan) සමහ වායු පෙරණ පද්ධතියක් සවිකර පිරිසිදු කරන ලද වාතය ලෙස බාහිර ඉහල වායු ගෝලයට මුදා හැරීමට කටයුතු නොකිරීමෙන් ශීතාගාර පිරිසිදු කිරීමේදී පිටවන අපවිත්‍ර වාතය වායුසමන යන්ත්‍ර ස්ථාපිත කොට ඇති ප්‍රදේශයේ වාතය සමහ මිශ්‍රවීමෙන් මෙහි සේවය කරන කාර්යමණ්ඩලය මෙන්ම මෙහි පැමිණෙන බාහිර පුද්ගලයන්ට සෞඛ්‍ය ගැටළු ඇතිවීමේ අවදානමක් පැවතුණි.

(ඡ) කොළඹ ජාතික රෝහල විසින් ප්‍රතික්‍රියක මිලදී ගැනීම හා භාවිතය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වෛද්‍ය සැපයුම් අංශය විසින් රසායනාගාර ප්‍රතික්‍රියක ඇතුළු රසායනාගාර අයිතම මිලදී ගැනීමේදී භාණ්ඩ භාරගන්නා දිනට ඉතිරි අයුකාලය (Shelf Life) සියයට 85 ක් විය යුතු වුවත්, කොළඹ ජාතික රෝහල විසින් ප්‍රතික්‍රියක මිලදී ගැනීම සම්බන්ධයෙන් තිබිය යුතු අවම ආයු කාලයක් නිශ්චිතව නියම කර නොතිබුණි. 2024 වර්ෂයේ අවස්ථා 08 කදී මිලදී ගෙන තිබුණු රු.මිලියන 4.56 ක් වූ ප්‍රතික්‍රියක මිලදී ගන්නා විටත් කල් ඉකුත් වී තිබුණු අතර භෞතික පරීක්ෂාවේදී 2025 අප්‍රේල් මස වනවිට රු. මිලියන 12.89 ක් වූ ප්‍රතික්‍රියක රෝහලේ අභ්‍යන්තර රසායනාගාරය තුළ කල් ඉකුත් වී තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 756 හා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2024 ඔක්තෝබර් 22 දිනැති අංක 01-38/2024 දරන වක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික තොග සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද 2024 වර්ෂයට අදාළව රසායනාගාර තුල පවතින තොග සම්බන්ධව වාර්ෂික තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(iii) ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබීම හේතුවෙන් ප්‍රතික්‍රියක ඇතුළු රසායනික ද්‍රව්‍ය අනාරක්ෂිතව රෝහල් ගොඩනැගිල්ලේ කොරිඩෝව මත හා රසායනාගාර තුළ අව්ධිමත්ව ගොඩගසා තිබුණි. තවද ප්‍රතික්‍රියක හා රසායනාගාර ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා රෝහල සතුව පවතින ශීතාගාර 4 න් 2ක් පමණක් භාවිතා කරනු ලබන අතර ඉතිරි ශීතාගාර 2 න් එක් ශීතාගාරයක දොර මීයන් විසින් හානි කිරීම හේතුවෙන් වසර දෙකක කාලයක සිට භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර අනෙක විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්ගේ පරිහරණය සඳහා ලබාදී තිබුණි.

(ට) රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතනවල ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකක පවත්වාගෙන යාම පිළිබඳව සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

01	2026 වන විට, අ. ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන (PMCU සහ දිස්ත්‍රික්/ප්‍රාදේශීය රෝහල්) හි බාහිර රෝගී සේවා භාවිතය (වයස, ස්ත්‍රී-පුරුෂ භාවය, පදිංචි ස්ථානය, දිස්ත්‍රික්කය සහ පළාත අනුව වර්ගීකරණය කරන ලද) අවම වශයෙන් 20.0% කින් ඉහළ යාම (2021 මූලික අගය: කාන්තාවන්ගෙන් 28.5% ක් සහ පිරිමින්ගෙන් 23.4% ක්).	බාහිර රෝගී සේවා ලබාගත් ජනගහනයේ ප්‍රතිශතය මූලික මට්ටම (2021): කාන්තාවන්: 28.5% පිරිමින්: 23.4% (2022 වාර්ෂික වාර්තාව - 2021 මූලික ගෘහස්ථ සමීක්ෂණය) මූලික සමීක්ෂණය වසරේ දෙවන සහ තෙවන කාර්තු තුළ සිදු කර තිබීම සහ වෙනත් දත්ත මූලාශ්‍රයක් නොතිබීම හේතුවෙන්, එම සමීක්ෂණයේ ප්‍රතිඵල මූලික මට්ටමේ අගයන් ලෙස සලකන ලදී.	බාහිර රෝගී සේවා ලබාගත් ජනගහනයේ ප්‍රතිශතය (මූලික දත්ත - 2021): කාන්තාවන්: 28.5% පිරිමින්: 23.4% (2024 වාර්ෂික වාර්තාව - 2021 මූලික ගෘහස්ථ සමීක්ෂණය) මූලික සමීක්ෂණය වසරේ දෙවන සහ තෙවන කාර්තු තුළ සිදු කර තිබීම සහ වෙනත් දත්ත මූලාශ්‍රයක් නොතිබීම හේතුවෙන්, එම සමීක්ෂණයේ ප්‍රතිඵල මූලික අගයන් (baseline values) ලෙස සලකන ලදී.	මූලික අවස්ථාවේදී (2021) බාහිර රෝගී සේවා ලබාගත් ජනගහනයේ ප්‍රතිශතය: කාන්තා: 28.5% පිරිමි: 23.4% (2024 වාර්ෂික සමීක්ෂණ වාර්තාව) 2021 මූලික ගෘහස්ථ සමීක්ෂණය (අවසාන අදියරේ සමීක්ෂණ දත්ත 2026 දී ලබාගත හැකි වනු ඇත) මූලික සමීක්ෂණය වසරේ දෙවන සහ තෙවන කාර්තු තුළ සිදු කර තිබීම සහ වෙනත් දත්ත මූලාශ්‍රයක් නොතිබීම හේතුවෙන්, එම සමීක්ෂණයේ ප්‍රතිඵල මූලික අගයන් (baseline values) ලෙස සලකන ලදී.
02	2026 වන විට, ආ. PHC සේවාවන් පිළිබඳ දැනුම සහ තෘප්තිය වාර්තා කරන රෝගීන් (වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ දිස්ත්‍රික්කය අනුව වෙන් කර ඇත) අවම වශයෙන් 20.0% කින් වැඩි විය (2021 මූලික පදනම්: කාන්තාවන්ගෙන් 58.1%ක් සහ පිරිමින්ගෙන් 47.3%ක් ප්‍රාථමික සෞඛ්‍ය සේවා (PHC) පිළිබඳව දැනුමක් ඇති බව වාර්තා කළ අතර,	දැනුම (70 හෝ ඊට වැඩි දැනුම් මට්ටමක් පෙන්නුම් කළ ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන - PHC - භාවිතා කරන්නන්) සමස්තයක් ලෙස - 32.7% | ස්ත්‍රී-පුරුෂ භාවය අනුව: කාන්තාවන් - 36.5% පිරිමින් - 27.4%	දැනුම (70 හෝ ඊට වැඩි දැනුම් මට්ටමක් පෙන්නුම් කළ ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන - PHC - භාවිතා කරන්නන්) සමස්තය - 28.0% | ස්ත්‍රී-පුරුෂ භාවය අනුව දැනුවත්භාවය: කාන්තාවන් - 32.2% පිරිමින් - 23.2%	මූලික සෞඛ්‍ය සේවා (PHC) පිළිබඳ දැනුම (70 හෝ ඊට වැඩි දැනුම් ලකුණු මට්ටමක් සහිත PHC සේවාලාභීන්) සමස්තයක් ලෙස: 28.0% ස්ත්‍රී-පුරුෂ භාවය අනුව දැනුම පිළිබඳ අවබෝධය කාන්තා - 28.5% පිරිමි - 19.5%

අංකය	ප්‍රධාන කාර්ය සාධන දර්ශක	ප්‍රගතිය		
		2023	**2024**	**2025**
	කාන්තාවන්ගෙන් 51.9%ක් සහ පිරිමින්ගෙන් 54.0%ක් එම සේවාවන් පිළිබඳව තෘප්තිමත් බව වාර්තා කළහ (2021 මූලික අගය: 0).	තෘප්තිය: (මූලික මට්ටමේදී 70 හෝ ඊට වැඩි තෘප්තිමත් මට්ටමක් වාර්තා කළ PHC භාවිතා කරන්නන්): සමස්තයක් ලෙස: 64.8% ස්ත්‍රී-පුරුෂ භාවය අනුව තෘප්තිය කාන්තාවන් - 63.0% පිරිමින් - 60.0%	තෘප්තිය: (මූලික මට්ටමේදී 70 හෝ ඊට වැඩි තෘප්තිමත්භාවයේ අගයක් වාර්තා කළ PHC භාවිතා කරන්නන්): සමස්තය: 67.2% ස්ත්‍රී-පුරුෂ භාවය අනුව තෘප්තිය: කාන්තාවන් - 64.9% පිරිමින් - 69.9%	තෘප්තිමත්භාවය: මූලික සෞඛ්‍ය සේවා (PHC) පිළිබඳ දැනුම (මූලික මට්ටමේදී 70 හෝ ඊට වැඩි දැනුම් ලකුණු මට්ටමක් සහිත PHC සේවාලාභීන්): සමස්තයක් ලෙස: 67.2% ස්ත්‍රී-පුරුෂ භාවය අනුව තෘප්තිමත්භාවය: කාන්තා - 61% පිරිමි - 63.2% (PHC සේවා පිළිබඳ තෘප්තිමත්භාවය වාර්තා කළ අය) b (OP 1.1)
03	2026 වන විට, ඇ. ඉලක්කගත පළාත්වල, පොකුරු (cluster) හා සම්බන්ධ රෝහල් මගින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වෙත නියමිත කාලසීමාව තුළ වාර්තා කරන ලද දැනුම් දිය යුතු රෝග (notifiable diseases) ප්‍රතිශතය අවම වශයෙන් 90% දක්වා ඉහළ නැංවීම (2018 මූලික දත්ත: අදාළ නොවේ).	ඩෙංගු උණ = 92.8% ලෙප්ටොස්පයිරෝසිස් = 86.7% ලීෂ්මේනියාසිස් = 75.6% (රෝහල්ගත කිරීම් සහ බාහිර රෝගී සේවා යන අංශ දෙකෙහිම) හෙපටයිටිස් = 100% ක්ෂය රෝගය = 18.6% (2024 වාර්ෂික වාර්තාව – සෞඛ්‍ය පහසුකම් පිළිබඳ සමීක්ෂණය, 2024)	ඩෙංගු උණ = 92.8% ලෙප්ටොස්පයිරෝසිස් = 86.7% ලීෂ්මේනියාසිස් = 75.6% (රෝහල්ගත කිරීම් සහ බාහිර රෝගී සේවා යන අංශ දෙකෙහිම) හෙපටයිටිස් = 100% ක්ෂය රෝගය = 18.6% (2024 වාර්ෂික වාර්තාව – සෞඛ්‍ය පහසුකම් පිළිබඳ සමීක්ෂණය, 2024)	ඩෙංගු උණ = 92.8% ලෙප්ටොස්පයිරෝසිස් = 86.7% ලීෂ්මේනියාසිස් = 75.6% හෙපටයිටිස් = 100% ක්ෂය රෝගය = 18.6% සරම්ප = රෝහල්ගතවීම් වාර්තා වී නොමැත (වාර්ෂික සමීක්ෂණ වාර්තාව 2024 - සෞඛ්‍ය පහසුකම් පිළිබඳ සමීක්ෂණය, 2024)
04	2026 වන විට, ඇ. සියලුම පොකුරු	100%ක් ක්‍රියාත්මකයි ඇගයීමට ලක් කර	100%ක් ක්‍රියාත්මකයි ඇගයීමට ලක් කර	100%ක් ක්‍රියාත්මකයි ඇගයීමට ලක් කර

අංකය	ප්‍රධාන කාර්ය සාධන දර්ශක	ප්‍රගතිය		
		2023	**2024**	**2025**
	(clusters) නවය තුළ පොකුරු පද්ධති ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම (2018 මූලික අගය: 0)	ඇති බව 0% (ඇගයීම ව්‍යාපෘතිය අවසානයේ සිදු කෙරේ) (2023 වාර්ෂික වාර්තාව – ගුණාත්මක අධ්‍යයනය)	ඇති බව 0% (ඇගයීම ව්‍යාපෘතිය අවසානයේ සිදු කෙරේ) (2024 වාර්ෂික වාර්තාව – ගුණාත්මක අධ්‍යයනය)	ඇති බව 0% (ඇගයීම ව්‍යාපෘතිය අවසානයේ සිදු කෙරේ) (2024 වාර්ෂික වාර්තාව – ගුණාත්මක අධ්‍යයනය)
05	2026 වන විට, ඉ. සියලුම දිස්ත්‍රික්කවල '1990 සුව සැරිය' ගිලන් රථ පද්ධතියේ සාමාන්‍ය ප්‍රතිචාර දැක්වීමේ කාලය 25%කින් අඩු කිරීම (2021 මූලික අගය: මිනිත්තු 11 තත්පර 41)	මිනිත්තු 11 යි තත්පර 38 යි (වාර්ෂික වාර්තාව 2023 - සුව සැරිය සංඛ්‍යාලේඛන 2023)	විනාඩි 13යි තත්පර 8යි (ගිලන්රථ 322කින් සමන්විත සමූහය) (2024 වාර්ෂික වාර්තාව – සුවසැරිය සංඛ්‍යාලේඛන 2024)	විනාඩි 13යි තත්පර 8යි (ගිලන්රථ 322කින් සමන්විත සමූහය) (2024 වාර්ෂික වාර්තාව - සුව සැරිය සංඛ්‍යාලේඛන 2024)

5 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

අනෙකුත් ජාතීන් සමඟ එක්ව, 2015දී, ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) 17 සාක්ෂාත් කරගැනීමට කැපවෙමින්, තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය පිළිගත්තේය. මේ අතරින් SDGs 3 සෞඛ්‍ය කෙරෙහි අවධානය යොමු කරන අතර, වයස් බේදයකින් තොරව සෑම දෙනාටම නිරෝගී ජීවිත සහ යහපැවැත්ම සහතික කිරීම අරමුණු වේ. මෙය සෞඛ්‍ය සේවාවේ ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය ඉලක්ක 13 කින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සෞඛ්‍යට අදාල දර්ශක 46 ක් ඉතා සූක්ෂම ලෙස හඳුනාගෙන අවසන් කර ඇති අතර ඒවා SDGs 3 අරමුණු සමඟ අනුකූල වේ. SDGs 3 හි මූලික දර්ශක 13, විශ්වීය සෞඛ්‍ය ආවරණය මැනීම සඳහා විශේෂයෙන් සාකච්ඡා කර ඇති දර්ශක 16 ද ඇතුළුව, සෞඛ්‍ය දර්ශක 38 කට බෙදා ඇති අතර, ඉතිරි දර්ශක 8, SDG 3 හි සෘජු කොටසක් නොවුවත් සෞඛ්‍යයට සම්බන්ධ වේ.

SDG 3 හි වැදගත්කම හඳුනා ගනිමින්, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2017 ජනවාරි මාසයේදී ජාතික මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලද අතර, SDG – 3 දක්වා ඇති මූලික සෞඛ්‍ය දර්ශක (CHI) සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රගතිය මෙහෙයවීම සඳහා කැප වී ඇත. පසුගිය වර්ෂ සැලකීමේදී අඛණ්ඩ මහපෙන්වීම සහ අධීක්ෂණය සහතික කරමින් මෙම කමිටුව 2023 දී දෙවරක් සහ 2022 දී එක් වරක් රැස් වී තිබේ.

2030 ඉලක්ක සපුරා ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම වැදගත් ඉදිරි පියවරක් විය. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් SDG 3 දර්ශක 31 ක්, SDG 3 නොවන දර්ශක 3 ක් අධීක්ෂණය සහ වාර්තා කිරීමේ වගකීම භාරගන්නා ලදී. 2030 වන විට SDG ඉලක්ක සපුරා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද විස්තර කෙරෙන සම්පූර්ණ කරන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඉතා පැහැදිලි ලෙස සකස් කර අදාල පාර්ශවකරුවන් අතර බෙදාහරින ලදී.

සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය ප්‍රමිතිකවල (health matrices) ගෝලීය වර්ධනයන් සමඟ සමීපව සිටීමට කැප වී සිටී. සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රමුඛතාවයන් හි ගතික ස්වභාවය හඳුනාගනිමින්, නැඟී එන අභියෝග සහ අවස්ථාවන් වඩාත් හොඳින් පිළිබිඹු කිරීම සඳහා එක්සත් ජාතීන් (UN) විසින් ලබා දී ඇති නව දර්ශක ඇතුලත් කරමින් අමාත්‍යාංශය එහි දර්ශක රාමුව වරින් වර නැවත නිරීක්ෂණ කරයි. මෙම පුනරාවර්තන ක්‍රියාවලිය, ජාතික සෞඛ්‍ය න්‍යාය පත්‍රය, ශ්‍රී ලංකාවේ සුවිශේෂී තත්වයන්ට සන්දර්භීයව අදාල වන අතරම ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රතිචාර දක්වන බව සහතික කරයි. කඩිනම් හා තිරණාත්මක ක්‍රියාමාර්ගයක් හරහා සියළු ශ්‍රී ලාංකීකයන් සඳහා වැඩිදියුණු කළ සෞඛ්‍ය ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව වර්ධනය කරමින් අමාත්‍යාංශය විසින් ගෝලීය දියුණුව, ජාතියේ නිශ්චිත සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද ප්‍රත්‍යක්ෂ උපාය මාර්ග බවට පරිවර්තනය කරයි.

SDG දර්ශකවල 2025 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් වගුව මඟින් ඉදිරිපත් කෙරේ.

වගුව 6 – 2025 දී SDG දර්ශකවල ප්‍රගතිය

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
3.1 2030 වන විට ගෝලීය මාතෘ මරණ අනුපාතය ජීව උපත් 100,000 කට 70ට වඩා අඩු අගයකට අඩු කර ගැනීම	3.1.1 මාතෘ මරණ අනුපාතය	සජීවී උපත් 100,000 කට ~~16~~ 20	25 (FHB)	24.9* (FHB)	දත්ත සම්පූර්ණ කර නොමැත
	3.1.2 පුහුණු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් ප්‍රසූතිය සිදු කිරීම	~~100%~~ 99%	99.9 (FHB)	99.9 (FHB)	99.9 *(FHB)
3.2 2030 වන විට, නවජන්ම (neonatal) මරණ අනුපාතය අවම වශයෙන් ජීව උපත් 1,000 කට 12 කට වඩා අවම මට්ටමකට අඩුකර ගැනීම සහ අවුරුදු 5 ට අඩු මරණ අනුපාතය අවම වශයෙන් ජීව උපත් 1,000කට 25 ක් ලෙස අඩු මට්ටමකට පවත්වා ගැනීම සියළුම රටවල අරමුණ වන අතර ළදරු මරණ සහ වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගේ වැළැක්විය හැකි මරණ සිදුවීම නැවැත්වීම	3.2.1 අවුරුදු 5 ට අඩු දරුවන්ගේ මරණ අනුපාතය	සජීවී උපත් 1,000 කට ~~5~~ 9	12.5 (FHB)	12.2 (FHB)	
	3.2.2 නවජන්ම මරණ අනුපාතය	සජීවී උපත් 1,000 කට ~~4~~ - 5.5	7.2 (FHB)	7.2 (FHB)	
3.3 2030 වන විට, ඒඩ්ස් (AIDS), ක්ෂයරෝගය, මැලේරියා සහ නොසලකා හරින ලද සර්ම කලාපීය	3.3.1 HIV රෝගීන්ගේ අනුපාතය	2030 වන විට <0.01	0.01 (NSACP)	0.01 (NSACP)	0.01 (NSACP)
	3.3.2 ක්ෂය රෝගීන්ගේ අනුපාතය	100,000 කට 13	62 (NPTCCD)	62 (NPTCCD)	

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
රෝග හා සෙංගමාලය, ජලය මඟින් ව්‍යාප්ත වන රෝග හා අනෙකුත් බෝවන රෝග වසංගත තත්වය අවසන් කිරීම	3.3.3 ජනගහනය 1000 කට මැලේරියා රෝගීන්ගේ අනුපාතය	දේශීය මැලේරියා රෝගය ශූන්‍යව පවත්වා ගැනීම	0 (AMC)	0 (AMC)	0 (AMC)
	3.3.4 අවුරුදු 5 දරුවන් අතර 100,000 කට හෙපටයිටිස් B අනුපාතය	සමීක්ෂණය සිදු කර ඇති අතර, මූලික දත්ත සහ ඉලක්ක තවදුරටත් අවසන් කර නොමැත.	දත්ත නොමැත		
	3.3.5 නොසලකා හරින ලද නිවර්තන රෝගවලට (NTD) එරෙහිව මැදිහත් වීමක් අවශ්‍ය පුද්ගලයින් සංඛ්‍යාව		89,799 (DCP)		
	1. ඩෙංගු - වසරකට ඩෙංගු සඳහා ප්‍රතිකාර ලබන සංඛ්‍යාව	21,000	89,799 (DCP)	49,873 (DCP)	45,926 (DCP)
	1.අ ඩෙංගු රෝගීන්ගේ මරණ අනුපාතය (CFR)	0.00	0.07 (NDCU)	0.05 (NDCU)	0.05 (NDCU)
	2. ජලභීතිකා රෝගය- මානව ජලභීතිකා රෝග හේතුවෙන් වන මරණ සංඛ්‍යාව	2030 වන විට මිනිස් ජලභීතිකා රෝගය හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව ශූන්‍ය වීම	16 (PHVS)	20 (PHVS)	
	3. බරවා රෝගය - බරවා රෝගය හේතුවෙන් වසරකට ප්‍රතිකාර ලබන නව ලිම්ෆිඩීමා රෝගීන් සංඛ්‍යාව	2030 වන විට නව ලිම්ෆිඩීමා රෝගීන් සංඛ්‍යාව ශූන්‍ය වීම	908 (AFC)	1,109 (AFC)	

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
	Wuchereria bancrofti සඳහා මයික්‍රොෆයිලේරියා (microfilaria) ධනාත්මක වීමේ අනුපාතය ලෙස ප්‍රතිසිථාපනය කරන ලදී.	0.001 (පරීක්ෂාවට ලක් කළ ජනගහනයෙන් 100,000කට 1ක්)	0.003	0.002	
	4. ලාදුරු රෝගය - වසරකට ලාදුරු රෝගය සඳහා ප්‍රතිකාර ලබාගන්නා සංඛ්‍යාව	2030 වන විට 1000	1,580 (ALC)	1,350 (ALC)	
	5. ලිෂ්මනයිසිස් -වසරකට වාර්තා වූ ලිෂ්මනයිසිස් රෝගීන් සංඛ්‍යාව	2030 වන විට 100,000 කට <1	4,267 (වසංගත රෝග ඒකකය)	4,447 (වසංගත රෝග ඒකකය)	
	3.4.1 හෘද වාහිනී රෝග, පිළිකා, දියවැඩියාව හෝ නිදන්ගත ශ්වසන රෝග හේතුවෙන් සිදුවන මරණ අනුපාතය (ආදේශක දර්ශකය) (වයස අවුරුදු 30ත් 70ත් අතර කාලයේදී මියයාමේ සම්භාවිතාව)		-	-	-
	3.4.2 ජනගහනය 10,000කට සියදිවි නසාගැනීම් හේතුවෙන් සිදුවන මරණ අනුපාතිකය	11.6	15.33	15 (පොලිසියේ දත්ත)	

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
3.5 අන්තරායකර ඖෂධ අවභාවිතය හා හානිදායක ලෙස මධ්‍යසාර භාවිතය ඇතුළු ද්‍රව්‍ය අවභාවිතය වැලැක්වීම සඳහා ප්‍රතිකාර කිරීම ශක්තිමත් කිරීම	3.5.1 මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ආබාධ සඳහා ප්‍රතිකාර මැදිහත්වීම් (ඖෂධීය, මනෝ සමාජීය හා පුනරුත්ථාපන හා පසු සේවා) ආවරණය කිරීම අ. මත්ද්‍රව්‍ය	17.4%	වාර්තා කිරීමේ වගකීම තවදුරටත් සෞඛ්‍ය අමාත්‍යාංශය සතු නොවේ	වාර්තා කිරීමේ වගකීම තවදුරටත් සෞඛ්‍ය අමාත්‍යාංශය සතු නොවේ	වාර්තා කිරීමේ වගකීම තවදුරටත් සෞඛ්‍ය අමාත්‍යාංශය සතු නොවේ
	ආ. මධ්‍යසාර	10%			
	3.5.2 ඒක පුද්ගල මුළු මධ්‍යසාර පරිභෝජනය (වයස අවු 15+)	එක් පුද්ගලයකුට ලීටර් 3.8	දත්ත නොමැත		
3.6 2030 වන විට, ලෝකයේ මාර්ග අනතුරුවලින් සිදුවන මරණ සංඛ්‍යාව සහ තුවාලවීම් සංඛ්‍යාව අඩකින් අඩුකිරීම	3.6.1 මාර්ග අනතුරුවලින් සිදුවන මරණ අනුපාතය	2030 වන විට 20% කින් අඩු කිරීම (~~11.4~~ - 10.74)	10.53 (පොලිස් වාර්තා)	11.5 (පොලිස් වාර්තා)	
3.7 2030 වනවිට, පවුල් සැලසුම්කරණය, තොරතුරු හා අධ්‍යාපනය ඇතුළුව ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් සඳහා විශ්ව ප්‍රවේශය සහතික කිරීම හා ප්‍රජනක සෞඛ්‍යය, ජාතික ක්‍රමෝපාය සහ වැඩසටහන්වලට ඒකාබද්ධ කිරීම	3.7.1 ප්‍රජනක වයස්වල සිටින අවුරුදු (15-49) දැනට විවාහක කාන්තාවන්ගේ දරුවන් (අතිරේක) නොමැතිවීමට හෝ ඊළඟ දරුවා කල්දැමීමට කැමති නවීන පවුල් සැලසුම් ක්‍රමවේදයක් භාවිතා කරන කාන්තාවන්ගේ ප්‍රතිශතය	81 % (FHB)	80.6 (RHMIS)	80.7 (RHMIS)	
	3.7.2 වයස අවුරුදු 15-19	1000 කට 20	දත්ත නොමැත	දත්ත නොමැත	දත්ත නොමැත

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
	අතර වයස් කාණ්ඩයේ කාන්තාවන් 1000 කට කාන්තාවන්ගේ, වාර්ෂික උපත් සංඛ්‍යාව අනුව එම වයස් කාණ්ඩයේ සාඵල්‍යතා අනුපාතය				
3.8 මූල්‍ය අවදානම් ආරක්ෂාව, ගුණාත්මක අත්‍යාවශ්‍ය සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන් සඳහා ළඟාවීම මෙන්ම ආරක්ෂිත, කාර්යක්ෂම, ගුණාත්මක හා දැරියහැකි මට්ටමේ අත්‍යාවශ්‍ය ඖෂධ ලබාගැනීමේ හැකියාව සහ සියළු දෙනාටම එන්නත් ලබාදීම ආදී කරුණු ඇතුළුව සාර්ව සෞඛ්‍ය ආවරණය ළඟාකර ගැනීම	අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් ආවරණය - දර්ශක 14 ප්‍රජනක, මාතෘ,නව ජන්ම හා ළමා සෞඛ්‍යය	80%			
	3.8.1.1 පවුල් සැලසුම්කරණය - 3.7.1 පරිදි		80.6 (RHMIS)	80.7 (RHMIS)	
	3.8.1.2 ගර්භනීබව සහ ප්‍රසූතිය සම්බන්ධ සේවාවන් : පූර්ව-ප්‍රසව සේවා ආවරණය - අවම වශයෙන් පැමිණීම් හතරක් (%)	> 99%	96.6 (FHB)	94.6 (FHB)	

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
	3.8.1.3 ළමා එන්නත්කරණය: ඩිප්තීරියා-ටෙටනස්-ගලපටලය යන ත්‍රිත්වයෙන් සමන්විත එන්නතෙහි මාත්‍රා තුනම ලබාගන්නා ළදරුවන්ගේ % (DPT වෙනුවට ශ්‍රී ලංකාවේ PENTA 3 ලබාදෙනු ලැබේ)		98 (වසංගත ඒකකය)	97 (වසංගත ඒකකය)	
	3.8.1.4 ළමා ප්‍රතිකාර: උග්‍ර ශ්වසන ආසාධිත රෝග (Acute Respiratory Infection – ARI) ලක්ෂණ සඳහා ප්‍රතිකාර සෙවීම	දත්ත නොමැත			
	3.8.1.5 ක්ෂය රෝගය: ක්ෂය රෝග ප්‍රතිකාර සාර්ථකභාවයේ අනුපාතය	~~84.6%~~ > හෝ = 90%	66.2 (NPTCCD)	63.7 (NPTCCD)	
	3.8.1.6 එච්අයිවී/ඒඩ්ස්: Antirectroviral ප්‍රතිකාර (ART) ආවරණය (%)	~~15.3%~~ > 90%	71	81	
	3.8.1.7 ජලය සහ සනීපාරක්ෂාව: ආරක්ෂිතව කළමනාකරණය කරන ලද සනීපාරක්ෂක සේවාවන් භාවිතා කරන ජනගහනය	~~91.2% (2016)~~ 98 (2030)			
	3.8.1.8 සුරක්ෂිත	~~90.4% (2016)~~		93.4	

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
	කළමනාකරණය සහිත පානීය ජල සේවාව භාවිත කිරීමේ ජනගහනය	100 (2030)			
	3.8.1.9 අධිරුධිරපීඩනය: රුධිරපීඩනය ඉහල නොයන වයස් සම්මත ව්‍යාප්තිය	80%	පිරිමි - 64.2% ගැහැණු - 66.2% සමස්ථ - 65.2% (STEPS 2022)	පිරිමි - 64.2% ගැහැණු - 66.2% සමස්ථ - 65.2% (STEPS 2022)	පිරිමි - 64.2% ගැහැණු - 66.2% සමස්ථ - 65.2% (STEPS 2022)
	3.8.1.10 දියවැඩියාව: වයස අවුරුදු 18 සිට 69 දක්වා වැඩිහිටියන් සඳහා නිරාහාර ප්ලාස්මා ග්ලූකෝස් වයස් සම්මත මධ්‍යනය (md/dl)	80 md/dl	පිරිමි - 103.1**mg**/dl ගැහැණු - 104.8 mg/dl සමස්ථ - 104 mg/dl (STEPS 2022)	පිරිමි - 103.1mg/dl ගැහැණු - 104.8 mg/dl සමස්ථ - 104 mg/dl (STEPS 2022)	පිරිමි - 103.1mg/dl ගැහැණු - 104.8 mg/dl සමස්ථ - 104 mg/dl (STEPS 2022)
	3.8.1.11 දුම්කොල: වයස අවුරුදු >=15 වැඩිහිටියන් පසුගිය දින 30 තුල දුම්නොබොන වයස් සම්මත ව්‍යාප්තිය	90%	පිරිමි - 51.1% ගැහැණු - 93.5% සමස්ථ - 73.8% (STEPS 2022)	පිරිමි - 51.1% ගැහැණු - 93.5% සමස්ථ - 73.8% (STEPS 2022)	පිරිමි - 51.1% ගැහැණු - 93.5% සමස්ථ - 73.8% (STEPS 2022)
	3.8.1.12 ඒක පුද්ගල රෝහල් ඇඳන් සංඛ්‍යාව (ජනගහනය 10,000කට 18ක් වන උපරිම සීමාවට සාපේක්ෂව)				දත්ත නොමැත
	3.8.1.13 සෞඛ්‍ය කාර්ය				දත්ත නොමැත

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
	මණ්ඩලය: සෞඛ්‍ය සේවක ඝනත්වය සහ බෙදීයාම (ජනගහනය 1000කට)				
	3.8.1.14 සෞඛ්‍ය ආරක්ෂාව: අන්තර්ජාතික සෞඛ්‍ය රෙගුලාසි (IHR) සම ධාරිතා දර්ශකය	70%	70.67%	66.44%	දත්ත නොමැත
3. අ. දුම්කොළ පාලනය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ රාමුගත සම්මුතිය සියළුම රටවල යෝග්‍ය පරිදි ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම	3. අ. 1 වයස අවුරුදු 18-69 අතර පුද්ගලයින් අතර වයස අනුව ප්‍රමිතිකරණය කරන ලද (age standardized) වර්තමාන දුම්කොළ භාවිතය (STEP සමීක්ෂණ දත්ත, 2015 සඳහා නවතම දත්ත පවතී)	10%	පිරිමි - 48.9% ගැහැණු - 6.5% සමස්ථ - 26.2% (STEPS 2022)	පිරිමි - 48.9% ගැහැණු - 6.5% සමස්ථ - 26.2% (STEPS 2022)	දත්ත නොමැත
3. ආ. සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට ප්‍රාථමිකව බලපාන බෝවන සහ බෝ නොවන රෝග සඳහා අවශ්‍ය එන්නත් හා ඖෂධ පිළිබඳ පර්යේෂණ හා වැඩිදියුණු කිරීම්වලට සහායවීම, ට්‍රිප්ස් (TRIPS) ගිවිසුම පිළිබඳ දෝහා ප්‍රඥප්තිය අනුව අවශ්‍ය ප්‍රමාණයට අත්‍යාවශ්‍ය ඖෂධ සහ එන්නත් සඳහා ප්‍රවේශය	3. ආ.1 ජාතික වැඩ සටහනට ඇතුළත් කර ඇති සියලුම එන්නත් මගින් ආවරණය වන ඉලක්කගත ජනගහනයේ අනුපාතය	BCG (100) DPT 3 (100) පෝලියෝ 3 (100) MCV 2 (100) පිටගැස්ම ධූලකාභය (100) HPV 2 (100)	BCG (99) PENTA 3 (98) පෝලියෝ 3 (98) DPT 4 (99) DT (97) TT (98)	BCG (99) PENTA 3 (98) පෝලියෝ 3 (98) DPT 4 (99) TT (98) MCV 2 (98)	
	3. ආ.3 අත්‍යවශ්‍ය ඖෂධ සහ වෙළඳ භාණ්ඩ ලබා ගැනීමේ හැකියාව මෙම දර්ශකය ගෝලීය වශයෙන් සංවර්ධනය	පවතින අගයම පවත්වා ගැනීම (50% - පොදු 100.0, පෞද්ගලික 95.29) 75% - පොදු 82.16,	දත්ත නොමැත	දත්ත නොමැත	


ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
ලබාදීම, මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීමට විශේෂයෙන් සියළු දෙනාටම වෛද්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය ලබාදීම, ගිවිසුම් ප්‍රකාරව වෙළඳාම හා සබැඳි බුද්ධිමය දේපළ අයිතීන් අනුව සංවර්ධනය වෙමින් පවතින රටවල, මහජන සෞඛ්‍ය අයිතිය තහවුරු කිරීම	වෙමින් පවතී. (SARA සමීක්ෂණ දත්ත. ලබාගත හැකි නවතම දත්ත 2017 වසරට අදාළ වේ.)	පෞද්ගලික 80.26 90% - පොදු 21.44, පෞද්ගලික 53.04)			
3. ඇ. සංවර්ධනය වෙමින් පවතින රටවල, විශේෂයෙන් උෂ්ණ සංවර්ධිත හා කුඩා දිවයින් රාජ්‍යවල සෞඛ්‍ය මූල්‍යකරණය සහ සෞඛ්‍ය කාර්ය බලකාය සඳහා බඳවා ගැනීම්, සංවර්ධනය, පුහුණුව හා රඳවා ගැනීම ආදිය සැලකියයුතු මට්ටමකින් වැඩි කිරීම	3. ඇ.1සෞඛ්‍ය සේවක ඝනත්වය හා ව්‍යාප්තිය	වෛද්‍යවරුන් -1.79 දන්ත ශල්‍ය වෛද්‍යවරුන්- 0.14 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් / හෙදියන්- 3.82 ඖෂධවේදීන්- 0.47	වෛද්‍යවරුන් - 1.01 දන්ත ශල්‍ය වෛද්‍යවරුන් - 0.07 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් / හෙදියන් - 2.69 ඖෂධවේදීන් - 0.17	දත්ත නොමැත	
3. ඈ. සියළුම රටවල විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ජාතික මෙන්ම ගෝලීය සෞඛ්‍ය අවදානම් සම්බන්ධයෙන් කලින් අනතුරු ඇඟවීම, අවදානම අඩු කිරීම හා	3. ඈ.1 ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR) ධාරිතාව සහ සෞඛ්‍ය හදිසි සූදානම	70% (නිරෝධායන ඒකකය)	70.67% (නිරෝධායන ඒකකය)	66.44% (නිරෝධායන ඒකකය)	දත්ත නොමැත

ඉලක්කය /පරමාර්ථය (ගෝලීය ඉලක්කය)	දර්ශකය	2030 සඳහා ඉලක්කය	ප්‍රගතිය		
			2023	2024	2025
කළමනාකරණය පිළිබඳ ධාරිතාවය ශක්තිමත් කිරීම					
	3.ඇ.2 තෝරාගත් ක්ෂුද්‍ර ජීවී නාශක ප්‍රතිරෝධී ක්ෂුද්‍ර ජීවීන් නිසා ඇතිවන රුධිරගත ආසාදනයන්ගේ ප්‍රතිශතය (%) (Staphylococcus aureus හි මෙතිසිලින් ප්‍රතිරෝධය / E. coli හි සෙෆලොස්පොරින් ප්‍රතිරෝධය)	Methi: 50 Ecoli:60	Methi: 47.2 Ecoli:58.3	Methi: 43.25 Ecoli:62.17	

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2021 දී 87 වන ස්ථානයේ සිටි ශ්‍රී ලංකාව, 2024 දී තිරසර සංවර්ධන අරමුණු (SDG) සම්බන්ධයෙන් රටවල් ශ්‍රේණිගත කිරීම් අනුව, රටවල් 167න් 93 වන ස්ථානයට පත්වෙමින් පහළට ගමන් කර ඇත. ශ්‍රී ලංකාව සඳහා SDG දර්ශකයේ අගය 67.9ක් වන අතර එය තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ඉදිරියෙන්ම සිටින රටක් ලෙස ස්ථානගත කර ඇති අතර 2024 දී එහි ඉහළ යාමේ (spillover) අගය ලකුණු 93.7ක් විය. කෙසේ වෙතත්, එක් එක් තිරසර සංවර්ධන අරමුණ තනි තනිව තක්සේරු කරන විට, ශ්‍රී ලංකාව SDG ජයග්‍රහණ මාර්ගයේ හෝ ජයග්‍රහණ පවත්වාගෙන යාම සිදු වන්නේ දරිද්‍රතාවය නොමැතිකම (SDG 1), ගුණාත්මක අධ්‍යාපනය (SDG 4), දේශගුණික ක්‍රියාමාර්ග (SDG 13) සහ වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය (SDG 12) ඇතුළුව තිරසර සංවර්ධන අරමුණු හතරකින් පමණි. අරමුණු 2,6,7,9,11 සහ 14 හා එක්ව සලකා බැලීමේදී යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම පිළිබඳ SDG 3, මධ්‍යස්ථ දියුණුවක් පෙන්නුම් කර ඇත. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය (අරමුණ 5) මෙන්ම අරමුණු 8, 15, 16 සහ 17 ද එකම ස්ථානයක රැඳී පවතී. අසමානතාවය අඩුවීම (SDG 10) පිළිබඳව සොයා බැලීම සඳහා අදාල ප්‍රවණතා තොරතුරු නොමැත. අසමානතාවයන් අඩු කිරීම පිළිබඳ SDG 10 සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ SDG 5 ඇතුළුව අනෙකුත් සියළුම තිරසර සංවර්ධන අරමුණු (SDG) වලදී, ශ්‍රී ලංකාව ප්‍රධාන සැලකිය යුතු හෝ මධ්‍යස්ථ අභියෝග වලට මුහුණ දී සිටී.

විශ්ව සෞඛ්‍ය ආවරණය (UHC) යනුවෙන් අදහස් කරනුයේ සෞඛ්‍ය සේවා වියදම් හේතුවෙන් පීඩාකාරී සෞඛ්‍ය වියදම් අත්විඳීමෙන් තොරව සියළුම ජනතාවට, ඔවුන්ට අවශ්‍ය ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් ලැබෙන බවයි. සෞඛ්‍ය ප්‍රවර්ධනයේ සිට රෝග වැළැක්වීම, ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ සහන සත්කාර දක්වා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන්හි සම්පූර්ණ පරාසයම එයට ඇතුළත් වේ. විශ්ව සෞඛ්‍ය ආවරණය (UHC) හි SDG ඉලක්කය 3.8 කරා ළඟාවීමේ ප්‍රගතිය වෙනම මිනුම් දෙකක් භාවිතයෙන් නිරීක්ෂණය කරනු ලැබේ. විශේෂයෙන්, අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ආවරණය පිළිබඳ SDG දර්ශකය 3.8.1 සහ පීඩාකාරී සෞඛ්‍ය වියදම් පිළිබඳ SDG දර්ශකය 3.8.2 අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ආවරණය පිළිබඳ SDG 3.8.1, අර්ථ දක්වනු ලබන්නේ සාමාන්‍ය සහ වඩාත්ම අවාසි සහගත ජනගහනය අතර ප්‍රජනක, මාතෘ, නව ජන්ම හා ළමා සෞඛ්‍ය, බෝවන රෝග, බෝ නොවන රෝග, සේවා ධාරිතාවය සහ ප්‍රවේශය ඇතුළත් (tracer) මැදිහත්වීම් මත පදනම් වූ අත්‍යවශ්‍ය සේවාවන්හි සාමාන්‍ය ආවරණය ලෙසය. මෙම දර්ශකය මනිනු ලබන්නේ 0 සිට 100 දක්වා ඒකක රහිත පරිමාණයකින් වාර්තා කරන ලද දර්ශකයක් ලෙස වන අතර එය සෞඛ්‍ය සේවා ආවරණයේ ට්‍රේසර් (tracer) දර්ශක 14ක ජ්‍යාමිතික සාමාන්‍යය ලෙස ගණනය කරනු ලැබේ.



අදාළ සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම 2025.12.10 දින පවත්වන ලදී.

6 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	18,916	17,232	1,684
තෘතියික	1,128	636	492
ද්විතියික	46,602	39,706	6,896
ප්‍රාථමික	34,759	26,275	8,484
වෙනත්	276	178	98
එකතුව	**101,681**	**84,027**	**17,654**

- අමාත්‍යාංශය යටතේ පාලනය වන සහ පළාත් සෞඛ්‍ය ආයතන යන දෙවර්ගයම ඇතුළත් වේ.

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

ඉහත වගුවේ දක්වා ඇති පරිදි, සියලු මට්ටම්වල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පවතින අතර, එය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කාර්යසාධනය සඳහා අහිතකර ලෙස බලපායි. විශේෂයෙන්ම රෝගීන් කළමනාකරණයට සෘජුවම සම්බන්ධ වන ආයතන මඟින් සපයනු ලබන රෝගී සත්කාරයේ ගුණාත්මකභාවයට මෙම මානව සම්පත් හිඟය ඇතැම් විට බලපායි. තවද, කාර්ය මණ්ඩලයේ හිඟය සේවකයින්ගේ අතෘප්තියට ද හේතු විය හැකිය.

➢ **දේශීය වෛද්‍ය අංශයේ මානව සම්පත් පැතිකඩ**

අනු අංකය	තනතුර	සේවය	වැටුප් ක්‍රමය (03/2016 චක්‍ර ලේඛය අනුව)	පන්තිය/ ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
01	අතිරේක ලේකම් (පාලන)	ශ්‍රී ලං.ප.සේ	SL3	විශේෂ	01	01	-
02	අතිරේක ලේකම් (ප්‍රතිපත්ති, පර්යේෂණ හා සංවර්ධන)	ශ්‍රී ලං.ප.සේ	SL3	විශේෂ	01	-	01
03	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී ලං.ප.සේ	SL1	I	01	01	-
04	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී ලං.ග.සේ	SL1	I	01	01	-
05	අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ප.සේ	SL1	I	01	01	-

අනු අංකය	තනතුර	සේවය	වැටුප් කේතය (03/2016 චක්‍ර ලේඛය අනුව)	පන්තිය/ ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
06	අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ක්‍ර.සේ	SL1	I	01	01(වැඩ)	-
07	අධ්‍යක්ෂ (තාක්ෂණික)	ලං.ආ.වෛ.සේ	SL1	I	01	-	01
08	ගණකාධිකාරී	ශ්‍රී ලං.ග.සේ	SL1	III/II	01	-	01
09	අභ්‍යන්තර විගණක	ශ්‍රී ලං.ග.සේ	SL1	III/II	01	-	01
10	සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ප.සේ	SL1	III/II	01	-	01
11	සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ක්‍ර.සේ	SL1	III/II	01	-	01
12	සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ඉ.සේ	SL1	III/II	01	-	01
13	සහකාර ලේකම්	ශ්‍රී ලං.ප.සේ	SL1	III/II	01	-	01
14	නීති නිලධාරී	දෙපාර්තමේන්තුගත	SL1	III/II	01	01	-
15	පරිපාලන නිලධාරී	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය	MN 7	අධි පන්තිය	01	01	-
16	භාෂා පරිවර්තක	භාෂා පරිවර්තන සේවය	MN 6	II/I	01	-	01
17	සංඛ්‍යාලේඛන නිලධාරී	දෙපාර්තමේන්තුගත	MN 5	III/II/I	01	01	-
18	සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය	MN 4	III/II/I	331	331	-
19	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය	MN 2	III/II/I	18	07	11
20	වීඩියෝ කැමරාකරු	දෙපාර්තමේන්තුගත	MT2	-	01	01	-
21	රියදුරු	මධ්‍යම රියදුරු සේවය	PL3	III/II/I විශේෂ	07	04	03
22	කාර්යාල කාර්ය සහායක		PL1	III/II/I විශේෂ	10	06	04
	එකතුව				**384**	**357**	**27**

හෝමියෝපති රෝහල කාර්ය මණ්ඩල විස්තර

අනු අංකය	තනතුර	වැටුප් කේතය	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරුප්පාඩු සංඛ්‍යාව
01	විශේෂඥ හෝමියෝපති වෛද්‍ය	SL-3	1	0	1
02	හෝමියෝපති වෛද්‍ය	SL-2	5	1	4
03	ආයතන භාර වෛද්‍ය නිලධාරි (වැඹ)	-	1	1 (වැඹ)	-
04	නියෝජ්‍ය අධ්‍යක්ෂ	SL-1	1	0	1
05	හෙද නිලධාරී	MT-07	4	0	4
06	ඖෂධවේදී	MT-06	1	0	1
07	රසායනාගාර ශිල්පී	MT-06	1	0	1
08	සංවර්ධන නිලධාරී	MN-4	2	2	0
09	රාජ්‍ය කළමනාකරණ සහකාර	MN-2	2	0	2
10	ඖෂධ සංයෝජක	MN-1	2	1	1
11	රියදුරු	PL-2	1	0	1
12	උපස්ථායක	PL-2	8	6	2
13	අරක්කැමි	PL-2	1	0	1
14	කම්කරු	PL-1	8	4	4
එකතුව			**37**	**16**	**22**

හෝමියෝපති වෛද්‍ය සභාව කාර්ය මණ්ඩල විස්තර

අනු අංකය	තනතුර	වැටුප් කේතය	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරුප්පාඩු සංඛ්‍යාව
1	ලේඛකාධිකාරී	MM 1-1	1	0	1
2	වෛද්‍ය වෘත්තික	MM 1-1	15	12	3
3	රාජ්‍ය කළමනාකරණ සහකාර	MA 1-1	2	1	1
4	ඖෂධ සංයෝජක	PL 2-2006A	14	5	9
5	කම්කරු	PL 1-2006A	16	12+1	4
එකතුව			**48**	**31**	**18**

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු වැඩසටහන්

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ඒකකය මඟින් ආයතන ප්‍රධානීන් සහ වෘත්තීය සංවිධාන ප්‍රධානීන් විසින් කරනු ලබන ඉල්ලීම් අනුව පුහුණුවීම් සඳහා වාර්ෂිකව වෙන් කරන මුදල් ප්‍රයෝජනයට ගනිමින් විවිධ කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා පුහුණු වැඩසටහන් නිතිපතා පවත්වනු ලැබේ.

(i) අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන

අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (CPD) යනු කෙනෙකුගේ වෘත්තීය ජීවිතය පුරාවටම වෘත්තීය කුසලතා සහ දැනුම ඉගෙන ගැනීමේ සහ වැඩිදියුණු කර ගැනීමේ අඛණ්ඩ ක්‍රියාවලියයි. වෘත්තිකයන් තම විශේෂඥ දැනුම පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට, ක්ෂේත්‍රයේ නවතම ප්‍රවණතා පිළිබඳව යාවත්කාලීනව සිටීමට සහ ක්ෂේත්‍රය තුළ සිදුවන වෙනස්කම්වලට අනුගත වීමට සිදුකරන භෞතිකව මෙන්ම අන්තර්ජාලය ඔස්සේ ද පැවැත්වෙන වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු සහ පුහුණු සැසි, වැනි ක්‍රියාකාරකම් ඊට ඇතුළත් වේ.

දේශීය වෛද්‍ය අංශය - දේශීය පුහුණු වැඩසටහන්

අංකය	පුහුණු වැඩසටහන	ප්‍රතිලාභීන්	සංඛ්‍යාව	මුදල (රුපියල්)
01	සටහන් ලිපි හා වාර්තා ලිවීම	සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්	7	49,000.00
02	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයට පවත්වාගෙන යාම	සංවර්ධන නිලධාරීන්	2	13,000.00
03	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගේ නව වෙනස්වීම් සම්බන්ධ දැනුවත් කිරීම්	සංවර්ධන නිලධාරීන්	2	26,000.00
04	රාජ්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය හා මූල්‍යමය ගිණුම්කරණය	සංවර්ධන නිලධාරීන්	1	13,000.00
05	සේවා ස්ථානයෙන් බැහැර පුහුණු වැඩසටහන	සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්	සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්	128,700.00
06	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්	4	60,000.00
07	කාල කළමනාකරණය	සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්	2	26,000.00

අංකය	පුහුණු වැඩසටහන	ප්‍රතිලාභීන්	සංඛ්‍යාව	මුදල (රුපියල්)
08	රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ පාඨමාලාව	ප්‍රධාන ගණකාධිකාරී	1	20,000.00
09	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්	4	48,000.00
10	ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා රියදුරන්ගේ හා කාර්යාල කාර්ය සහායකයන්ගේ නිපුණතා සංවර්ධනය	කා.කා.ස. සහ රියදුරන්	3	19,500.00
11	රජයේ වාහන නඩත්තුව	සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්	2	6,500.00
12	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම	සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්	3	19,500.00
13	රාජ්‍ය අංශයේ වැටුප් ගෙවීමේ පටිපාටීන්	සංවර්ධන නිලධාරීන්	1	6,500.00
14	කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව රාජ්‍ය අංශය සහ අර්ධ රාජ්‍ය අංශය දෙදින පුහුණු වැඩසටහන	කා.කා.ස.	3	24,000.00
15	ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය	සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්	2	24,000.00
				483,700.00

ආයුර්වේද දෙපාර්තමේන්තුව - පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන්

අංකය	වැඩසටහනේ නම	පැවැත්වූ ආයතනය	සහභාගී වූ නිලධාරීන් ගණන	පැවැත්වූ දිනයන්	පාඨමාලා ගාස්තුව (එක් අයෙකුට රු.)
01	වැටුප් පරිවර්තනය පිළිබඳ වැඩමුළුව	නිපුනතා සංවර්ධන අරමුදල	03	2025.03.25	13,000.00
02	ඉංග්‍රීසි ඩිප්ලෝමාව	Institute of Official Languages and Professional Studies	01	2025.02.28	60,000.00
03	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	02	2025.03.25 2025.05.20	12,000.00
04	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	ජාතික ශ්‍රමඅධ්‍යයන ආයතනය	03	2025.05.28 2025.05.28 2025.05.28	6,500.00
05	රියදුරන්ගේ කුසලතා සංවර්ධනය	ජාතික ශ්‍රමඅධ්‍යයන ආයතනය	03	2025.05.29	12,000.00
06	රියදුරන් සඳහා එක් දින වැඩමුළුව	ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය			6,000.00
07	රජයේ වාහන නඩත්තුව	ජාතික ශ්‍රමඅධ්‍යයන ආයතනය	02	2025.06.12	6,500.00
08	නායකත්ව කුසලතා සංවර්ධනය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	05	2025.06.17	6,500.00
09	විනය ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	03	2025.06.19	25,000.00
10	රජයේ මුදල් රෙගුලාසි පිළිබඳ එක් දින පුහුණු වැඩමුළුව	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	05	2025.07.04	7,000.00
11	කාල කළමනාකරණය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	09	2025.10.23	6,500.00
12	ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	03	2025.10.14 හා 15	12,000.00
13	සංවර්ධන නිලධාරීන්ගේ හා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	02	2025.10.15 හා 16	12,000.00
14	රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයින් සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි	නිපුනතා සංවර්ධන අරමුදල	08	2025.10.30 හා 31	13,000.00

අංකය	වැඩසටහනේ නම	පැවැත්වූ ආයතනය	සහභාගී වූ නිලධාරීන් ගණන	පැවැත්වූ දිනයන්	පාඨමාලා ගාස්තුව (එක් අයෙකුට රු.)
15	වෛද්‍යවරුන් බඳවා ගැනීමට අදාළ වියදම් සංවිධාන කටයුතු	විවිධ ආයතන	304	2025.11.03	මුළු වියදම 86,528.02
16	පැය 100 දෙමළ භාෂා පාඨමාලාව	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	67	2025.11.25	පැයකට 750.00
